ශ්‍රී ලංකා
රක්ෂණ නියාමන
කොමිෂන් සභාව



# වාර්ෂික වාර්තාව 2025

සුරක්ෂිත හෙටක් උදෙසා
සැමට රක්ෂණයක්

# පටුන


දැක්ම හා මෙහෙවර 4

වසරේ වැදගත් සිදුවීම් 5

සභාපතිතුමාගේ පණිවිඩය 6

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය 10

**කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය**

කොමිෂන් සභාවේ සාමාජිකයින් 15

කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව 16

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම 22

කාර්ය මණ්ඩලය 24

**සමාලෝචනය**

පොදු සමාලෝචනය 30

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූලඝාතක අවි ව්‍යාප්තිය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ සමාලෝචනය 37

අධීක්ෂණ සමාලෝචනය 41

ආයුගණක ඒකක සමාලෝචනය 46

නියාමන සමාලෝචනය 49

විමර්ශන සමාලෝචනය 52

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය 55

වෙළඳපොළ අතරමැදි බලපත්‍ර නිකුත් කිරීම සහ අධීක්ෂණය 65

වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකයේ සමාලෝචනය 66

මූල්‍ය සමාලෝචනය 68

පරිපාලන සමාලෝචනය 71

සංයුක්ත පාලනය පිළිබඳ වාර්තාව 75

විගණන කමිටුව 76

**මූල්‍ය තොරතුරු**

විගණකාධිපති වාර්තාව 77

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 80

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය 81

ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය 82

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 83

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 84

ගිණුම්කරණ ප්‍රතිපත්ති 85

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 90

ආර්ථික අගය එකතු කිරීමේ ප්‍රකාශනය 102

මූල්‍ය කාර්ය සාධනයේ විශේෂ අවස්ථා 103

පරිශිෂ්ඨය i 104

පරිශිෂ්ඨය ii 105

පරිශිෂ්ඨය iii 108

සටහන් 109

# සුරක්ෂිත හෙටක් උදෙසා සැමට රක්ෂණයක්

## දැක්ම

දකුණු ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම

## මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම

# වසරේ වැදගත් සිදුවීම්

**29**
රක්ෂණ සමාගම්

**83**
රක්ෂණ තැරැව්කාර සමාගම්

**46,076**
රක්ෂණ සමාගම් නියෝජනය කරන රක්ෂණ නියෝජිතයින්

**649**
රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින්

### රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

| | 2025 | 2024 | වෙනස% |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන) | 384,894 | 321,761 | 19.6 |
| දළ ලිඛිත වාරික ප්‍රති රක්ෂණ ආදායම (රු. මිලියන) | 3,398 | 3,187 | (6.6) |
| මුළු වත්කම් (රු. මිලියන) | 1,435,753 | 1,217,415 | 17.9 |
| දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය | 1.18 | 1.07 | 9.9 |
| රක්ෂණ ඝනත්වය (රු.) | 17,691 | 14,682 | 20.5 |

### කොමිෂන් සභාවේ කාර්යසාධනය

| | | | |
|---|---|---|---|
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු.මිලියන) | 15,063 | 13,128 | 14.7% |
| සෙස් ආදායම (රු.මිලියන) | 961 | 764 | 25.9% |
| වාර්ෂික ආදායම (රු.මිලියන) | 634 | 346 | 83.2% |

**රු. මිලියන 1,435,753**
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

**රු. මිලියන 388,292**
රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායම

# සභාපතිතුමාගේ පණිවිඩය



**ඉදිරියේ දී ඩිජිටල් පරිවර්තනය ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස පවතිනු ඇත. කොමිෂන් සභාව විසින් අධීක්ෂණ තාක්ෂණික පද්ධති ශක්තිමත් කිරීම, දත්ත පාදක කරගත් නියාමනය ප්‍රවර්ධනය කිරීම, InsureTec නවෝත්පාදනයන්ට සහය දැක්වීම සහ ක්ෂේත්‍රය පුරා මෙහෙයුම් නවීකරණය දිරිමත් කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.**

**ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. ද මෙල්**
සභාපති

ගෝලීය සහ දේශීය වශයෙන් අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තුළ වුවද ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් යථා තත්ත්වයට පත් වීම අඛණ්ඩව සිදු වූ බැවින් 2025 වර්ෂය ක්‍රමානුකූල ආර්ථික ඒකාබද්ධතාවය සහ ආයතනික විශ්වාසය යළි තහවුරු වූ කාල පරිච්ඡේදයක් විය.

ශ්‍රී ලංකාව විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ, විනයගරුක මූල්‍ය කළමනාකරණය සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මුලපිරීම්වල ප්‍රගතිය හේතුවෙන් දිගුකාලීන තිරසර වර්ධනයක් සඳහා පදනම සකසන අතරතුර සාර්ව ආර්ථික ස්ථාවරභාවයේ වර්ධනයක් පෙන්නුම් කර ඇත. පෙර වර්ෂවල අත්විඳින ලද දැඩි උච්චාවචනයන්ට සාපේක්ෂව, මෙම වසර තුළ උද්ධමනකාරී පීඩනයන් සැලකිය යුතු ලෙස අඩු වූ අතර විනිමය අනුපාතිකයේ පවතින අස්ථාවරත්වය පහව ගොස් පොළී අනුපාත ස්ථාවර විය. තවද, සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත් වීම, කාර්මික නිමැවුම, ප්‍රේෂණ ගලා ඒම සහ ආයෝජක විශ්වාසය වර්ධනය වීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත. එසේ වුවද, ව්‍යුහාත්මක බාධාවන්, බාහිර වෙළෙඳපොළ අවිනිශ්චිතතාවයන් සහ විකාශනය වන භූ-දේශපාලනික වර්ධනයන්, ජාතික ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ප්‍රයත්නයේ වේගය සහ තිරසාරභාවය කෙරෙහි අඛණ්ඩව බලපෑම් එල්ල කර ඇත.

මෙම පුළුල් සන්දර්භය තුළ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය, යහපත් පැවැත්ම සහ තිරසර සංවර්ධනය සහතික කිරීම සඳහා වන තම වගකීම නොපිරිහෙලා ඉටු කර ඇත. ක්ෂේත්‍රයේ උත්තරීතර නියාමන අධිකාරිය ලෙස, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීමට, සාධාරණ වෙළඳපොළ හැසිරීම් ප්‍රවර්ධනය කිරීමට, නියාමන අධීක්ෂණය නවීකරණය කිරීමට සහ ජාතික ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම මූල්‍ය අන්තර්ග්‍රාහී බව සඳහා මෙම ක්ෂේත්‍රයෙන් සපයන දිගුකාලීන දායකත්වයට සහය දැක්වීමට කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කර ඇත.

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත පැනවීම සහ 2001 වසරේදී කොමිෂන් සභාව පිහිටුවීමේ සිට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද 25 වසරක විචක්ෂණශීලී නියාමනය සහ ආයතනික භාරකාරත්වය සනිටුහන් කරමින්, 2025/26 මූල්‍ය වර්ෂය එම කොමිෂන්

සභාවේ ඓතිහාසික සන්ධිස්ථානයක් ද සනිටුහන් කළේය. පසුගිය විසිපස් වසරක කාලය පුරා වඩාත් ශක්තිමත් පාලනයක්, නියාමන විනයක්, වෙළඳපොළ ස්ථාවරත්වයක් මෙන්ම පාරිභෝගික විශ්වාසයක් ඇති කිරීම මගින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය හැඩගැස්වීම උදෙසා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව පරිවර්තනීය කාර්යභාරයක් ඉටු කර ඇත.

## රක්ෂණ ක්ෂේත්‍රය සඳහා අගය නිර්මාණය කිරීම

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සහ විකාශනය වන වෙළඳපොළ තත්ත්වයන් පසුබිම් කරගනිමින්, සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව අඛණ්ඩව ප්‍රදර්ශනය කර ඇත. අවදානම්වලින් ආරක්ෂාව, දිගුකාලීන ඉතුරුම් සඳහා දිරිමත් කිරීම සහ මූල්‍ය ආරක්ෂණ යාන්ත්‍රණයන් මගින් ව්‍යාපාර, ගෘහ ඒකක සහ ජාතික ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව සහය දක්වන අතරතුර, මෙම ක්ෂේත්‍රය සිය මෙහෙයුම් ස්ථාවරත්වය ද පවත්වාගෙන ගොස් ඇත.

අවදානම් පාදක අධීක්ෂණය, පාලන ප්‍රමිතීන්, පාරිභෝගික ආරක්ෂණය සහ වෙළඳපොළ හැසිරීම් පිළිබඳ අධීක්ෂණය ශක්තිමත් කිරීම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරමින්, කොමිෂන් සභාව මෙම වර්ෂය තුළ සිය නියාමන හා අධීක්ෂණ අවධානය දැඩි කර ඇත. වර්ෂය තුළ හඳුන්වා දෙන ලද නියාමන ප්‍රතිසංස්කරණ මගින් ආයතනික ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ඉහළ නැංවූ අතර මෙහෙයුම් පරිසරය තුළ මතුවන අවදානම් සහ ව්‍යුහාත්මක වෙනස්කම්වලට මුහුණ දීම සඳහා ක්ෂේත්‍රයේ සූදානම ද ඇති කරන ලදී.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව උපායමාර්ගික ආයතනික ප්‍රතිසංස්කරණ කිහිපයක් මගින් සිය ආයතනික රාමුව ශක්තිමත් කර ඇත. ක්ෂේත්‍රය පුරා පවතින සදාචාරාත්මක හැසිරීම්, රක්ෂණ ඔප්පු හිමියන්ට සාධාරණ ලෙස සැලකීම, විනිවිදභාවය, හිමිකම් පෑම් කළමනාකරණය සහ පාරිභෝගික ආරක්ෂණ ක්‍රමවේදයන්ට අදාළ නියාමන අධීක්ෂණය ඉහළ නැංවීම සඳහා කොමිෂන් සභාව මෙම වර්ෂය තුළ සුවිශේෂී වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකයක් පිහිටුවීය. මීට අමතරව, වෙළඳපොළ අතරමැදියන් බලපත්‍ර ගැන්වීමේ සහ අධීක්ෂණය කිරීමේ අංශයක් පිහිටුවීම මගින් නියාමන කාර්යක්ෂමතාව සහ වගවීම වැඩිදියුණු කරන අතරතුර රක්ෂණ තැරැව්කරුවන් සහ අතරමැදියන් පිළිබඳ අධීක්ෂණය ද තවදුරටත් තහවුරු කරන ලදී.

ක්ෂේත්‍රයේ ඩිජිටල් පරිවර්තන න්‍යාය පත්‍රය ශක්තිමත් කිරීම සඳහා වූ වේගවත් ප්‍රයත්නයන් ද මෙම වර්ෂය තුළ දක්නට ලැබුණි. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය සමග ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ ඊ-මෝටර් රක්ෂණ ඩිජිටල් කාඩ්පත හඳුන්වා දීම මෙම වර්ෂය තුළ සනිටුහන් වූ සුවිශේෂීම සන්ධිස්ථානයක් විය. මෙම මුලපිරීම, වංචා-දූෂණ සහ පරිපාලනමය අකාර්යක්ෂමතාවන් අවම කරන අතරතුර විනිවිදභාවය, ප්‍රවේශ වීමේ හැකියාව, සත්‍යාපන හැකියාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මගින් මෝටර් රථ රක්ෂණ ජාලය නවීකරණය කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් නිරූපණය කර ඇත.

මෙම මුලපිරීම තවදුරටත් සම්පූර්ණ කරමින්, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සහ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමග ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ ප්‍රථම මධ්‍යගත රක්ෂණ දත්ත පද්ධතිය පිහිටුවීමට කොමිෂන් සභාව පහසුකම් සැලසීය. මෙම මුලපිරීම මගින් දත්ත පාදක කරගත් අධීක්ෂණය ශක්තිමත් කිරීම, ප්‍රතිරක්ෂණ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම, වංචා වැළැක්වීමේ යාන්ත්‍රණයන්ට සහය වීම සහ ඉදිරි වසරවලදී ක්ෂේත්‍රය තුළ වඩාත් දැනුවත් තීරණ ගැනීමට අවස්ථාව උදා කිරීම අපේක්ෂා කෙරේ.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රයත්නයන් සහ පුළුල් නියාමන නවීකරණ මුලපිරීම් ඉදිරියට ගෙනයෑමට ද කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කර ඇත. රක්ෂණකරුවන්ගේ මූල්‍ය වාර්තාකරණ රාමු ශක්තිමත් කිරීම සහ මෙහෙයුම් කටයුතු සඳහා ඔවුන්ගේ සූදානම වැඩිදියුණු කිරීම සඳහා සහය දැක්වීම උදෙසා ධාරිතා සංවර්ධන වැඩසටහන්, පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම සහ තාක්ෂණික මගපෙන්වීමේ මුලපිරීම් සිදු කරන ලදී.

රක්ෂණ ක්ෂේත්‍රය මගින් ද මෙම වර්ෂය තුළ සැලකිය යුතු ආර්ථික හා සමාජීය අගයක් අඛණ්ඩව නිර්මාණය කරන ලදී. ජාතික මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහය දැක්වීමට අමතරව, ව්‍යාපාර අඛණ්ඩතාව පවත්වාගෙන යෑමට පහසුකම් සැලසීම, ජීවනෝපායන් සුරක්ෂිත කිරීම, දිගුකාලීන ප්‍රාග්ධනය රැස් කිරීම සහ අනපේක්ෂිත අවදානම් මෙන්ම ආපදාවලට එරෙහිව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමෙහිලා මෙම ක්ෂේත්‍රය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## මූල්‍ය සමාලෝචනය

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයන් මගින් උපයා ඇති ඒකාබද්ධ දළ ලිඛිත වාරික ප්‍රමාණය ආසන්න වශයෙන් රුපියල් බිලියන 384.89 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 19.6%ක වර්ධනයකි. ප්‍රතිරක්ෂණ ක්ෂේත්‍රය රුපියල් බිලියන 3.39 ක දළ ලිඛිත වාරික ප්‍රමාණයක් වාර්තා කර ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 6.64% ක වර්ධනයකි.

මූලිකව ම මූල්‍ය ආරක්ෂණය සහ ඉතුරුම් ඉලක්ක කරගත් රක්ෂණ නිෂ්පාදන පිළිබඳව පාරිභෝගික දැනුවත්භාවය ඉහළ යාම හේතුවෙන් දිගුකාලීන රක්ෂණ ක්ෂේත්‍රය 23.5% ක කැපී පෙනෙන වාරික වර්ධනයක් වාර්තා කර ඇත. එසේම, මෝටර් රථ, සෞඛ්‍ය, දේපළ සහ ව්‍යාපාර ආශ්‍රිත රක්ෂණ විසඳුම් සඳහා පවතින ඉල්ලුම ඉහළ යාමෙන් සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය 14.4% කින් පුළුල් විය.

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රවල මුළු බදු පසු ලාභය ආසන්න වශයෙන් රුපියල් බිලියන 43.49 ක් දක්වා ඉහළ යාමෙන් වසර තුළ ක්ෂේත්‍රයේ ලාභදායීතාවය වර්ධනය විය. කෙසේ වුවද, ප්‍රතිරක්ෂණ අංශය රුපියල් බිලියන 11.73 ක බදු පසු අලාභයක් වාර්තා කර ඇත. ප්‍රතිරක්ෂණ ක්ෂේත්‍රයේ පසුබෑමක් පැවතියද ශක්තිමත් ආයෝජන ආදායම්, ඉහළ නැංවූ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ විනයගරුක අවදානම් කළමනාකරණ භාවිතයන් හේතුවෙන් සමස්ත රක්ෂණ ක්ෂේත්‍රය රුපියල් බිලියන 31.76 ක බදු පසු ලාභයක් වාර්තා කිරීමට සමත් විය.

වසර අවසානය වන විට සමස්ත ක්ෂේත්‍රයේ මුළු වත්කම් රුපියල් බිලියන 1435.75 ක් දක්වා ඉහළ ගිය අතර එමගින් ක්ෂේත්‍රයේ මූල්‍ය ස්ථාවරත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තවදුරටත් ශක්තිමත් විය. මේ අතර රක්ෂණ ප්‍රවේශ්‍යතාව සහ මහජන දැනුවත්භාවය ක්‍රමයෙන් වර්ධනය වීම පිළිබිඹු කරමින්, රක්ෂණ විනිවිදීම දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.18% ක් දක්වා වූ සුළු අගයකින් වර්ධනය වූ අතර රක්ෂණ ඝනත්වය ඒක පුද්ගල වශයෙන් රුපියල් 17691 ක් දක්වා ඉහළ ගියේය. එමෙන්ම, දිවයින පුරා විහිදුණු පුළුල් ශාඛා ජාලයක් සහ අතරමැදි ජාලයක් මගින් සේවකයින් 20343 කට අධික පිරිසකට සෘජු රැකියා උත්පාදනය

කර දෙමින් රක්ෂණ ක්ෂේත්‍රය රටේ සමාජ-ආර්ථික ක්ෂේත්‍රයට අඛණ්ඩව කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන්නේය.

## ප්‍රධාන ජයග්‍රහණ සහ සේවා සැපයීමේ වැඩිදියුණු කිරීම්

වඩාත් අන්තර්ග්‍රාහී විනිවිදභාවයෙන් යුත් සහ අනාගතයට සූදානම් රක්ෂණ ක්ෂේත්‍රයක් නිර්මාණය කිරීමේ සිය පුළුල් උපායමාර්ගික අරමුණෙහි කොටසක් ලෙස, කොමිෂන් සභාව මෙම වර්ෂය තුළ කැපී පෙනෙන ජයග්‍රහණ කිහිපයක් වාර්තා කර ඇත. සියලුම බලපත්‍රලාභී රක්ෂණකරුවන් සහ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමග ඒකාබද්ධව මාතර, යාපනය සහ කිලිනොච්චි යන ප්‍රදේශ පුරා මහා පරිමාණ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජංගම ප්‍රදර්ශන පවත්වමින්, රට පුරා රක්ෂණ සාක්ෂරතාවය සහ මූල්‍ය අවබෝධය පුළුල් කිරීම මෙම වර්ෂය තුළ ප්‍රධාන අවධානය යොමු වූ ක්ෂේත්‍රයක් විය. ක්ෂේත්‍රයේ දැනුම හුවමාරු කර ගැනීම සහ කුසලතා සංවර්ධන මුලපිරීම් ශක්තිමත් කිරීම සඳහා කොමිෂන් සභාව අධ්‍යයන ආයතන සහ වෘත්තීය ආයතන සමග පවතින සහයෝගීතාව ද දැඩි කර ඇත. එමෙන්ම, වර්ෂය තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සහ වෙළඳපොළ විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමෙහිලා ද සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී.

ක්ෂේත්‍රයේ සක්‍රීය දායකත්වය, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඒ සඳහාම වෙන්වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි වීමේ අධීක්ෂණ කාර්යභාරයක් ක්‍රියාත්මක කිරීම හරහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි වීම පිළිබඳ අනුකූලතාව කෙරෙහි පවතින අවධානය ද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. ගෝලීය නියාමන අපේක්ෂාවන් ඉහළ යමින් පවතින වටපිටාවක මෙම ප්‍රයත්නයන් මගින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ විශ්වාසනීයත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් තහවුරු කරන ලදී.

අධීක්ෂණ කාර්යක්ෂමතාව, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සහ වෙළඳපොළ හැසිරීම් ප්‍රමිතීන් ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින්, කොමිෂන් සභාව මගින් මෙම වර්ෂය තුළ වැදගත් නියාමන සහ වෙළඳපොළ සංවර්ධන මුලපිරීම් කිහිපයක් ද හඳුන්වා දෙන ලදී. කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ රක්ෂණකරුවන් විසින් පද්ධතිමය නවීකරණයන්, ආයුගණක සමාලෝචන සහ වාර්තාකරණ රාමු වැඩිදියුණු කිරීම් සිදු කරමින්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ක්‍රියාත්මක කිරීමේ ඉදිරි සැලසුමේ ප්‍රගතිය සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් පාලනය, නිෂ්පාදන අනාවරණයන්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි වීම පිළිබඳ අනුකූලතාව, ඩිජිටල් රක්ෂණ බෙදාහැරීම සහ රක්ෂණ ඔප්පුහිමියන්ට සේවා සැපයීමේ ප්‍රමිතීන් වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව නියාමන නියෝග 06ක්, මාර්ගෝපදේශ 04ක් සහ චක්‍රලේඛ 03ක් නිකුත් කරන ලදී. වෙළඳපොළ විනය, ආයතනික වගවීම සහ ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඉලක්කගත පරීක්ෂණ, තේමාත්මක සමාලෝචන සහ වැඩිදියුණු කළ අවදානම් පාදක අධීක්ෂණ යාන්ත්‍රණයන් හරහා කොමිෂන් සභාව මෙම වර්ෂය තුළ සිය අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් ද පුළුල් කරන ලදී.

## උපායමාර්ගික දැක්ම

ශ්‍රී ලංකාව ආර්ථික ස්ථාවරත්වය සහ යථා තත්ත්වයට පත් වීම කරා අඛණ්ඩව ගමන් කරමින් සිටින පසුබිමක, රට පුරා මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, ආර්ථික වර්ධනයට සහය වීම සහ සමාජ ආරක්ෂණ යාන්ත්‍රණයන් ඉහළ නැංවීම සඳහා රක්ෂණ ක්ෂේත්‍රය වඩාත් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වුවද, රක්ෂණ කර්මාන්තයේ මෙහෙයුම් පරිසරය අඛණ්ඩව හා වේගයෙන් විකාශනය වෙමින් පවතී. දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම්, සයිබර් තර්ජන, ජනවිකාසන වෙනස්වීම්, තාක්ෂණික බිඳවැටීම් සහ පාරිභෝගික අපේක්ෂාවන් වෙනස් වීම යන කරුණු ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ද රක්ෂණ ක්ෂේත්‍රයේ අනාගතය ප්‍රතිනිර්මාණය කරමින් පවතියි. ඒ අනුව, කොමිෂන් සභාව අනුවර්තනය විය හැකි, තාක්ෂණය පදනම් කරගත් සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට ගැළපෙන නියාමන පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරමින් සිටියි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ දිගුකාලීන උපායමාර්ගික දිශානතිය මෙහෙයවනු ලබන්නේ ශ්‍රී ලංකාව පුරා රක්ෂණ සේවාවන් ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම සහ රක්ෂණ විනිවිදීම ඉහළ නැංවීම යන පුළුල් දැක්ම මගිනි. මෑතකදී දියත් කරන ලද රක්ෂණ ඉදිරි සැලැස්ම මගින් මූල්‍ය අන්තර්ග්‍රාහී බව ප්‍රවර්ධනය කිරීම සහ ජාතික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරන අතරතුර, ඉදිරි දශකය තුළ රක්ෂණ විනිවිදීමේ මට්ටම් සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම අරමුණු කරයි.

ඉදිරියේ දී ඩිජිටල් පරිවර්තනය ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස පවතිනු ඇත. කොමිෂන් සභාව විසින් අධීක්ෂණ තාක්ෂණික පද්ධති ශක්තිමත් කිරීම, දත්ත පාදක කරගත් නියාමනය ප්‍රවර්ධනය කිරීම, InsureTec නවෝත්පාදනයන්ට සහය දැක්වීම සහ ක්ෂේත්‍රය පුරා මෙහෙයුම් නවීකරණය දිරිමත් කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

එයට සමගාමීව, රක්ෂණ ක්ෂේත්‍රය තුළ තිරසාරභාවය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ පාරිසරික, සමාජයීය හා පාලන (ESG) සාධක ඒකාබද්ධ කිරීම කෙරෙහි වඩා වැඩි අවධානයක් යොමු කරනු ඇත. ක්ෂේත්‍රයේ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසය සහතික කිරීම සඳහා තිරසර රක්ෂණ රාමු සහ වගකීම්සහගත පාලන ක්‍රමවේදයන්හි ඉහළ යන වැදගත්කම කොමිෂන් සභාව පිළිගනු ලබයි.

වැඩිදියුණු කළ විනිවිදභාවය, සදාචාරාත්මක හැසිරීම්, දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාර්යක්ෂම යාන්ත්‍රණයන් සහ සාධාරණ වෙළඳපොළ ක්‍රමවේදයන් මගින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම වෙනුවෙන් ද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අඛණ්ඩව කැපවී සිටියි. රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා සුරක්ෂිත කිරීම, කොමිෂන් සභාවේ නියාමන දර්ශනයේ ප්‍රධානතම හරය ලෙස අඛණ්ඩව පවතිනු ඇත.

අනාගතය දෙස බලන විට, කොමිෂන් සභාවේ මධ්‍යකාලීන උපායමාර්ගික ප්‍රමුඛතාවන් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය පුරා නියාමන නවීකරණය, ඩිජිටල් පරිවර්තනය සහ මූල්‍ය අන්තර්ග්‍රාහී බව වේගවත් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. 2026 සිට 2030 දක්වා කාලසීමාව සඳහා වන අනාගත මුලපිරීම්වලට උසස් අධීක්ෂණ තාක්ෂණික වේදිකාවන් අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම, දත්ත පාදක කරගත් නියාමන රාමු ශක්තිමත් කිරීම සහ තත්කාලීන අධීක්ෂණ මෙන්ම වාර්තාකරණ හැකියාවන් අඛණ්ඩව ඉහළ නැංවීම ඇතුළත් වේ. ක්ෂේත්‍රය තුළ මූල්‍ය විනිවිදභාවය සහ පාලන ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සඳහා

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ක්‍රියාත්මක කිරීමට සහ පුළුල් ජාත්‍යන්තර නියාමනයන්ට ගැළපෙන මුලපිරීම්වලට තවදුරටත් සහය දැක්වීමට ද කොමිෂන් සභාව අදහස් කරයි.

අන්තර්ග්‍රාහී රක්ෂණ නිෂ්පාදන, ඩිජිටල් බෙදාහැරීමේ ආකෘති සහ රට පුරා ක්‍රියාත්මක කෙරෙන දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා 2030 වන විට රක්ෂණ විනිවිදීම 2% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කගත මුලපිරීම් සමගින් ප්‍රමාණවත් සේවාවක් නොලබන ප්‍රජාවන් අතර රක්ෂණ සේවාවන් ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම ජාතික ප්‍රමුඛතාවක් ලෙස පවතිනු ඇත. මතුවෙමින් පවතින ආර්ථික හා සමාජීය අභියෝග හමුවේ මෙම ක්ෂේත්‍රය සාර්ථකව ප්‍රතිචාර දක්වන මට්ටමක පවත්වා ගැනීම සහතික කිරීම සඳහා පාරිසරික, සමාජයීය හා පාලන සාධක ඒකාබද්ධ කිරීම, දේශගුණික අවදානම් කළමනාකරණය, තිරසාර රක්ෂණ ක්‍රමවේදයන් සහ පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිසංස්කරණ කෙරෙහි ද වඩා වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත. තවද, ක්ෂේත්‍රයේ දිගුකාලීන සංවර්ධනය සහ ආයතනික විශිෂ්ටත්වයට සහය වීම සඳහා දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමග ඒකාබද්ධව රක්ෂණකරුවන්, අතරමැදියන් සහ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා වන ධාරිතා වර්ධන වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

## තිරසාරභාවය සහ සමාජීය බලපෑම

කොමිෂන් සභාව වර්ෂය විසින් පුරාම තිරසාරභාවය, පාලනයේ විශ්වාසනීයත්වය සහ සමාජ වගකීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත. ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ සමාජීය සුභසාධනය ප්‍රවර්ධනය කිරීමෙහිලා රක්ෂණ ක්ෂේත්‍රයට පැවරී ඇති පුළුල් කාර්යභාරය හඳුනාගනිමින්, පාරිසරික, සමාජයීය සහ පාලන සාධක ආශ්‍රිත රාමු ශක්තිමත් කිරීමටත් උපායමාර්ගික මෙන්ම මෙහෙයුම් තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා තිරසරභාවයට අදාළ සාධක ඇතුළත් කිරීමටත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණකරුවන් දිරිමත් කරන ලදී. වර්ෂය තුළ කොමිෂන් සභාවේ සමාජීය බලපෑම් න්‍යාය පත්‍රයේ වැදගත් කරුණු ලෙස මහජන දැනුවත්භාවය සහ මූල්‍ය සාක්ෂරතාව පැවතුණි. රට පුරා ක්‍රියාත්මක කරන ලද මහජන සන්නිවේදන වැඩසටහන්, පාසල් සහ විශ්වවිද්‍යාල සම්බන්ධ කරගනිමින් දියත් කළ මුලපිරීම්, ඩිජිටල් දැනුවත් කිරීමේ ව්‍යාපාර සහ පාර්ශවකරුවන්ගේ සහයෝගීතා ප්‍රයත්නයන් හරහා වඩාත් දැනුවත්, මූල්‍යමය වශයෙන් ඔරොත්තු දෙන සහ රක්ෂණය පිළිබඳ අවධානයක් ඇති සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කර ඇත.

රක්ෂණ ක්ෂේත්‍රය පුරා පාලන ප්‍රමිතීන්, වෙළඳපොළ විනය, විනිවිදභාවය සහ පාරිභෝගික විශ්වාසය ශක්තිමත් කිරීම වෙනුවෙන් ද කොමිෂන් සභාව අඛණ්ඩව කැපවී ඇත. මෙම ක්ෂේත්‍රයේ දිගුකාලීන තිරසරභාවය සහතික කිරීම සඳහා මෙම ප්‍රයත්නයන් අත්‍යවශ්‍ය වේ. අප ලබාගත් 25 වසරක නියාමන විශිෂ්ටත්වය සමරන මෙම අවස්ථාවේදී, ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා අර්ථවත් දායකත්වයක් සපයන, ඔරොත්තු දීමේ හැකියාවෙන් යුත්, නවෝත්පාදන, අන්තර්ග්‍රාහී සහ අනාගතයට සූදානම් රක්ෂණ ක්ෂේත්‍රයක් ගොඩනැගීම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ස්ථිරවම කැපවී සිටියි.

## කෘතඥතාව පිරිනැමීම

වර්ෂය පුරා දක්වන ලද අඛණ්ඩ සහයෝගීතාව සහ සහය වෙනුවෙන්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් මම මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී රක්ෂණකරුවන්, තැරැව්කරුවන්, නියෝජිතයන්, වෘත්තීය ආයතන, ක්ෂේත්‍රයේ සංගම්, සංවර්ධන හවුල්කරුවන් සහ සියලුම පාර්ශවකරුවන් වෙත මාගේ අවංක කෘතඥතාව පළ කර සිටිමි.

එමෙන්ම, කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දැක්වූ කැපවීම, වෘත්තීයභාවය සහ නොසැලෙන කැපවීම වෙනුවෙන් කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ද ස්තූති කිරීමට මම කැමැත්තෙමි.

මූල්‍ය ආරක්ෂාව, ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ ජාතික ප්‍රගතියේ විශ්වාසදායක ආයතනයක් ලෙස ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය තවදුරටත් ශක්තිමත් කිරීමට අපි සැවොම එක්ව අඛණ්ඩව කටයුතු කරන්නෙමු.



**ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. ද මෙල්**
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය



**"වාරික ආදායමේ ශක්තිමත් වර්ධනයක් පැවතියද කලාපීය සහ ගෝලීය දර්ශකයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රක්ෂණ විනිවිදීම තවමත් පැවතියේ සාපේක්ෂව අඩු මට්ටමකය. එමගින් මෙරට රක්ෂණ වෙළඳපොළ තුළ තවමත් ප්‍රයෝජනයට ගෙන නොමැති විශාල විභවතාවක් පවතින බව මැනවින් පැහැදිලි වේ. කෙසේ වෙතත්, රක්ෂණ නිෂ්පාදන සහ සේවාවන් සමග මහජනතාවගේ නියැලීම ඉහළ යාම හේතුවෙන්, සමාලෝචිත වසර තුළ රක්ෂණ ඝනත්වය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි. විශේෂයෙන්ම දිගුකාලීන රක්ෂණ ක්ෂේත්‍රය තුළ වාරික ප්‍රමාණයේ සිදු වූ මෙම වර්ධනය මගින් පෙනී යන්නේ, රක්ෂණය යනු අත්‍යවශ්‍ය මූල්‍ය ආරක්ෂණ යාන්ත්‍රණයක් මෙන්ම දිගුකාලීන ඉතුරුම් මෙවලමක් ලෙස ජනතාව අතර පිළිගැනීමට ලක්වීම ඉහළ යමින් පවතින බවයි."**

**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්

2025 වර්ෂය, ශ්‍රී ලංකාව ක්‍රමයෙන් ආර්ථික වශයෙන් යථා තත්ත්වයට පත් වීම, ආයතනික ස්ථායීකරණය සහ අලුත් වූ ව්‍යාපාරික විශ්වාසය කරා ගමන් කිරීමත් සමඟ මෙරට රක්ෂණ ක්ෂේත්‍රයේ අඛණ්ඩ පරිණාමයේ වැදගත් සන්ධිස්ථානයක් නිරූපණය කළේය. මෙහෙයුම් පරිසරය සංකීර්ණ මෙන්ම ඇතැම් අවස්ථාවලදී අවිනිශ්චිත ස්වභාවයක් පෙන්නුම් කළ ද පෙර වර්ෂවල අත්විඳි දැඩි අස්ථාවරත්වයට සාපේක්ෂව සමස්ත සාර්ව ආර්ථික පසුබිමක වර්ධනීය ලක්ෂණ පෙන්නුම් කළේය.

මෙම පසුබිම හමුවේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය, යහපත් පැවැත්ම සහ තිරසාර සංවර්ධනය තහවුරු කිරීමේ තම වගකීම අඛණ්ඩව ඉදිරියට ඉටු කරගෙන යන ලදී. සමාලෝචිත වර්ෂය තුළ නැගී එන ආර්ථික යථාර්ථයන් සහ ජාත්‍යන්තර නියාමන අපේක්ෂාවන්ට අනුකූල වන පරිදි, නියාමන ඵලදායීතාව ශක්තිමත් කිරීම, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව ඉහළ නැංවීම, වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය වැඩිදියුණු කිරීම සහ ක්ෂේත්‍රයේ දිගුකාලීන සංවර්ධනයට සහය වීම කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය තදින්ම යොමු වී තිබුණි.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ක්‍රියාවට නැංවීම සහ 2001 දී කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2026 වසරේදී තම 25 වසරක නියාමන ගමන සැමරීමට සූදානම් වෙයි. ප්‍රගතිශීලී නියාමනයන්, ශක්තිමත් කරන ලද පාලන රාමු, ආයතනික ප්‍රතිසංස්කරණ සහ ක්ෂේත්‍රය කෙරෙහි පවතින විනිවිදභාවය හා මහජන විශ්වාසය ඉහළ නැංවීමේ අඛණ්ඩ උත්සාහයන් තුළින්, පසුගිය 25 වසරක කාලය පුරා ශ්‍රී

ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය හැඩගැස්වීම සඳහා මෙම කොමිෂන් සභාව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත. වසර ගණනාවක් පුරා විශාල ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතරම වේගයෙන් විකාශනය වන අවදානම්, තාක්ෂණික බාධාවන්, වෙනස් වන පාරිභෝගික අපේක්ෂාවන් සහ ප්‍රවේශ්‍යතාව, විනිවිදභාවය මෙන්ම මෙහෙයුම් ප්‍රත්‍යස්ථතාව සඳහා වන ඉහළ යන ඉල්ලුම මගින් හැඩගැසුණු පරිසරයක් තුළ රක්ෂණ ක්ෂේත්‍රය අඛණ්ඩව ක්‍රියාත්මක වන බව කොමිෂන් සභාව පිළිගනියි. ඒ අනුව, 2025 වසර හුදෙක් නියාමන අඛණ්ඩතාවයේ වසරක් ලෙස පමණක් නොව, ආයතනික ශක්තිමත්භාවය සහ උපායමාර්ගික පරිවර්තනයක් ඇති කිරීමේ කාල පරිච්ඡේදයක් ලෙස ද හඳුනා ගත හැකිය.

## රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය

ක්‍රමයෙන් යහපත් අතට හැරෙමින් පවතින සාර්ව ආර්ථික පරිසරයක් තුළ, ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය සිය ඔරොත්තු දීමේ සහ අනුවර්තනය වීමේ හැකියාව මනාව පෙන්නුම් කරමින් 2025 වසර තුළ ප්‍රබල කාර්යසාධනයක් වාර්තා කරන ලදී. වැඩි දියුණු වූ ආර්ථික ක්‍රියාකාරකම්, උද්ධමන පීඩනය ලිහිල් වීම, පොලී අනුපාත ස්ථාවර වීම සහ ව්‍යාපාරික විශ්වාසය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම යන කරුණු, ජීවිත මෙන්ම සාමාන්‍ය රක්ෂණ යන අංශ දෙකෙහිම රක්ෂණ මෙහෙයුම් පුළුල් කිරීම සඳහා ධනාත්මක ලෙස දායක විය.

සමාලෝචිත වසර තුළ රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරිකය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය 2024 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 322.04 හා සැසඳීමේදී රුපියල් බිලියන 384.96 දක්වා වැඩි වීමකි. මෙමගින් 19.5%ක ශක්තිමත් වසරින් වසර වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය කර්මාන්තය විසින් මෙතෙක් වාර්තා කර ඇති ඉහළම වාර්ෂික වාරික ප්‍රමාණය වන අතර පවතින ආර්ථික සහ මෙහෙයුම් අභියෝග මධ්‍යයේ වුවද ක්ෂේත්‍රයේ අඛණ්ඩ ව්‍යාප්තිය මින් මනාව පැහැදිලි වේ.

දිගුකාලීන රක්ෂණ ක්ෂේත්‍රය වසර තුළ රක්ෂණ කර්මාන්ත වර්ධනයේ ප්‍රධානතම ගාමක බලවේගය ලෙස අඛණ්ඩව පැවතීමට සමත් විය. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරවලින් ලැබුණු වාරික ආදායම, 2024 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 183.88 සිට 2025 වසරේදී රුපියල් බිලියන 227.13 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය ආසන්න වශයෙන් 23.5% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආරක්ෂණ සහ ඉතුරුම් සම්බන්ධිත රක්ෂණ නිෂ්පාදන සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම, දිගුකාලීන මූල්‍ය සුරක්ෂිතතාව පිළිබඳව ජනතාව තුළ ඇති වූ දැඩි උනන්දුව සහ රක්ෂණ සමාගම් විසින් අනුගමනය කරන ලද වඩාත් දියුණු බෙදාහැරීමේ ක්‍රමවේද හේතුවෙන් මෙම ක්ෂේත්‍රය සැලකිය යුතු ප්‍රතිලාභ අත්කර ගන්නා ලදී.

මේ අතර, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය ද සමාලෝචිත වසර තුළ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරන ලදී. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලින් ලැබුණු දළ ලිඛිත වාරික ආදායම, 2024 වසරේ පැවති රුපියල් බිලියන 138.16 සිට 2025 වසරේදී රුපියල් බිලියන 157.84 දක්වා ඉහළ ගිය අතර, එමගින් 14.2% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යාම, මෝටර් රථ භාවිතය වැඩිවීම, යටිතළ පහසුකම් ආශ්‍රිත සංවර්ධන කටයුතු මෙන්ම වෛද්‍ය, දේපළ, ඉංජිනේරු සහ වාණිජ රක්ෂණ විසඳුම් සඳහා පැවති ඉහළ ඉල්ලුම මෙම ක්ෂේත්‍රයේ වර්ධනයට මහෝපකාරී විය. මීට අමතරව, ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ පාරිභෝගික වියදම් අඛණ්ඩව පුළුල් වීම හේතුවෙන් විවිධ කාණ්ඩ යටතේ සාමාන්‍ය රක්ෂණාවරණ සඳහා ඇති ඉල්ලුම තවදුරටත් ඉහළ ගියේය.

වාරික ආදායමේ ශක්තිමත් වර්ධනයක් පැවතියද කලාපීය සහ ගෝලීය දර්ශකයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රක්ෂණ විනිවිදීම තවමත් පැවතියේ සාපේක්ෂව අඩු මට්ටමකය. එමගින් මෙරට රක්ෂණ වෙළඳපොළ තුළ තවමත් ප්‍රයෝජනයට ගෙන නොමැති විශාල විභවතාවක් පවතින බව මැනවින් පැහැදිලි වේ. කෙසේ වෙතත්, රක්ෂණ නිෂ්පාදන සහ සේවාවන් සමග මහජනතාවගේ නියැලීම ඉහළ යාම හේතුවෙන්, සමාලෝචිත වසර තුළ රක්ෂණ ඝනත්වය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි. විශේෂයෙන්ම දිගුකාලීන රක්ෂණ ක්ෂේත්‍රය තුළ වාරික ප්‍රමාණයේ සිදු වූ මෙම වර්ධනය මගින් පෙනී යන්නේ, රක්ෂණය යනු අත්‍යවශ්‍ය මූල්‍ය ආරක්ෂණ යාන්ත්‍රණයක් මෙන්ම දිගුකාලීන ඉතුරුම් මෙවලමක් ලෙස ජනතාව අතර පිළිගැනීමට ලක්වීම ඉහළ යමින් පවතින බවයි.

සමාලෝචිත වසර තුළ රක්ෂණ කර්මාන්තයේ සමස්ත වත්කම් පදනම සැලකිය යුතු ලෙස පුළුල් වූ අතර එමගින් ශ්‍රී ලංකාවේ සමස්ත මූල්‍ය පද්ධතිය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනය වන වැදගත්කම තවදුරටත් තහවුරු විය. කර්මාන්තයේ මුළු වත්කම් ප්‍රමාණය, 2024 වසරේ පැවති රුපියල් ට්‍රිලියන 1.22 සිට 2025 වසරේදී රුපියල් ට්‍රිලියන 1.43 දක්වා ඉහළ ගිය අතර එය වසරින් වසර 17.5% ක ශක්තිමත් වර්ධනයකි.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය අඛණ්ඩව රක්ෂණ කර්මාන්තයේ සමස්ත වත්කම්වලින් විශාලතම කොටසට හිමිකම් කී අතර එය 2024 වසරේ පැවති රුපියල් බිලියන 921.17 සිට 2025 වසරේදී රුපියල් ට්‍රිලියන 1.06 දක්වා ඉහළ ගියේය. මෙය ආසන්න වශයෙන් 15.0% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ව්‍යාප්තිය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදල් අඛණ්ඩව රැස් කිරීම සහ විශේෂයෙන්ම රාජ්‍ය සුරැකුම්පත් හා අනෙකුත් දිගුකාලීන මූල්‍ය උපකරණවල ආයෝජන කටයුතු වැඩි වීමයි.

එසේම සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය ද සමාලෝචිත වසර තුළ තම වත්කම් පදනම කැපී පෙනෙන ලෙස යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කරන ලදී. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් ප්‍රමාණය, 2024 වසරේ පැවති රුපියල් බිලියන 286.35 සිට 2025 වසරේදී රුපියල් බිලියන 359.95 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය ආසන්න වශයෙන් 25.7% ක වර්ධනයකි. මීට පෙර වසරේ දී රක්ෂණ කර්මාන්තය තුළ සිදු වූ ව්‍යාපාර වෙන්කිරීමේ ගැලපීම් හේතුවෙන් වත්කම්වල වාර්තා වූ පසුබැසීමෙන් පසුව මෙම යථා තත්ත්වයට පත්වීම සිදුව ඇති අතර එමගින් රක්ෂණ සමාගම්වල මෙහෙයුම් ස්ථාවරත්වය සහ ශේෂ පත්‍රවල වර්ධනය මැනවින් පිළිබිඹු වේ.

මේ අතර, ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය ද සිය ස්ථාවර වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගෙන ගිය අතර එහි මුළු වත්කම් 2024 වසරේ පැවති රුපියල් බිලියන 11.74 සිට 2025 වසරේදී රුපියල් බිලියන 12.64 දක්වා ඉහළ ගොස් ඇත. ප්‍රතිරක්ෂණ කටයුතු මෙලෙස අඛණ්ඩව ව්‍යාප්ත වීම මගින් වෙළඳපොළ තුළ පවතින අවදානම් මාරු කිරීමේ ක්‍රමවේද සඳහා වන ඉල්ලුම ඉහළ යාම සහ රක්ෂණ අවදානම්වල ඇති වෙමින් පවතින සංකීර්ණභාවය මැනවින් පිළිබිඹු වේ.

රක්ෂණ කර්මාන්තයේ වත්කම් සංචිතය මෙලෙස අඛණ්ඩව වර්ධනය වීම මගින් ක්ෂේත්‍රයේ මූල්‍ය ශක්තිමත්භාවය, වැඩිදියුණු වූ ප්‍රාග්ධන සමුච්චය මෙන්ම රටේ දිගුකාලීන ආර්ථික ක්‍රියාකාරකම් සහ මූල්‍ය ස්ථාවරත්වය සඳහා දායක වීමට ක්ෂේත්‍රයට ඇති හැකියාව මැනවින් කැපී පෙනේ.

රක්ෂණ කළඹෙහි වර්ධනය, පාරිභෝගිකයන් රක්ෂණ නිෂ්පාදන සහ සේවාවන් ඉහළ මට්ටමකින් භාවිත කිරීම සහ වෙළෙඳපොළ

පුරා රක්ෂණ කටයුතුවල සමස්ත ව්‍යාප්තියට සමගාමීව, වසර තුළදී රක්ෂණ කර්මාන්තය විසින් දරන ලද හිමිකම් පෑම්වලට අදාළ මුදල් ප්‍රමාණය ද ඉහළ ගියේය. කර්මාන්තය විසින් දරන ලද සමස්ත හිමිකම් පෑම්වලට අදාළ මුදල් ප්‍රමාණය, 2024 වසරේ පැවති රුපියල් බිලියන 146.68 සිට 2025 වසරේදී රුපියල් බිලියන 173.48 දක්වා ඉහළ ගිය අතර එමගින් දළ වශයෙන් 18.3% ක වසරින් වසර වැඩිවීමක් පිළිබිඹු කරයි.

2024 වසරේ පැවති රුපියල් බිලියන 83.89 ක හිමිකම් සමග සැසඳීමේදී දිගුකාලීන රක්ෂණ අංශය වසර තුළදී රුපියල් බිලියන 104.70 ක හිමිකම් පෑම් ප්‍රමාණයක් වාර්තා කළ අතර එය දළ වශයෙන් 24.8% ක සැලකිය යුතු ඉහළ යෑමකි. මෙම වර්ධනය මගින් ජීවිත රක්ෂණ අංශය තුළ කල් පිරෙන ගෙවීම්, මරණ හිමිකම්, සෞඛ්‍යයට අදාළ ප්‍රතිලාභ සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආයෝජන කළඹෙහි සමස්ත ව්‍යාප්තිය ඉහළ යාම පිළිබිඹු වේ.

සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය තුළ හිමිකම් පෑම් ද වසර තුළදී එනම් 2024 වසරේ පැවති රුපියල් බිලියන 62.80 ක මුදලේ සිට 2025 වසරේදී රුපියල් බිලියන 68.77 දක්වා දළ වශයෙන් 9.5% ක වර්ධනයක් පෙන්නුම් කරමින් ඉහළ ගොස් ඇත. මෙම ඉහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම බලපා ඇත්තේ මෝටර් රථ වාහන ආශ්‍රිත හිමිකම් පෑම්, වෛද්‍ය රක්ෂණ භාවිතය, දේපළ ආශ්‍රිත අලාභ හානි සහ වාණිජ රක්ෂණ අවදානම් තත්ත්වයන් වේ.

ශක්තිමත් වාරික වර්ධනයක් සහ අඛණ්ඩ ව්‍යාපාරික ව්‍යාප්තියක් පැවතියද වසර තුළ ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ ලාභදායීත්වය දැඩි පීඩනයකට ලක්ව තිබුණි. සමස්ත කර්මාන්තයේ මුළු ලාභය 2024 වසරේ පැවති රුපියල් බිලියන 59.95 සිට 2025 වසරේදී රුපියල් බිලියන 41.25 දක්වා පහත වැටී ඇති අතර එමගින් 31.2% ක පසුබෑමක් පෙන්නුම් කරයි.

දීගුකාලීන රක්ෂණ ක්ෂේත්‍රය 2024 වසරේදී රුපියල් බිලියන 32.31 ක ලාභයක් ලබා තිබූ අතර ඊට සාපේක්ෂව වසර තුළදී රුපියල් බිලියන 36.23 ක ලාභයක් වාර්තා කර ඇත. මෙමගින් දළ වශයෙන් 10.8% ක පහත වැටීමක් පෙන්නුම් කරයි. එසේම, සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ලාභය රුපියල් බිලියන 23.32 සිට රුපියල් බිලියන 20.72 දක්වා පහත වැටී ඇති අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ ඉහළ ගිය හිමිකම් පෑම් පිරිවැය, මෙහෙයුම් වියදම් සහ වෙනස් වන වෙළෙඳපොළ තත්ත්වයන් වේ.

පෙර වසරේදී රුපියල් මිලියන 393 ක අලාභයක් වාර්තා කර තිබූ ප්‍රතිරක්ෂණ අංශය, 2025 වසරේදී රුපියල් බිලියන 11.78 ක අලාභයක් වාර්තා කර ඇත. මීට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ සමස්ත කර්මාන්තයේ ලාභදායීත්වයට දැඩි ලෙස බලපෑ 'දිට්වා' සුළි කුණාටුව ආශ්‍රිත හිමිකම් පෑමය. මෙම පීඩනයන් පැවතියද, ශක්තිමත් වත්කම් වර්ධනය, දුරදක්නා ආයෝජන පරිචයන් සහ අඛණ්ඩ නියාමන අධීක්ෂණය හේතුවෙන් සමස්තයක් ලෙස රක්ෂණ කර්මාන්තය මූල්‍යමය වශයෙන් ස්ථාවර මට්ටමක සහ ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සහිතව පැවතුණි.

ලාභදායීත්වයේ මෙම පහත වැටීම මගින් වසර තුළ රක්ෂණකරුවන් මුහුණ දුන් පුළුල් මෙහෙයුම් අභියෝග පිළිබිඹු වේ. ඉහළ ගිය හිමිකම් පෑම් ප්‍රමාණය, පොලී අනුපාත පහත වැටීම හේතුවෙන් ආයෝජනවලින් ලැබුණු අඩු ප්‍රතිලාභ, ඉහළ යන මෙහෙයුම් වියදම් සහ තරඟකාරී වෙළෙඳපොළ තත්ත්වයන් මීට ඇතුළත් වේ. එසේ වුවද, සංයමයෙන් යුතු ප්‍රතිරක්ෂණය, වඩාත් ශක්තිමත් අවදානම් කළමනාකරණ පරිචයන් සහ අඛණ්ඩ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් ඔස්සේ තම ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පෙන්නුම් කිරීමට මෙම ක්ෂේත්‍රය සමත් වී ඇත.

ආයතනික සහ සිල්ලර වෙළෙඳපොළ අංශ ද්විත්වයෙහිම වෙළෙඳපොළ ප්‍රවේශය පහසු කිරීම, පාරිභෝගික සහභාගීත්වය ශක්තිමත් කිරීම සහ වෘත්තීයමය අවදානම් උපදේශන සේවා සැපයීම මගින් ශ්‍රී ලංකාවේ රක්ෂණ පද්ධතිය තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට රක්ෂණ තැරැව්කරුවන් විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

## නියාමන අධීක්ෂණය සහ පාලනය ශක්තිමත් කිරීම

ආයතනික ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම, වෙළෙඳපොළ විනය වැඩිදියුණු කිරීම සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීම යන අරමුණු පෙරදැරි කරගෙන කොමිෂන් සභාව වසර තුළ නියාමන අධීක්ෂණය සහ පාලන පරීක්ෂාවන් තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කළේය. රක්ෂණ ඔප්පුහිමියන්ට සාධාරණ ලෙස සැලකීම, සදාචාරාත්මක විකුණුම් භාවිතයන්, විනිවිදභාවය පිළිබඳ ප්‍රමිතීන්, හිමිකම් කළමනාකරණය සහ පාරිභෝගික ආරක්ෂණ යාන්ත්‍රණයන් සම්බන්ධ නියාමන අධීක්ෂණය ශක්තිමත් කිරීම අරමුණු කරගත් සුවිශේෂී වෙළෙඳපොළ හැසිරීම් ඒකකයක් පිහිටුවීම මෙම වසර තුළ අත්කරගත් ප්‍රධාන සන්ධිස්ථානයක් විය. රක්ෂණ බෙදාහැරීමේ මාදිලි සහ පාරිභෝගික සම්බන්ධතා නාලිකාවල පවතින සංකීර්ණත්වය වර්ධනය වීම හේතුවෙන්, වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය නූතන රක්ෂණ නියාමනයේ තීරණාත්මක අංගයක් බවට පත්ව ඇත. මෙම සුවිශේෂී කාර්යභාරය ස්ථාපිත කිරීම මගින් කොමිෂන් සභාවේ අධීක්ෂණ ව්‍යුහයෙහි වැදගත් ප්‍රගතියක් නිරූපණය කරයි.

එසේම, රක්ෂණ මැදිහත්කරුවන් බලපත්‍ර ගැන්වීමේ සහ අධීක්ෂණ අංශය පිහිටුවීම මගින් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන රක්ෂණ තැරැව්කරුවන්, නියෝජිතයන් සහ අලාභ ගැළපුම්කරුවන් සම්බන්ධ නියාමන අධීක්ෂණය තවදුරටත් ඉහළ නංවන ලදී. මෙම මුලපිරීම මගින් නියාමන රාමුව තුළ පවතින මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන අතරතුර යහපාලනය, වගවීම සහ අධීක්ෂණ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට කටයුතු කෙරිණි.

කොමිෂන් සභාව වසර තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීමද අඛණ්ඩව සිදු කර ඇත. මීට පෙර ස්ථාපිත කරන ලද විශේෂිත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ඒකකය පදනම් කරගනිමින්, කර්මාන්තය පුරා අනුකූලතා ප්‍රමිතීන්, අවදානම් පාදක නිරීක්ෂණ සහ අභ්‍යන්තර පාලන රාමුවල ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා රක්ෂණකරුවන් සහ මැදිහත්කරුවන් සමග ඇති සන්නිවේදනය සහ සම්බන්ධීකරණය තවදුරටත් ඉහළ නංවන ලදී. ක්‍රමයෙන් ඉහළ යන ගෝලීය නියාමන අපේක්ෂාවන් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ අඛණ්ඩතාව සහ ජාත්‍යන්තර විශ්වසනීයත්වය පවත්වාගෙන යාම සඳහා මෙම උත්සාහයන් අත්‍යවශ්‍ය වේ.

අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය - 17 ක්‍රියාත්මක කිරීමට අදාළ අඛණ්ඩ ප්‍රගතියක් මෙම වසර තුළ දක්නට ලැබිණි. 2026 වසරේ සිට ආරම්භ වන නව ගිණුම්කරණ ප්‍රමිතිය වෙත සංක්‍රමණය වීම සඳහා අවශ්‍ය වන සූදානම නිරීක්ෂණය කිරීම, වාර්තාකරණ රාමු ශක්තිමත් කිරීම සහ ධාරිතා සංවර්ධන මුලපිරීම් සඳහා පහසුකම් සැලසීම පිණිස කොමිෂන් සභාව රක්ෂණකරුවන්, විගණකවරුන්, ආයුගණකඥයින් සහ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමග සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන ගියේය.

## ඩිජිටල් පරිවර්තනය සහ නවෝත්පාදනය ඉහළ නැංවීම

සමාලෝචිත වසර තුළ කොමිෂන් සභාවේ මෙන්ම සමස්ත රක්ෂණ ක්ෂේත්‍රයේම ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස ඩිජිටල් පරිවර්තනය පැවතිණි. මෙම කාලසීමාව තුළ කැපී පෙනෙන සුවිශේෂී ජයග්‍රහණයක් වූයේ ශ්‍රී ලංකා රක්ෂණ සංගමය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය සමග සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ඩිජිටල් මෝටර් රථ රක්ෂණ කාඩ්පත හඳුන්වා දීම සඳහා දැනට සිදු කෙරෙමින් පවතින සංවර්ධන කාර්යයි. මෙම මුලපිරීම මගින් මෝටර් රථ රක්ෂණ ක්ෂේත්‍රය තුළ රක්ෂණ සත්‍යාපන පද්ධති, මෙහෙයුම් කාර්යක්ෂමතාව, විනිවිදභාවය ඉහළ නැංවීම සහ වංචා වැළැක්වීම අරමුණු කරගත් අනාගත සුවිශේෂී ප්‍රගමනයක් නිරූපණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමග එක්ව මධ්‍යගත මෝටර් රථ රක්ෂණ දත්ත ගබඩාව ස්ථාපිත කිරීම දත්ත පාදක කරගත් අධීක්ෂණ කටයුතු සහ වෙළෙඳපොළ විනිවිදභාවය ශක්තිමත් කිරීමෙහිලා තැබූ තවත් සුවිශේෂී පියවරක් සනිටුහන් කළේය. මෙම සංවර්ධන කටයුත්ත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ පසු, මධ්‍යකාලීනව නියාමන විශ්ලේෂණ හැකියාවන්, ප්‍රතිරක්ෂණ ගුණාත්මකභාවය, වංචාවන් හඳුනාගැනීමේ හැකියාව සහ සමස්ත ක්ෂේත්‍රය පුරා දත්ත පරිශීලනය කිරීමේ ප්‍රවේශය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

කොමිෂන් සභාව තුළද, අභ්‍යන්තර තාක්ෂණික ධාරිතාව සහ තොරතුරු ආරක්ෂණ පාලනය ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු උත්සාහයක් දරන ලදී. වසර තුළදී, ආයතනය පුරා පාලන පරීක්ෂාවන් සහ සයිබර් ආරක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා තොරතුරු ආරක්ෂණ කමිටුවක් සහ තොරතුරු තාක්ෂණ අනුකූලතා අනුකමිටුවක් පිහිටුවන ලදී. එසේම, නැගී එන සයිබර් තර්ජනවලට එරෙහිව ආයතනික සූදානම වැඩිදියුණු කිරීම සහ සයිබර් ආරක්ෂණ රාමු ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා සයිබර් හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT) සමග සාකච්ඡා ද ආරම්භ කරන ලදී.

එමෙන්ම, කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ අධීක්ෂණ ප්‍රතිචාරාත්මකභාවය ඉහළ නැංවීම සඳහා කොමිෂන් සභාව සිය නියාමන තොරතුරු තාක්ෂණ පද්ධති ප්‍රති-ඉංජිනේරුකරණයට ලක් කිරීම ද ආරම්භ කරන ලදී. ආයතනය පුරා යහපාලනය, මෙහෙයුම් පාලනයන්, තොරතුරු ආරක්ෂණය සහ ඩිජිටල් අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සඳහා වසර තුළදී තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති එකොළහක් කෙටුම්පත් කරන ලදී.

## රක්ෂණ දැනුවත්භාවය සහ මූල්‍ය අන්තර්ග්‍රාහී බව ප්‍රවර්ධනය කිරීම

රක්ෂණ ක්ෂේත්‍රය මෑත වසරවලදී වර්ධනයක් වාර්තා කර තිබුණද ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාප්තිය තවමත් සාපේක්ෂව අඩු මට්ටමක පවතී. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රජාවන්, විධිමත් නොවන අංශයේ සේවකයින් සහ ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි කොටස් අතර මෙම තත්ත්වය කැපී පෙනේ. මෙම ආරක්ෂණ පරතරය පියවීම කොමිෂන් සභාවේ වැදගත්ම දිගුකාලීන ප්‍රමුඛතාවක් ලෙස පවතී. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2025 වසර පුරාම රක්ෂණ සාක්ෂරතාව, මහජන දැනුවත්භාවය සහ මූල්‍ය අන්තර්ග්‍රාහී මුලපිරීම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම අඛණ්ඩව සිදු කර ඇත.

සියලුම බලපත්‍රලාභී රක්ෂණකරුවන් සහ ප්‍රධාන ක්ෂේත්‍ර පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයෙන් සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණය යන තේමාව යටතේ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් මාතර, යාපනය සහ කිලිනොච්චිය යන නගරවල පවත්වන ලද වැඩසටහන් සමගින් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය තුළ මේ දක්වා ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කරන ලද විශාලතම සම්බන්ධීකරණය කරන ලද දැනුවත් කිරීමේ මුලපිරීම්වලින් එකක් විය. මෙම ව්‍යාපාර මගින් රථ පෙළපාලි, වැඩමුළු, අධ්‍යාපනික සැසි සහ අන්තර්ක්‍රියාකාරී සහභාගිත්ව වේදිකාවන් හරහා රක්ෂණකරුවන්, තැරැව්කරුවන්, ක්ෂේත්‍ර සංගම්, විද්‍යාර්ථයින්, සිසුන්, රාජ්‍ය ආයතන සහ සාමාන්‍ය මහජනතාව එක්රැස් කරන ලදී. රක්ෂණයේ කාර්යභාරය සහ ප්‍රතිලාභ, රක්ෂිතයන්ගේ අයිතිවාසිකම්, වන්දි යාන්ත්‍රණයන්, මූල්‍ය ආරක්ෂණය සහ ක්ෂේත්‍රය තුළ ඇති වෘත්තීය අවස්ථා පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම කෙරෙහි මෙම වැඩසටහන්වලදී අවධානය යොමු කරන ලදී.

ක්ෂේත්‍රය තුළ දිගුකාලීන දක්ෂතා වර්ධනයට සහාය වීම සහ ක්ෂේත්‍රය හා විශ්ව විද්‍යාල අතර සහයෝගීතාව ශක්තිමත් කිරීමේ පුළුල් ප්‍රයත්නයන්හි කොටසක් ලෙස, කොමිෂන් සභාව වසර තුළදී විශ්ව විද්‍යාල සහ වෘත්තීය ආයතන සමග පවත්වන සබඳතා වැඩි කරන ලදී. මේ සම්බන්ධයෙන් වැදගත් සන්ධිස්ථානයක් වූයේ අනාගත රක්ෂණ නායකයින් බලගැන්වීම් යන තේමාව යටතේ පවත්වන ලද සමාරම්භක අන්තර් විශ්ව විද්‍යාල රක්ෂණ ප්‍රශ්න විචාරාත්මක තරඟය වන 'InsureChamp 2025' සාර්ථකව ආරම්භ කිරීමයි. මෙම මුලපිරීම මගින් ක්ෂේත්‍රය තුළ ඇති වෘත්තීය අවස්ථා පිළිබඳ දැනුවත්භාවය ශක්තිමත් කරන අතරම සිසුන්ට රක්ෂණ සංකල්ප, මූල්‍ය සාක්ෂරතාව සහ අවදානම් කළමනාකරණ මූලධර්ම සමග සම්බන්ධ වීමට වටිනා වේදිකාවක් නිර්මාණය කරන ලදී.

මූල්‍ය අධ්‍යාපනයේ සහ රක්ෂණ දැනුවත්භාවයේ වැදගත්කම තවදුරටත් තහවුරු කරමින් දිගුකාලීන ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ කලාපීය පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයෙන් සංවිධානය කරන ලද ජාතික මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා ද කොමිෂන් සභාව සක්‍රියව දායක විය.

## තිරසරභාවය, දේශගුණික අවදානම සහ ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව

දේශගුණය ආශ්‍රිත අවදානම්, ස්වභාවික විපත්, ජනවිකාස වෙනස්වීම් සහ සයිබර් තර්ජන මගින් ගෝලීය රක්ෂණ ක්ෂේත්‍රයේ අනාගත මෙහෙයුම් වටපිටාව කෙරෙහි එල්ල වන බලපෑම වර්ධනය වෙමින් පවතී. ශ්‍රී ලංකාව ද දේශගුණය ආශ්‍රිත සිදුවීම් සහ ස්වභාවික ව්‍යසනයන්ට දැඩි ලෙස ගොදුරු වන ප්‍රවණතාවයක් අඛණ්ඩව පවතින අතර ජාතික මට්ටමේ අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම හදිසි ප්‍රමුඛතාවක් බවට පත් වී ඇත. මෙම පැන නැගෙන අභියෝග හඳුනා ගනිමින්, කොමිෂන් සභාව විසින් සමාලෝචිත වසර තුළ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව, තිරසර රක්ෂණ භාවිතයන් සහ විපත් අවදානම් මූල්‍යකරණ යාන්ත්‍රණයන් සම්බන්ධ සංවාද සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD) සහ ආසියානු සංවර්ධන බැංකු ආයතනය (ADBI) සමග එක්ව 2026 වසරේදී ආසියාවේ රක්ෂණ සහ විශ්‍රාමික ඉතුරුම් පිළිබඳ වටමේස සාකච්ඡාව සත්කාරකත්වය දරමින් පැවැත්වීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව දැක්වූ සහයෝගීතාව මේ සම්බන්ධයෙන් වූ සුවිශේෂී සන්ධිස්ථානයක්

විය. මෙම මුලපිරීම මගින් කලාපය පුරා පවතින ස්වභාවික උපද්‍රව ආරක්ෂණ පරතරයන්, විශ්‍රාමික ඉතුරුම් අභියෝග සහ දිගුකාලීන මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කරන ලදී.

ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සහ තාක්ෂණික විශේෂඥයින්ගේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවටම ආවේණික වූ සම්මත මරණ අනුපාත වගුවක් සකස් කිරීමේ කටයුතු ද කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී. මෙම මුලපිරීම මගින් ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය තුළ පවතින ආයුගණක තක්සේරු කිරීම්වල නිරවද්‍යතාව, රක්ෂණ නිෂ්පාදන මිල නියම කිරීමේ ක්‍රමවේද සහ දිගුකාලීන අවදානම් කළමනාකරණ හැකියාව සැලකිය යුතු ලෙස ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, වඩාත් ඔරොත්තු දෙන සහ අනාගතයට සූදානම් රක්ෂණ පද්ධතියක් ගොඩනැගීමේ පුළුල් ප්‍රයත්නයන්හි කොටසක් ලෙස පාරිසරික, සමාජීය සහ පාලන සංකල්ප ඒකාබද්ධ කිරීම, තිරසර පාලනය සහ වගකිවයුතු ව්‍යාපාරික භාවිතයන් ශක්තිමත් කිරීම සඳහා රක්ෂණකරුවන් දිරිමත් කිරීම ද කොමිෂන් සභාව අඛණ්ඩව සිදු කර ඇත.

## ඉදිරි දැක්ම

වසර තුළ අත්කර ගත් ප්‍රගතිය දිරිගන්වනසුලු වුවද රක්ෂණ ප්‍රවේශ්‍යතාව ශක්තිමත් කිරීම, වෙළෙඳපොළ හැසිරීම් ප්‍රමිති ඉහළ නැංවීම, නියාමනය නවීකරණය කිරීම සහ ක්ෂේත්‍රය කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා තවදුරටත් බොහෝ කාර්යයන් සිදු කිරීමට ඇති බව කොමිෂන් සභාව පිළිගනී. තාක්ෂණය, වෙනස් වන පාරිභෝගික අපේක්ෂාවන්, පාරිසරික අවදානම්, ජනවිකසන වෙනස් වීම් සහ විකාශනය වන ගෝලීය නියාමන ප්‍රමිතීන් හේතුවෙන් රක්ෂණ ක්ෂේත්‍රය වේගවත් පරිවර්තනීය යුගයකට අවතීර්ණ වෙමින් පවතී. මෙම වටපිටාව තුළ, නියාමන ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව, ආයතනික අනුවර්තනය වීමේ හැකියාව සහ නවෝත්පාදනයන්, ක්ෂේත්‍රයේ දිගුකාලීන ඔරොත්තු දීමේ හැකියාව තීරණය කරන තීරණාත්මක සාධක වනු ඇත.

එබැවින්, ඉදිරියට යන ගමනේ දී කොමිෂන් සභාවේ උපායමාර්ගික ප්‍රමුඛතාවන් මගින් ඩිජිටල් නියාමන පරිවර්තනය වේගවත් කිරීම, අවදානම් පාදක අධීක්ෂණය ශක්තිමත් කිරීම, පාරිභෝගික ආරක්ෂණය ඉහළ නැංවීම, මූල්‍ය අන්තර්ග්‍රාහී බව පුළුල් කිරීම සහ වෙළෙඳපොළ සංවර්ධන මුලපිරීම් තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

මෑතක දී දියත් කරන ලද රක්ෂණ සැලසුම මගින් ජාතික ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහ සමාජ සුභසාධනය සඳහා ක්ෂේත්‍රයේ දායකත්වය ශක්තිමත් කරන අතරම 2030 සහ 2035 වන විට රක්ෂණ ව්‍යාප්තිය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම අරමුණු කරගත් ඉහළ අභිලාෂයන් සහිත දිගුකාලීන ඉලක්ක දක්වා ඇත. ඉදිරි වසරවලදී තිරසාර සංවර්ධන ඉලක්ක, පාරිසරික, සමාජීය සහ පාලන මූලධර්ම මෙන්ම තිරසාර මූල්‍ය රාමු රක්ෂණ ක්ෂේත්‍රයේ භාවිතයන් වෙත ඒකාබද්ධ කිරීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරනු ඇත.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය විකාශනය වන ගෝලීය ප්‍රමිතීන්ට සහ හොඳම භාවිතයන්ට අනුකූලව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්, රක්ෂණකරුවන්, වෘත්තීය ආයතන, අධ්‍යයන ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ ජාත්‍යන්තර නියාමන සංවිධාන සමග පවතින සහයෝගීතාව ශක්තිමත් කිරීම කොමිෂන් සභාව විසින් අඛණ්ඩව සිදු කරනු ඇත.

## කෘතඥතාව පිරිනැමීම

වසර පුරා ලබා දුන් අඛණ්ඩ මග පෙන්වීම, නායකත්වය සහ සහයෝගය වෙනුවෙන් කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ සාමාජිකයින් වෙත මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. සැලකිය යුතු ආයතනික ප්‍රගතියක් සහ ක්ෂේත්‍රීය පරිවර්තනයක් සිදු වූ කාල පරිච්ඡේදයක් තුළ කොමිෂන් සභාවේ අරමුණු ඉදිරියට ගෙනයෑම සඳහා ඔවුන්ගේ උපායමාර්ගික මග පෙන්වීම සහ කැපවීම බෙහෙවින් ඉවහල් විය.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා දැක්වූ සහයෝගීතාව සහ ලබා දුන් වටිනා දායකත්වය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී රක්ෂණ සමාගම්, තැරැව්කරුවන්, වෘත්තීය ආයතන, ක්ෂේත්‍ර සංගම්, සංවර්ධන හවුල්කරුවන් සහ අනෙකුත් සියලුම පාර්ශවකරුවන් ද මම බෙහෙවින් අගය කරමි.

විශේෂයෙන් ම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ වෘත්තීයභාවය සහ රාජ්‍ය සේවය වෙනුවෙන් වූ කැපවීම පිළිබඳව මම ඔවුන්ට ස්තූතිවන්ත වෙමි. රක්ෂණ ක්ෂේත්‍රයේ ඵලදායී ක්‍රියාකාරීත්වය සහ අඛණ්ඩ සංවර්ධනය සහතික කිරීම සඳහා ඔවුන්ගේ ප්‍රයත්නයන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

නියාමන කළමනාකාරීත්වයේ 25 වැනි වසර සමරන මෙම අවස්ථාවේදී, ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වයට සහ සමාජීය ප්‍රගතියට අර්ථවත් ලෙස දායක වන්නා වූ වඩාත් ශක්තිමත්, විනිවිදභාවයෙන් යුත්, අන්තර්ග්‍රාහී සහ අනාගතයට සූදානම් රක්ෂණ ක්ෂේත්‍රයක් ගොඩනැගීම වෙනුවෙන් අපි කැපවී සිටිමු.

**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්

# කොමිෂන් සභාවේ සාමාජිකයින්



ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. ද මෙල්
සභාපති



ඒ.එන්. හපුගල මහතා



ආචාර්ය චන්ද්‍රනාත්
අමරසේකර



කේ.ඒ.පී. ද සිල්වා මහත්මිය



ආර්.සී. කෝට්ටේ
හේවා මහතා



ජී.ඒ.එස්. ජයරත්න මහතා



එස්. වෛද්‍යරත්න මහතා

# කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව



## ආචාර්ය ඩබ්ලිව්.ඒ.ආර්. ද මෙල්

සභාපති

ආචාර්ය අජිත් රවීන්ද්‍ර ද මෙල් මහතා 2025 ජනවාරි 02 දින ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ධුරයේ වැඩ භාරගන්නා ලදී.

ආචාර්ය ද මෙල් මහතා 2015 වසරේ සිට රුහුණ විශ්ව විද්‍යාලයේ ගණිත අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙසත් 2018 වසරේ සිට මොරටුව විශ්ව විද්‍යාලයේ සහ සර් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලයේ ගණිත අධ්‍යයනාංශයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙසත් සේවය කරයි.

ඇමරිකා එක්සත් ජනපදයේ මිසූරි විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයෙන් සංඛ්‍යාන විෂයය ප්‍රධාන කොටගත් ගණිතය පිළිබඳ ආචාර්ය උපාධියක් ඔහු සතුය. ඔහුගේ අනෙකුත් ශාස්ත්‍රීය ජයග්‍රහණ අතරට ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ ගෞරව) උපාධියක්, ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයෙන් දර්ශනපති උපාධියක්, ඇමරිකා එක්සත් ජනපදයේ මිසූරි විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයෙන් සංඛ්‍යාන විෂයය ප්‍රධාන කොටගත් ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ සෑම් හූස්ටන් රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධියක් ඇතුළත් වේ.

ආචාර්ය ද මෙල් මහතා රුහුණ විශ්ව විද්‍යාලයේ සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පාලක සභා සාමාජිකත්වය වැනි වැදගත් ශාස්ත්‍රීය තනතුරු දරා ඇත. මීට අමතරව, ඔහු රුහුණ විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාත්මක ගණිත අධ්‍යයනාංශයේ ප්‍රධානියා ලෙසත් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාත්මක ගණිත අධ්‍යයනාංශයේ ප්‍රධානියා ලෙසත් කටයුතු කර තිබේ.

රුහුණ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ දත්ත විද්‍යාව සහ ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව නිර්මාණය කර සංවර්ධනය කිරීමෙහිලා ආචාර්ය ද මෙල් මහතා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය.

ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් හි හන්ට්ස්විල් හි පිහිටි සෑම් හූස්ටන් රාජ්‍ය විශ්ව විද්‍යාලයේ උපාධිධාරී ශිෂ්‍ය උපකාරක කථිකාචාර්ය (Graduate Teaching Assistant) ධුරය, ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් හි බිංගැම්ටන් රාජ්‍ය විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාන විෂය පිළිබඳ බාහිර සහකාර මහාචාර්ය ධුරය සහ ඇමරිකා එක්සත් ජනපදයේ රෝලා හි පිහිටි මිසූරි විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ ගණිත හා සංඛ්‍යාන අධ්‍යයනාංශයේ ශිෂ්‍ය උපකාරක කථිකාචාර්ය (Teaching Assistant) ධුරය ඇතුළු ජාත්‍යන්තර විශ්ව විද්‍යාල කිහිපයකම විවිධ තනතුරු දරා ඇත.

ඔහු සංඛ්‍යානය, රක්ෂණය සහ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රකාශන රැසක කතුවරයා ද වේ. 2008 වසරේදී, ඇමරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් හි හන්ට්ස්විල් හි පිහිටි සෑම් හූස්ටන් රාජ්‍ය විශ්ව විද්‍යාලයේ ගණිත හා සංඛ්‍යාන අධ්‍යයනාංශය මගින් පිරිනමනු ලබන සංඛ්‍යාන විෂය පිළිබඳ විශිෂ්ටතම උපාධිධාරී සම්මානයෙන් ද ආචාර්ය ද මෙල් මහතා පිදුම් ලැබීය. ඔහුගේ ජයග්‍රහණ ඇගයීමට ලක් කරමින් ඇමරිකානු ගණිත සංගමය (AMS), ඇමරිකානු සංඛ්‍යාන සංගමය (ASA) සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය වැනි දේශීය හා ජාත්‍යන්තර වෘත්තීය සංගම් වෙතින් සම්මාන රැසක් ඔහු වෙත පිරිනමා ඇත. ඔහු ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ, ඇමරිකානු ගණිත සංගමයේ සහ ඇමරිකානු සංඛ්‍යාන සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු ද වේ.



## ඒ.එන්. හපුගල මහතා

ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු වන ඒ.එන්. හපුගල මහතා, 1992 වසරේදී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරීවරයෙකු ලෙස සිය සේවය ආරම්භ කරමින් භාණ්ඩාගාරයේ වසර විස්සක සේවා කාලයක් ඇතුළුව වසර තිහකට අධික කාලයක් රාජ්‍ය අංශයේ සේවය කර ඇත.

හපුගල මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. තවද, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට අනුබද්ධ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ.



## ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර

ආචාර්ය අමරසේකර මහතා, මිල ස්ථායීතාව භාර ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා වන අතර මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ නිල සාමාජිකයෙකි. ඒ මහතා දැනට ආර්ථික පර්යේෂණ, සංඛ්‍යාන, වෙළෙඳපොළ මෙහෙයුම්, සාර්ව විචක්ෂණශීලී අධීක්ෂණ, ආයෝජන කළමනාකරණ, තැන්පතු රක්ෂණ සහ විසඳුම්, පහසුකම් කළමනාකරණ මෙන්ම තොරතුරු තාක්ෂණ යන දෙපාර්තමේන්තුවල කටයුතු අධීක්ෂණය කරනු ලබයි. ආචාර්ය අමරසේකර මහතා විසින් මීට පෙර සහකාර අධිපති ධුරය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ ලේකම් ධුරය දරන ලදී. 2022 ජනවාරි සිට 2024 පෙබරවාරි දක්වා කාලය තුළ ඒ මහතා, ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් හි පිහිටි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත මුදාහැර තිබූ අතර එහිදී ඔහු ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංග්ලාදේශය සහ භූතානය යන රටවල් සඳහා විකල්ප විධායක අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය.

මුදල් ප්‍රතිපත්ති සහ පර්යේෂණ ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවක් සහිතව ඒ මහතා වසර 22කට අධික කාලයක් මහ බැංකුවේ සේවය කර ඇති අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සිය රාජකාරි කටයුතු ආරම්භ කිරීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය. ඔහු දැනට ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සභාපතිවරයා ලෙසත් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකයකු ලෙසත් කටයුතු කරයි. මීට පෙර ඒ මහතා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස මෙන්ම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකයකු ලෙස ද කටයුතු කර ඇත. මුදල් ප්‍රතිපත්ති සහ අනෙකුත් මහ බැංකුකරණ තේමාවන් ඔස්සේ ආචාර්ය අමරසේකර මහතා විසින් සිදු කරන ලද පර්යේෂණ, ජාත්‍යන්තර සහ දේශීය සඟරා රැසක පළ වී ඇති අතර ඒවා පුළුල් ලෙස පිළිගැනීමට හා උපුටා දැක්වීමට ලක්ව ඇත. ඔහු 2015-2020 කාලය තුළ මහ බැංකුවේ "Staff Studies" හි සංස්කාරක ලෙස කටයුතු කළේය. විවිධ විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, බැංකු අධ්‍යයන කේන්ද්‍ර සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය ඇතුළු විවිධ අධ්‍යයන හා වෘත්තීය ආයතනවල ආරාධිත කථිකයකු, පරීක්ෂකවරයකු සහ ප්‍රශ්න විචාරකයකු ලෙස ඔහු ස්වේච්ඡාවෙන් දායක වී ඇත.

ආචාර්ය අමරසේකර මහතා එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් සහ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇත. ඔහු නීතිඥවරයකු ද වේ.



## කේ.ඒ.පී. ද සිල්වා මහත්මිය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ පන්තියේ නිලධාරිනියක වන අරවින්දි ද සිල්වා මහත්මිය, දැනට වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙස සහ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ලෙස රාජකාරී කරනු ලබයි.

ඇය 1995 වර්ෂයේදී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බැඳී ඇති අතර විදේශ කටයුතු අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය වැනි ප්‍රධාන අමාත්‍යාංශ කිහිපයකම සේවය කර ඇත.

ඇය සිය ප්‍රථම උපාධි සුදුසුකම කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය සඳහා දෙවන පෙළ සාමාර්ථයක් සහිතව ලබා ගත්තාය.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ද කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ගෙන ඇත.

ඇය ශ්‍රී ලංකා වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකාවකි.



## ආර්.සී. කෝට්ටේ හේවා මහතා

ආර්සී ඇසෝසියේට්ස් (වරලත් ගණකාධිකාරී) ආයතනයේ හවුල්කරුවෙකු ලෙස කටයුතු කරන රුවන් චන්ද්‍රික කෝට්ටේ හේවා මහතා, ගණකාධිකරණය, කළමනාකරණ උපදේශනය සහ උපායමාර්ගික උපදේශන සේවා පිළිබඳ දශක දෙකකට වැඩි පළපුරුද්දක් සහ මනා නිපුනතාවක් ඇති අයෙකි. ශ්‍රී ලංකා අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයේ හිටපු හවුල්කරුවෙකු ලෙස කටයුතු කිරීම ඇතුළුව ප්‍රමුඛ පෙළේ තනතුරු රැසක් හොබවා ඇති කෝට්ටේ හේවා මහතා, දේශීය මෙන්ම ජාත්‍යන්තර ව්‍යාපාරික ක්ෂේත්‍ර පිළිබඳ ඇති මනා අවබෝධය සහ ඔහුගේ නායකත්වය හේතුවෙන් සුවිශේෂී කීර්තිනාමයක් දිනා සිටියි.

කෝට්ටේ හේවා මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ. මීට අමතරව, ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පිළිගත් සාමාජිකයෙකු වන අතර එමගින් කළමනාකරණ ගණකාධිකරණය සහ මූල්‍ය උපාය මාර්ග පිළිබඳ ඔහුගේ උසස් විශේෂඥතාව පිළිඹිබු වේ.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් සහ ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් (දෙවන පෙළ සාමාර්ථයක් සහිත) ලබා ඇති අතර එය ඔහුගේ පුළුල් ගණකාධිකරණ සහ කළමනාකරණ උපදේශන වෘත්තීය ජීවිතය සඳහා ශක්තිමත් ශාස්ත්‍රීය පදනමක් විය.

2002 මැයි මාසයේ සිට වසර 23කට වැඩි පළපුරුද්දක් ඇති කෝට්ටේ හේවා මහතා, විවිධ ක්ෂේත්‍රයන් පුරා ඉහළ මට්ටමේ උපදේශන සේවාවන් සැපයීම සම්බන්ධයෙන් විශේෂඥතාවක් ලබා ඇති අතර ආයතනවල මූල්‍ය කාර්යසාධනය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ උපායමාර්ගික දිශානතිය ඉහළ නැංවීම සඳහා සිය කැපවීම පෙන්නුම් කර ඇත.

කෝට්ටේ හේවා මහතාගේ වෘත්තීය ජීවිතය තුළ බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයන්හි සිදුකළ කාර්යභාරය විශේෂයෙන් කැපී පෙනෙන අතර එහිදී ඔහු ජාතික හා ප්‍රාදේශීය මූල්‍ය ආයතන වෙත පුළුල් සහයෝගයක් ලබා දී ඇත. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ සහ හොංකොංහි අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයේ සේවය කළ කාලය තුළ සම්පත් හුවමාරු වැඩසටහනේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ අතර එහිදී ඔහු විගණන ක්ෂේත්‍රයේ තම ජාත්‍යන්තර අත්දැකීම් ශක්තිමත් කර ගැනීම අරමුණු කරගත් ඉහළ මට්ටමේ මුලපිරීම් කිහිපයක් සඳහා දායක විය.

රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරමින්, අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයේ දකුණු පළාත් මෙහෙයුම් කටයුතු සිදු කරගෙන යෑම ඔහුගේ සුවිශේෂී දායකත්වයන්ගෙන් එකකි. ග්‍රාමීය සහ පහසුකම් අවම ප්‍රජාවන්ට සේවය කරන මූල්‍ය ආයතන සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීමට නායකත්වය ලබා දීම ද මීට ඇතුළත් විය. දකුණු පළාත තුළ ඔහු කළ සේවය විවිධ සංවර්ධන බැංකුවල ගමන් මග හැඩගැස්වීමට මෙන්ම, එම බැංකු මූල්‍යමය වශයෙන් ස්ථාවරව සහ සිය ප්‍රජාවන්ට සේවය කිරීමට සුදුසු මට්ටමක පවත්වා ගැනීමට දිගුකාලීන බලපෑමක් ඇති කළේය.

කෝට්ටේ හේවා මහතාට ව්‍යවස්ථාපිත විගණන, විශේෂයෙන්ම බැංකු සහ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයන්හි විශාල අත්දැකීම් සම්භාරයක් ඇත. විශේෂයෙන්ම, ඔහු ඌව සංවර්ධන බැංකුව, වයඹ සංවර්ධන බැංකුව, සබරගමුව සංවර්ධන බැංකුව සහ රුහුණ සංවර්ධන

බැංකුව ඇතුළු ප්‍රාදේශීය සංවර්ධන බැංකු කිහිපයකම විගණන කටයුතු සඳහා සෘජුවම සම්බන්ධ විය. මේ සෑම බැංකුවකටම ශාඛා 40කට වඩා ඇති අතර ඒවා රට පුරා සැලකිය යුතු නියෝජනයක් සිදු කරයි. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කිහිපයක් ඒකාබද්ධ කිරීමෙන් පිහිටුවන ලද මෙම බැංකුවල අභ්‍යන්තර මූල්‍ය භාවිතයන් වැඩිදියුණු කරමින්, ඒවා ශ්‍රී ලංකාවේ නියාමන ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම කොට්ටේ හේවා මහතාගේ මුල්කාලීන වෘත්තීය ජීවිතයේ ප්‍රධාන කාර්යයක් විය.

මීට අමතරව, කෝට්ටේ හේවා මහතා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින දිවි නැගුම බැංකු සහ සමාජ ආරක්ෂණ භාර අරමුදල් විගණන ඇතුළු ආයතන කිහිපයක විගණන කටයුතු රටම ආවරණය වන පරිදි අධීක්ෂණය කර ඇත. එහිදී මහ බැංකු වාර්තා සවිස්තරාත්මකව සමාලෝචනය කිරීම, වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ කළමනාකාරීත්වය සඳහා ප්‍රායෝගික නිර්දේශ ලබා දීම ඔහුගේ භූමිකාවට ඇතුළත් විය. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව සහ හවුල්කාරීත්ව මට්ටම්වල කෝට්ටේ හේවා මහතා සතු පුළුල් පළපුරුද්ද හේතුවෙන් බැංකු ක්ෂේත්‍රයේ විගණන කටයුතු සිදු කිරීමේ දී සහ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ සේවාදායකයින්ට බදු උපදේශන සේවා සැපයීමේදී ඔහු අගනා සම්පතක් බවට පත් වී ඇත.

ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණය කෝට්ටේ හේවා මහතාගේ ප්‍රධාන විශේෂඥතාව දක්වන ක්ෂේත්‍රයකි. ප්‍රාදේශීය සංවර්ධන බැංකු හයක් ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඔහු ප්‍රධාන භූමිකාවක් ඉටු කළ අතර එහිදී තොරතුරු සංදේශ සකස් කිරීම, කළමනාකරණ හැකියාවන් විශ්ලේෂණය කිරීම, මූල්‍ය පුරෝකථන සකස් කිරීම සහ විස්තීර්ණ ව්‍යාපාර අගය කිරීම් සිදු කිරීම ඔහුගේ අධීක්ෂණය යටතේ සිදුවිය. මෙම මූල්‍ය ආයතන නවීන මූල්‍ය රෙගුලාසි සහ ව්‍යාපාරික භාවිතයන්ට අනුකූලව පෙළගැස්වීම සඳහා මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ පැවරුම් බෙහෙවින් ඉවහල් වූ අතර එමගින් ඒවාට තරඟකාරීත්වයට මුහුණ දෙමින් තිරසාර ලෙස පැවතීමට අවස්ථාව සැලසුණි.

උපායමාර්ගික නායකත්වය සහ සිය සේවාදායකයින්ගේ මූල්‍ය හා මෙහෙයුම් ස්ථාවරත්වය ඉහළ නැංවීම සඳහා වූ දැඩි කැපවීම තුළින් කෝට්ටේ හේවා මහතා ගණකාධිකරණ සහ උපදේශන ක්ෂේත්‍රයේ පෙරමුණේම පසුවෙයි. බැංකු විගණනය, කළමනාකරණ උපදේශනය, බදු උපදේශනය සහ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ඔහුගේ පුළුල් පසුබිම, ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා ඔහු තුළ ඇති උනන්දුව සමග මුසුවී ශ්‍රී ලංකාවේ සහ ඉන් ඔබ්බෙහි ව්‍යාපාරික ක්ෂේත්‍රය කෙරෙහි අඛණ්ඩව සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.



## ජී.ඒ.එස්. ජයරත්න මහතා

ජී. ඒ. සුනිල් ජයරත්න මහතා යනු නඩු කටයුතු, නීති උපදේශනය, නීතිය සහ මානව හිමිකම් අධ්‍යාපනය, නීති ප්‍රතිසංස්කරණ මෙන්ම සමාජ සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි වසර 36 කට අධික විශිෂ්ට පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ නීති උපදේශකයෙකි. ඔහු සිවිල්, අපරාධ, වාණිජ, කාර්මික සහ කෘෂිකාර්මික නීතිමය ආරවුල්වලට අදාළ පුළුල් පරාසයක නඩු කටයුතු මෙහෙයවමින් කොළඹ පිහිටි ඉහළම අධිකරණ මෙන්ම ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති මූලික අධිකරණ සහ ප්‍රාදේශීය විනිශ්චය සභාවන් ඉදිරියේ පෙනී සිට ඇත. ඔහු නීති උපදේශනය, වෘත්තීය නියෝජනය සහ නඩු කටයුතු සඳහා පෙනී සිටීම වෙනුවෙන් දේශීය හා විදේශීය සේවාදායකයින්ට මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවලටද සිය සේවය සපයා ඇත. ඔහුගේ අධ්‍යාපනික පසුබිම පිළිබඳ සලකා බැලීමේදී, ජයරත්න මහතා සිය ද්විතීයික අධ්‍යාපනය ගාල්ල මහින්ද විද්‍යාලයෙන් නිම කර ඇති අතර පසුව 1984 වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් ලබා ගත්තේය. ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිඥවරයෙකු ලෙස සුදුසුකම් ලැබූ ඒ මහතා පසුව 2005 වසරේදී මෙල්බර්න්හි ඩීකින් විශ්වවිද්‍යාලයෙන් නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක්ද 2015 වසරේදී කොළඹ විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධියක්ද ලබා ගත්තේය. මීට අමතරව, ඔහු 2002 වසරේදී ප්‍රංශයේ ස්ට්‍රාස්බර්ග්හි පිහිටි ජාත්‍යන්තර මානව හිමිකම් ආයතනයෙන් මානව හිමිකම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක්ද සාර්ථකව නිම කර ඇත.

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සහකාර කථිකාචාර්යවරයෙකු සහ පුහුණුකරුවෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ජයරත්න මහතා, පසුව මාතර නීතිඥ සංගමයට සම්බන්ධ අතර එහිදී ඔහු යුක්තිය පතා පැමිණි පීඩිත ප්‍රජාවන් වෙනුවෙන් ප්‍රශංසනීය අයුරින් නීති ආධාර සේවාවන් රැසක් සපයා ඇත. ඔහුගේ නායකත්වය සහ දායකත්වය හේතුවෙන් 2005 වසරේදී ඔහු මාතර නීතිඥ සංගමයේ සභාපතිවරයා ලෙස තේරී පත් වූ අතර එම ධූර කාලය තුළ සුනාමි ව්‍යසනයෙන් පීඩාවට පත් පුරවැසියන් සඳහා නීතිමය සහන සැලසීමේ කටයුතු ඔහු විසින් කැපී පෙනෙන අයුරින් සම්බන්ධීකරණය කරන ලදී. එම වසරේදීම ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කලාපීය උප සභාපතිවරයා ලෙස පත් වූ ඒ මහතා මානව හිමිකම්, නීති ආධාර, නීති අධ්‍යාපනයේ අනාගතය සහ නඩු ප්‍රමාදයන් පිළිබඳ කාරක සභාවල කටයුතු කළේය. එලෙසම, ඔහු මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාරක සභාවේ ද සේවය කළ අතර රට තුළ පැවති කැළඹිලිසහගත කාලවකවානුවලදී අන්තර් වාර්ගික සුහදතාවය සහ සමගිය වර්ධනය කිරීම සඳහා සිය සේවය කැප කළේය. ශ්‍රී ලංකා ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් කාරක සභාවේ ද සාමාජිකයෙකු ලෙස කටයුතු කළ ඔහු, ළමා අයිතිවාසිකම් පිළිබඳ අධ්‍යාපනය සඳහා දායක විය. විවිධ විදේශීය අධිකරණ බල ප්‍රදේශයන්හි තමන් ලැබූ පුළුල් අත්දැකීම් සම්භාරය සහ නීතිඥ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කළ සේවය උපයෝගී කර ගනිමින් නඩු ප්‍රමාදයන් අවම කිරීම සඳහා වඩාත් ඵලදායී අධිකරණ පද්ධතියක් උදෙසා ප්‍රතිසංස්කරණ යෝජනා කරමින් ඔහු අධිකරණ අමාත්‍යාංශය වෙත සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කළේය. ඔහුගේ වෘත්තීය නීති පුහුණුවට සහ ආයතනික නායකත්වයට අමතරව, ජයරත්න මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ නීති ප්‍රතිසංස්කරණ සඳහා ද සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විසි දෙනෙකුගෙන් යුත් කමිටුවේ සාමාජිකයෙකු ලෙස

ඔහු 2016 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුවේ (සේවය කළේය. 2017 වසරේදී, ගෝලීය ප්‍රවණතාවලට අනුකූල වන පරිදි සමුපකාර නීති ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනා සකස් කිරීම වෙනුවෙන් සමුපකාර හා වෙළඳ කටයුතු අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුවේ ද ඔහු කටයුතු කළේය.

ඔහුගේ ක්ෂේත්‍ර ප්‍රවීණත්වය ජාත්‍යන්තර වශයෙන් ද ඇගයීමට ලක්ව ඇත. ඒ මහතා 2000 වසරේදී ඇමරිකා එක්සත් ජනපදයේ මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර 2017 වසරේදී මියන්මාරයේ යැංගුන් නුවර පැවැති වටමේස සාකච්ඡාවකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ විශේෂඥයෙකු ලෙස සහභාගී විය. ඔහුගේ ප්‍රවීණත්වය සහ දායකත්වය අගය කරමින්, 2017 වසරේදී හොංකොංහි ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඔහු වෙත පර්යේෂණ උපාධි ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.

සිය නීතිමය කටයුතු සහ ප්‍රතිසංස්කරණ මුලපිරීම්වලට සමගාමීව, ජයරත්න මහතා නීති අධ්‍යාපනය සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රය වෙනුවෙන් ද සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. ඔහු 1998 සිට 2012 වසර දක්වා රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස කාර්මික, වාණිජ, ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂීය නීතිය පිළිබඳව ඉගැන්වීය. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පරීක්ෂකවරයෙකු ලෙසත් ඩීකින් විශ්වවිද්‍යාලයේ උපකාරක ගුරුවරයෙකු ලෙසත් කටයුතු කර ඇත. නීති ක්ෂේත්‍රයේ බහුශ්‍රැත විද්වතෙකු වන ඔහු නීතිය, දර්ශනවාදය, ආගම සහ දේශපාලනය යන මාතෘකා ඔස්සේ නීතිමය සහ විශ්වවිද්‍යාලයීය සඟරා සඳහා පර්යේෂණ ලිපි පළ කර ඇති අතර වෘත්තීය සහ ශාස්ත්‍රීය සංසද රැසක ප්‍රධාන දේශන ද පවත්වා ඇත. මෑත වසරවලදී, ඔහු ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ "රුහුණු සේවය" සඳහා උපදේශකයෙකු ලෙස කටයුතු කරමින් විකාශන මාධ්‍ය ඔස්සේ නීතිය සහ මානව හිමිකම් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට දායක විය.

ඔහු සිය නීතිමය පුහුණුව මෙන්ම ශාස්ත්‍රීය දායකත්වය හරහා නීතිමය දැනුම වර්ධනය කිරීමටත් නීති ප්‍රතිසංස්කරණ සඳහා සහය වීමටත් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමටත් අඛණ්ඩව කැපවී සිටියි. ඔහු අධ්‍යාපන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයකම පාලක මණ්ඩලවල සේවය කර ඇති අතර දෙවන වරටත් රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභා සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු තම පරාර්ථකාමී සේවාවන් තුළින් සමස්ත රටට සහ සමාජයට සේවය කරන, යුතුකම් ඉටු කරන පුරවැසියෙකි.



## එස්. වෛද්‍යරත්න මහතා

මාතර දී උපත ලැබූ සුධර්මන් වෛද්‍යරත්න මහතා සිය ප්‍රාථමික අධ්‍යාපනය ශාන්ත සර්වේශස් විද්‍යාලයෙන් ද ද්විතීයික අධ්‍යාපනය ශාන්ත තෝමස් විද්‍යාලයෙන් ද ලබා ගත්තේය.

1978 සිට 1981 දක්වා කාලය තුළ ඔහු පාසල් ශිෂ්‍ය නායක මණ්ඩලයේ සාමාජිකයෙකු වූ අතර ජ්‍යෙෂ්ඨ ක්‍රිකට් කණ්ඩායම සහ කනිෂ්ඨ පාපන්දු කණ්ඩායම නියෝජනය කළ පාසල් වර්ණලාභියෙකු ද විය.

ඉංග්‍රීසි ගුරුවරුන් බඳවා ගැනීම සඳහා පැවැත්වුණු තරඟ විභාගයෙන් ජාතික මට්ටමේ ඉහළම ප්‍රතිඵල ලබා ගැනීමෙන් අනතුරුව සුධර්මන් වෛද්‍යරත්න මහතා 1985 වසරේදී සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. කහටරුප්ප මහා විද්‍යාලයේ සහ කැන්දගොල්ල මහා විද්‍යාලයේ වසර තුනක් සේවය කිරීමෙන් පසු සහ 1987-1989 කාලය තුළ වෘත්තීය ගුරු පුහුණුව නිම කිරීමෙන් පසු, 1989 අගභාගයේදී ඔහුව තල්පාවිල මධ්‍ය මහා විද්‍යාලය වෙත මාරු කර යවන ලදී. 1993 වසරේදී රන්ටැඹේ-රන්දෙනිගල ශිෂ්‍යභට නිලධාරී පුහුණු මධ්‍යස්ථානයෙන් පුහුණුව ලැබීමෙන් පසු ඔහු ශිෂ්‍යභට නිලධාරියෙකු ලෙස නැවත තල්පාවිල මධ්‍ය මහා විද්‍යාලය වෙත පැමිණි අතර එහිදී එම පාසලේ ප්‍රථම ශිෂ්‍යභට ප්ලැටූනය පිහිටුවීමට කටයුතු කළේය.

1999 වසරේදී පැවැත්වුණු විදුහල්පති සේවය සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් විශිෂ්ට සාමාර්ථයක් ලබා ගනිමින් අධ්‍යාපන පරිපාලන සේවයට ඇතුළත් වූ ඔහු, 2001 වසරේදී ශාරිපුත්‍ර මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරයා ලෙස රාජකාරි ආරම්භ කළේය. 2002 වසරේදී ඔහු විසින් සැලසුම් කර ක්‍රියාවට නැංවූ සුවිශේෂී ව්‍යාපෘතියක් හේතුවෙන් ශ්‍රී ලංකාවේ හොඳම නවෝද්‍යා පාසල් 22 අතරට තේරී පත්වීමට මෙම පාසලට හැකි වූ අතර මාතර දිස්ත්‍රික්කයේ එම කාණ්ඩයේ හොඳම පාසල ලෙස ද එය ඇගයීමට ලක් විය.

2002-2003 කාලය තුළ ඔහු රුහුණ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ඉංග්‍රීසි භාෂා අංශයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කළේය. 2005 වසරේ අගභාගයේ දී සිය වෘත්තීය මග වෙනස් කළ ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අකුරැස්ස ශාඛාවේ අලෙවි කළමනාකරු ලෙස සම්බන්ධ වෙමින් රක්ෂණ ක්ෂේත්‍රයට අවතීර්ණ විය. 2006 වසරේ දී එම ශාඛාව සාමාන්‍ය රක්ෂණ කාණ්ඩය යටතේ දිවයිනේ දෙවන හොඳම ශාඛාව ලෙස සම්මානයට පාත්‍ර වූ අතර ඔහු හොඳම කළමනාකරු ලෙස ද ඇගයීමට ලක් විය. එම වසරේදීම ඔහු LIMRA International ආයතනය විසින් මෙහෙයවන ලද "වෘත්තීය නිපුණතා සංවර්ධනය සහ ධාරිතා වර්ධනය" පිළිබඳ නේවාසික පුහුණුවක් ද සාර්ථකව නිම කළේය.

2007 වසරේදී ඔහුව දෙනියාය ශාඛාව වෙත මාරු කර යවන ලද අතර 2009 වසරේදී එම ශාඛාව ජීවිත රක්ෂණ අංශයේ 'ඊ' කාණ්ඩයේ හොඳම ශාඛාව ලෙස සම්මාන දිනා ගත්තේය. එහිදී ඔහු දිවයිනේ හොඳම අලෙවි කළමනාකරු ලෙස ද ඇගයීමට ලක් විය.

මීට අමතරව, ඔහුගේ මෙම දක්ෂතාවය අගය කරමින් චීනයේ අධ්‍යයන සංචාරයක් සඳහා ද අවස්ථාව හිමි වූ අතර ඔහුගේ ජයග්‍රහණ සැලකිල්ලට ගනිමින් ඔහුව ජ්‍යෙෂ්ඨ අලෙවි කළමනාකරු තනතුර දක්වා උසස් කරනු ලැබීය.

2010 වසරේදී ඔහු ජ්‍යෙෂ්ඨ අලෙවි කළමනාකරු ලෙස උසස්වීමක් ලබා දී ගාල්ල ප්‍රාදේශීය ශාඛාවට පත් කරනු ලැබීය. ඔහුගේ නායකත්වය යටතේ ව්‍යාපාර සංවර්ධන කාර්යසාධනය අතින් දිවයිනේ ප්‍රමුඛතම ශාඛා අතර දෙවන සහ තුන්වන ස්ථාන දිනා ගනිමින් එම ශාඛාව 2012, 2013, 2015 සහ 2016 යන වසරවලදී අඛණ්ඩව සම්මානයට පාත්‍ර විය.

2012 -2013 කාලසීමාව තුළදී ඔහු කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් ලබා ගත්තේය. ව්‍යාපාර සංවර්ධනය සහ පුහුණු ක්‍රමවේදයන් සම්බන්ධයෙන් ඔහු දැක්වූ දක්ෂතා අගය කරමින් 2018 වසරේදී ඔහුව ප්‍රාදේශීය කළමනාකරු ලෙස උසස් කර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වයඹ පළාත් කළමනාකරු ලෙස පත් කරන ලදී.

2020 වසර අගභාගයේදී ඔහු නැවත වරක් උසස්වීම් ලබා, ‘සුරක්ෂා’ සිසු රක්ෂණ අංශයේ විශේෂ ව්‍යාපෘති ප්‍රධානී ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සම්බන්ධ විය. ඔහු 2021 වසරේ අගභාගයේදී විශ්‍රාම ලැබීය.

2024 වසරේ සිට 2025 දෙසැම්බර් දක්වා ඔහු දකුණු පළාත් ආණ්ඩුකාරවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කළේය.

2025 වසර මුල් භාගයේ සිට ඔහු රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

වර්තමානයේදී ඔහු දකුණු පළාත් ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික ලේකම්වරයා ලෙස සේවය කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම



**දමයන්ති ප්‍රනාන්දු මහත්මිය**
(අධ්‍යක්ෂ ජනරාල්)



**සතීෂ් කුමාර් මහතා**
(අධ්‍යක්ෂ මූල්‍ය)



**ප්‍රභාෂිණී සමරකෝන් මහත්මිය**
(අධ්‍යක්ෂ විමර්ශන)



**දීපිකා නවරත්න මහත්මිය**
(අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)



**රාජන් නිරූබසිංහම් මහතා**
(අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)



**චමරි හීනටිගල මහත්මිය**
(අධ්‍යක්ෂ වෙළඳපොළ අතරමැදි බලපත්‍ර සහ අධීක්ෂණය)



**ලසන්ති තොටහේවා මහත්මිය**
(අධ්‍යක්ෂ පරිපාලන)



**බිම්සර විජේසිංහ මහතා**
(සහකාර අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)



**ඩිරල් ප්‍රනාන්දු මහතා**
(සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ)



**මලිති අම්බලන්ගොඩ මෙනවිය**
(සහකාර අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)



**උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය**
(සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)



**ශ්‍යාමලී අත්තනායක මහත්මිය**
(සහකාර අධ්‍යක්ෂ ආයුගණක අධීක්ෂණ)



**තුෂාරි විජේගුණවර්ධන මහත්මිය**
(සහකාර අධ්‍යක්ෂ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ථවාදය වෙනුවෙන් මුදල් සැපයීම වැලැක්වීම)



**රවීන්ද්‍ර හෙට්ටිආරච්චි මහතා**
(සහකාර අධ්‍යක්ෂ වෙළඳපොළ අතරමැදි බලපත්‍ර සහ අධීක්ෂණ)



**චතුරි ගුණවර්ධන මෙනවිය**
(සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)



**එරන්ද විතානගේ මහතා**
(සහකාර අධ්‍යක්ෂ මූල්‍ය)



**තුමලි කොටුගොඩ මහත්මිය**
(සහකාර අධ්‍යක්ෂ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ)

# කාර්ය මණ්ඩලය



ඩෙසිකා රත්නායක මහත්මිය



කෝකිලා සිරිවර්ධන මහත්මිය



චරිත වික්‍රමසිංහ මහතා



පවිත්‍රා පුංචිහේවා මහත්මිය



අනුෂ්ක බණ්ඩාර මහතා



සඳමාලි කරුණාතිස්ස මහත්මිය



පාරමී මුණසිංහ මෙනවිය



උපේක්ෂා ලියනගේ මෙනවිය



නිසල් කරුණාරත්න මහතා



නුවන් සුදර්ශණ
මහතා



රුවනි මල්දෙනිය
මෙනවිය



සචිනි ගුණරත්න
මෙනවිය



චාමර ප්‍රේමරත්න මහතා



සචී ගොඩවෙල මහත්මිය



කාංචනා දිල්රුක්ෂි
මහත්මිය



නදීශානි කළුගම්පිටිය
මෙනවිය



සුභාෂ් සිල්වා පුල්ලේ
මහතා



තිරුණි හිරන්යා මෙනවිය



නදීශාන් සමරකෝන්
මෙනවිය



හිරුණි වික්‍රමආරච්චි
මහත්මිය



තමාලි අමරකෝන්
මෙනවිය



ප්‍රබෝධිනී පුෂ්පමාලි
මහත්මිය



පියුමි නෙළුනිකා මහත්මිය



දෙනුෂිකා විජේනායක
මහත්මිය



ගයනි විටෝරියා
මහත්මිය



රුවිනි රාජකරුණා
මෙනවිය



ආචාර්ය ලිලන්ක ද සිල්වා



නවෝද්‍යා කුමාරරත්න මහත්මිය



හසංක රත්නසිරි මහතා



මලින් පෙරේරා මහතා



ලක්මා සතරසිංහ මෙනවිය



මන්තිල විජේරත්න මහතා



එතිරාජ් ශ්‍රීකාන්තන් මහතා



සුජීවා රණසිංහ මහත්මිය



ඩී.ඩබ්ලිව්.එස්.එස්. සුපුලි මහත්මිය



චන්දිමා කඹුරුගමුව මහත්මිය


මල්හාරි වික්‍රමසිංහ මහත්මිය


හර්ෂණී පෙරේරා මහත්මිය


තිසලි අලුත්ගේ මෙනවිය


නිශාදි පෙරේරා මහත්මිය


වීණා සෙනෙවිරත්න මහත්මිය


සඳුන් ප්‍රනාන්දු මහතා


මහේල හිරුෂාන් මහතා


සමන් සේනාධීර මහතා


සනත් උදයංග මහතා



නලීන් තලගල මහතා



චමින්ද කුමාර මහතා



පසිඳු ලක්ෂාන් මහතා
(ආධුනික)



නිත්‍යා සෙව්මිණි
මෙනවිය
(ආධුනික)

# පොදු සමාලෝචනය

## පනත සහ නියාමන ප්‍රතිසංකරණ පරිපාලනය කිරීම

### නීති සම්පාදනය

රක්ෂණ කොමිෂන් සභාවේ (මින් මතු "කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙතැන් සිට "පනත" ලෙස හැඳින්වේ) මගින් රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ නියෝජිතයින් සහ පාඩු ගැලපුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා අදාළ නීතිමය රාමුව සපයයි.

2007 අංක 27, 2011 අංක 3 සහ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් මගින් එම පනත සංශෝධනය කර ඇත.

### අනු නීති සම්පාදනය

වර්ෂය තුළ පනත යටතේ සම්පාදනය කරන ලද අනු නීති, නියාමන ප්‍රතිසංස්කරණ යටතේ පහතින් විස්තර කෙරේ.

### නියාමන ප්‍රතිසංස්කරණ

#### රීති

2025 වර්ෂය තුළ කිසිදු නව රීතියක් ප්‍රකාශයට පත් කර නොමැත.

#### පනතේ 96A වගන්තිය යටතේ වර්ෂය තුළ නිකුත් කරන ලද විධානයන්

1. **2025 අංක 01 දරන විධානය - දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ අවශ්‍යතා තක්සේරු කිරීම සහ පාරිභෝගිකයින් ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ විධානය**

   දිගු කාලීන රක්ෂණ සමාගම්වල පාරිභෝගිකයින් ඇතුළත් කරගැනීමේ ක්‍රියාවලිය සහ පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව තක්සේරු කිරීම සඳහා ප්‍රමිති සැකසීම මගින් අවශ්‍යතා මත පදනම් වූ රක්ෂණ නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කරන රාමුවක් ස්ථාපිත කිරීම සඳහා මෙම විධානය 2025 අප්‍රේල් 25 දින සියලුම දිගු කාලීන රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී. මෙම විධානය 2025 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වේ.

2. **2025 අංක 02 දරන විධානය - රක්ෂණ ඔප්පු හිමියන්ගේ විශ්වාසනීයත්ව මට්ටම ඉහළ නැංවීම පිළිබඳ විධානය**

   සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම, පාරිභෝගික අසතුට අවම කිරීම සහ විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුත් හැසිරීම් දිරිමත් කිරීම සඳහා වන හොඳම භාවිතයන් හඳුන්වා දීම මගින් රක්ෂණ ඔප්පු හිමියන් අතර ඉහළ විශ්වාසනීයත්වයක් ඇති කිරීම සඳහා මෙම විධානය රක්ෂණකරුවන් වෙත නිකුත් කරන ලදී. මෙම විධානය 2025 අප්‍රේල් 25 දින නිකුත් කරන ලද අතර එය වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ වේ.

3. **2025 අංක 03 දරන විධානය - රක්ෂණ තැරැව්කරුවන් විසින් අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූල වීම පිළිබඳ විධානය**

   ප්‍රතිරක්ෂණ තැරැව්කාර ව්‍යාපාර සිදු කරන්නේද නැද්ද යන්න මත පදනම්ව රක්ෂණ තැරැව්කරුවන්ට අදාළ වන අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය සංශෝධනය කිරීම සඳහා 2019 ජූලි 24 දින නිකුත් කරන ලද අංක 19 දරන නියෝගය සහ 2020 ජූනි 3 දින නිකුත් කරන ලද අංක 19 (සංශෝධිත) විධානය සංශෝධනය කරමින් මෙම නියෝගය නිකුත් කරන ලදී. මෙම නියෝගය වහාම ක්‍රියාත්මක විය.

4. **2025 අංක 04 දරන විධානය - රක්ෂණ සමාගම් සහ රක්ෂණ අතරමැදියන් විසින් රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය නිකුත් කිරීම පිළිබඳ විධානය**

   විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම, අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ රක්ෂණ ඔප්පු පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන් සවිබල ගැන්වීම සඳහා මෙම නියෝගය 2025 ඔක්තෝබර් 28 දින නිකුත් කරන ලදී. එය දැනට පවතින සියලුම පුද්ගලික අංශයේ සහ වාණිජ අංශයේ රක්ෂණ නිෂ්පාදන සඳහා 2025 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වේ. සියලුම නව පුද්ගලික සහ වාණිජමය රක්ෂණ නිෂ්පාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීමෙන් පසුව ඒවා සඳහා මෙය වහාම අදාළ වේ.

5. **2025 අංක 05 දරන විධානය - සියලුම වර්ගයේ වාරික ගාස්තු සහ වෙනත් ඕනෑම ඔප්පු ගාස්තුවක් වෙන් වෙන් වශයෙන් අනාවරණය කිරීම සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදයට අදාළ රක්ෂණාවරණ අවශ්‍යතාවලට අනුකූල කිරීම සහ වීම පිළිබඳ විධානය**

   මූලික වාරිකය, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදයට අදාළ රක්ෂණ වාරිකය, අතිරේක ආවරණ/අනුමත කිරීම් සඳහා වන වාරික සහ ඔප්පුවට අදාළ අනෙකුත් සියලුම වර්ගයේ ඔප්පු ගාස්තු (ස්ථාවර සහ විචල්‍ය ගාස්තු ඇතුළුව) රක්ෂණ ඔප්පු හිමියන්ට සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන් වෙත නිකුත් කරනු ලබන මිල ගණන්, ඔප්පු ලේඛන, අනුමත කිරීම්, ඉන්වොයිසි, හර පත්, අලුත් කිරීමේ නිවේදන සහ ගෙවිය යුතු මුදල පිළිබිඹු වන පරිදි රක්ෂණ ඔප්පු හිමියාට නිකුත් කරන වෙනත් ඕනෑම අදාළ ලේඛනයක වෙන් වෙන් වශයෙන් අනාවරණය කරන ලෙස සාමාන්‍ය රක්ෂණකරුවන්ට උපදෙස් දෙමින් මෙම විධානය 2025 දෙසැම්බර් 05 දින නිකුත් කරන ලදී. රක්ෂණ ඔප්පු හිමියා විසින් වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදයට අදාළ රක්ෂණය හෝ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබලවලට අදාළ රක්ෂණාවරණය පමණක් ඉල්ලා නොමැති අවස්ථාවක, අදාළ වාරික අගයන් ශූන්‍ය ලෙස දැක්විය යුතුය. මෙම විධානය 2025 දෙසැම්බර් 05 දින සිට බලාත්මක විය.

6. **2025 අංක 06 දරන විධානය - ගංවතුර සහ 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් රක්ෂිත ජනතාව මුහුණ දුන් ව්‍යසනකාරී සිදුවීම් සම්බන්ධයෙන් සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් ගත යුතු ක්ෂණික ක්‍රියාමාර්ග පිළිබඳ විධානය**

   'දිට්වා' සුළි කුණාටුව සහ ඒ හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්වය සැලකිල්ලට ගනිමින් සහ රක්ෂණකරුවන් තමන්ට සිදුවී ඇති පාඩුවේ ප්‍රමාණය තවමත් සම්පූර්ණයෙන් තක්සේරු කර නොමැති බව සලකා බලා, දැනටමත් ප්‍රකාශයට පත් කර හෝ බෙදා හැර නොමැති 2024 සහ 2025 මූල්‍ය වර්ෂ සඳහා වන කිසිදු ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීමෙන් හෝ බෙදා හැරීමෙන් වළකින ලෙස සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම්වලට උපදෙස් දෙමින් මෙම නියෝගය 2025 දෙසැම්බර් 08 දින නිකුත් කරන ලදී. මෙම නියෝගය 2025 දෙසැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වූ අතර එය 2026 ජූනි 30 දක්වා බලාත්මකව පවතිනු ඇත.

## වර්ෂය තුළ නිකුත් කරන ලද චක්‍රලේඛ

1. **2025 අංක 01 දරන චක්‍රලේඛය - මෝටර් රථ අනතුරුවලට ලක්වන තුන්වන පාර්ශවීය වින්දිතයින්ගේ මරණය හෝ ස්ථිර අබාධිත තත්ත්වයන් සඳහා වන විකල්ප වන්දි ක්‍රමය**

   මෙම විකල්ප වන්දි ක්‍රමය මෝටර් රථ අනතුරුවලට ලක්වන තුන්වන පාර්ශවීය වින්දිතයින් සඳහා ලබා ගත හැකි අතර එය පොදු රක්ෂණ සමාගම් විසින් කිසිදු නීතිමය වගකීමක් පිළිගැනීමකින් තොරව සහ පාරිතෝෂික පදනමක් මත ගෙවනු ලැබේ. 2025 සැප්තැම්බර් 01 දින නිකුත් කරන ලද මෙම චක්‍රලේඛය, 2025 සැප්තැම්බර් 01 දින සිට සිදුවන මෝටර් රථ අනතුරු සඳහා අදාළ වේ. ඒ අනුව, 2024 පෙබරවාරි 26 දිනැති 2024 අංක 03 දරන චක්‍රලේඛයේ දක්වා ඇති නිර්ණායක, 2024 මාර්තු 01 සිට 2025 අගෝස්තු 31 දක්වා කාලය තුළ සිදු වූ මෝටර් රථ අනතුරු සඳහා අදාළ වනු ඇත.

2. **2025 අංක 02 දරන චක්‍රලේඛය - මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මර්දනය කිරීමට අදාළ වගකීම් පැහැර හැරීම් සඳහා බලාත්මක කිරීමේ ක්‍රියා පටිපාටිය**

   මෙම චක්‍රලේඛය 2025 ඔක්තෝබර් 30 දින නිකුත් කරන ලද අතර රක්ෂණකරුවන් සහ රක්ෂණ තැරැව්කරුවන් විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මර්දනය කිරීම පිළිබඳ වගකීම් පැහැර හරින අවස්ථාවන්හිදී කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලබන බලාත්මක කිරීමේ ක්‍රියා පටිපාටිය මෙයින් දක්වා ඇත. මෙම චක්‍රලේඛය 2025 ඔක්තෝබර් 30 දින සිට බලාත්මක විය.

3. **2025 අංක 03 සහ 2025 අංක 04 දරන චක්‍රලේඛ - සාමාන්‍ය රක්ෂණ ඔප්පු සඳහා වාරික ගෙවීමේ අවශ්‍යතා**

   මෝටර් රක්ෂණ ඔප්පු සඳහා ලබාදෙන ණය කාල සීමාව 2026 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දින 30 දක්වා අඩු කිරීමටත් 2028 ජනවාරි 01 දින සිට සම්පූර්ණ රක්ෂණ වාරිකය ගෙවීමෙන් අනතුරුව පමණක් මෝටර් රථ රක්ෂණ ඔප්පු නිකුත් කිරීමටත් අවශ්‍ය වන පරිදි 2025 නොවැම්බර් 17 දින අංක 03/2025 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. මෙම චක්‍රලේඛය 2025 නොවැම්බර් 17 දින සිට බලාත්මක වූ අතර එමගින් 2023 අංක 01 දරන චක්‍රලේඛය අවලංගු කරන ලදී.

   කෙසේ වෙතත්, 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ඇති වූ ව්‍යසනකාරී තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෝටර් රථ රක්ෂණ ඔප්පු සඳහා වන ණය කාල සීමාව දින 30 දක්වා අඩු කිරීමේ බලාත්මක දිනය දීර්ඝ කරනු ලබයි. මෙම චක්‍රලේඛය 2025 සැප්තැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වේ.

## වසර තුළ නිකුත් කරන ලද මාර්ගෝපදේශ

1. **දීර්ඝකාලීන රක්ෂණ නිෂ්පාදන සඳහා වන රක්ෂණ නිෂ්පාදන රාමුව පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ**

   නව ව්‍යාපාර සඳහා විවෘතව ඇති දැනට පවතින සියලුම දිගු කාලීන රක්ෂණ නිෂ්පාදන සඳහා අදාළ වන කාල සීමාව 2025 අගෝස්තු 09 දක්වා දීර්ඝ කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ 2025 මැයි 19 දින නිකුත් කරන ලදී.

2. **රක්ෂණ ක්ෂේත්‍රය තුළ තිරසාර සංවර්ධන ඉලක්ක, පාරිසරික, සමාජීය සහ පාලන මූලධර්ම සහ තිරසාර මූල්‍ය වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම සඳහා වන රාමුවක් ඇතුළත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ**

   මෙම මාර්ගෝපදේශ 2025 ජූලි 21 දින සිට ක්‍රියාත්මක විය.

3. **රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා වන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මූල්‍ය ආධාර සැපයීම මර්ධනය කිරීමේ වැඩසටහන පිළිබඳ මාර්ගෝපදේශ**

   මෙම විෂය සම්බන්ධයෙන් 2006 වසරේ නිකුත් කරන ලද මාර්ගෝපදේශ අවලංගු කරමින් නව මාර්ගෝපදේශ 2025 ජූලි 25 දින සිට බලාත්මක විය.

4. **රක්ෂණකරුවන්ගේ වෙළඳපල චර්යාව පිළිබඳ මාර්ගෝපදේශ**

   මෙම මාර්ගෝපදේශ 2025 ඔක්තෝබර් 02 දින නිකුත් කරන ලද අතර ඒවා 2026 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

## වෙළඳපොළ ව්‍යුහය

### රක්ෂණකරුවන්

පනතේ 12 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් පුද්ගලයකු රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා දැනට ලියාපදිංචි වී හෝ පනත යටතේ ලියාපදිංචි වී ඇතැයි සැලකෙන්නේ නම් මිස, එම පුද්ගලයා ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයක් සිදු නොකළ යුතුය.

පනතේ 13 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරවල නිරත වීමට කැමති ඕනෑම පුද්ගලයකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් සංස්ථාගත කර නිශ්චිතව දක්වා ඇති සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පනත යටතේ රක්ෂණකරුවෙකු ලෙස ලියාපදිංචි වී බලපත්‍රයක් ලබා ගත යුතුය.

වසර අවසානය වන විට සමාගම් විසි නවයක් (29) ක් රක්ෂණකරුවන්

ලෙස ක්‍රියාත්මක විය. තවද, ඒඅයිජී ඉන්ෂුවරන්ස්ලිමිටඩ්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා වන බලපත්‍රය 2022 අප්‍රේල් 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇත. එම්.බී.එස්.එල්. ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් 2020 ජුනි 01 වන දින සිට නව ජීවිත රක්ෂණ ව්‍යාපාරය ප්‍රාරක්ෂණය කිරීම නතර කර ඇත.

1වන සටහන මගින් සමාගම් විසින් නියැලුණු රක්ෂණ ව්‍යාපාර පන්ති නිරූපණය කරයි. ක්‍රියාත්මක වූ සමාගම් 29 න් එක් සමාග මක් සංයුක්ත රක්ෂණකරුවකු වූ අතර එය නව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර ප්‍රාරක්ෂණය කිරීම නවතා ඇත. එසේම සමාගම් 15ක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන ගිය අතර සමාගම් 13 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යමින් තිබුණි.

**1 සටහන:** රක්ෂණකරුවන් විසින් සිදු කරගෙන යන රක්ෂණ ව්‍යාපාර පන්ති




## රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවෙකු යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යාම සඳහා පනත යටතේ ලියාපදිංචි වූ සමාගමකි. රක්ෂණ තැරැව්කරුවෝ ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමග හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණය සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරති.

වසර අවසානයේදී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වූ සමාගම් ගණන 83කි. එම සමාගම් අතරින් සමාගම් 67ක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර දෙකෙහිම ලියාපදිංචි වී ඇති අතර සමාගම් 16ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ පමණක් ලියාපදිංචි වී ඇත. 2 සටහන මගින් වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් විසින් පවත්වාගෙන යන ලද රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්ති දැක්වේ.

**2 සටහන:** රක්ෂණ තැරැව්කරුවන් විසින් සිදු කරගෙන යන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ පන්ති




## රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමග ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිෂ්ඨාවක් ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයන්වේ. රක්ෂණ නියෝජිතයෙකු ලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයන් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකකි.

රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව වසර තුළ දී රක්ෂණ නියෝජිතයන් ලෙස බඳවා ගෙන ඇති මුළු පුද්ගලයන් සංඛ්‍යාව 20,432 ක් පමණ වන අතර එය පසුගිය වසරේ බඳවා ගත් සංඛ්‍යාව වූ 19,246 ට සාපේක්ෂව 6.16%ක ඉහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව 46,076 ක් පමණ වූ අතර එය පසුගිය වසරේ සංඛ්‍යාව වන 50,178 ට සාපේක්ෂව 8.17%ක පහළ යාමකි.

3 වන රූප සටහන මගින් රක්ෂණ සමාගම් සමග ලියාපදිංචි වී සිටින තනි රක්ෂණ නියෝජිතයන් පෙන්නුම් කරයි.

**3 සටහන:** 2025.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයන්




වසර අවසානය වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් නියෝජනය කරන මුළු රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව 649 ක් පමණ විය.

## අලාභ ගැලපුම්කරුවන්

වසර අවසාන වන විට අලාභ ගැලපුම්කරුවෝ 25 ක් සිටියහ.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි වීම පිළිබඳ රීති 2017 ජූලි 5 දිනැති අංක 2026/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

2011 වසරේ දී 2011 අංක 3 දරණ සංශෝධන පනත මගින් සංශෝධනය වූ පරිදි යම් තැනැත්තෙකු කොමිෂන් සභාව සමග ලියාපදිංචි වීමෙන් තොරව අලාභ ගැලපුම්කරුවකු (පනතේ 114 (1) යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි) ලෙස පෙනී සිටීම හා කටයුතු කිරීම තහනම් කරන ලදී. පනතේ 89අ (2) වගන්තියේ අලාභ ගැලපුම්කරුවන් සඳහා වන අවශ්‍යතා වන්ට අදාළව සීමිත ව්‍යතිරේකයක් ඇත.

89 ආ වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචි වීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් කරමින් රීති සෑදීමට ඉඩ ඇත. පනතේ 89 ඈ (1) වගන්තිය අනුව අවශ්‍ය තොරතුරු, ලේඛන සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු නිශ්චය කරමින් රීති සකසනු ලැබේ.

ඒ අනුව, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තෙකු අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා/ හෝ පළපුරුද්ද උක්ත රීති මගින් නිශ්චිතව දක්වා ඇත.

## ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් සමාගම්වල තත්ත්වය

කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 11 ක් වර්ෂ 2025 දෙසැම්බර් 31 දිනට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොට ඇත: එනම් යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී, එච් එන් බී ඇෂුවරන්ස් පීඑල්සී, අමානා ටකාෆුල් පීඑල්සී, අමානා ටකාෆුල් ලයිෆ් පීඑල්සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී, ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී, කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී සහ එල් ඕ එල් සී ජෙනරල් ඉන්ෂුවරන්ස් පීඑල්සී වේ.

ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන සටහනින් දැක්වේ.

**4 සටහන:** ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණකරුවන්ගේ තත්වය




2011 අංක 03 දරණ සංශෝධිත පනතින් සියළු රක්ෂණ සමාගම් දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය වේ. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ජීවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තුගත කිරීමට ද අවශ්‍ය වේ.

2011 අංක 3 දරණ සංශෝධිත පනත බලාත්මක වූ පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුළත දී දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

## රක්ෂණක සමාගම්වලින් සෙස් බද්දක් අය කිරීම.

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරණ ගැසට් නිවේදනය මගින් දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2% ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.4% ක් ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බවට පැහැදිලි කොට ඇත.

රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2025 වසරේ එසේ එකතු කරන ලද මුදරල රු 998,581,075 කි.

සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ක්‍රියාකාරිත්වය 5 වන රූප සටහන මගින් දැක්වේ.

## රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වගන්තිය ප්‍රකාරව ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. 2025 දෙසැම්බර් 31 දිනට එම රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ සංචිතය රු. 15,100,086,430 ක් විය. මෙය පසුගිය වසරට වඩා (රු.13,128,044,971) 15% වර්ධනයකි.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සහ වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ. රක්ෂණ කර්මාන්තය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේදීත් රක්ෂණ කාර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදු වන වියදම් පියවාලීම සහ

ආ. කොමිෂන් සභාව එහි බලපත්‍ර, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවය නැංවීමේ දී දරණු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල සහ රජ්‍ය බැංකුවල පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

**5 සටහන:** සෙස් බද්ද සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල




## රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නොවේ. 2002, 2005 සහ 2007 යන වර්ෂවල ජනවාරි 1 දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය හා කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

## පනතේ බලපෑමෙන් නිදහස් වීම

1999 අංක 20 දරණ කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරණ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරණ සමාජ රක්ෂණ මණ්ඩල පනත යටතේ සාමාජික සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12 (3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති අදාළ නොවේ.

## ජාතික රක්ෂණ භාර අරමුදල

2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, 2011 අංක 3 දරණ සංශෝධිත පනත මගින් කොමිෂන් සභාවේ විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් අමාත්‍යංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරළි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් ඒ සඳහා අය කර

ගන්නා වාරික මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරණ සංශෝධන පනත අනුව සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම්, ගැසට් පත්‍රයේ පළ කරන ලද අමාත්‍යවරයාගේ නියෝගය ප්‍රකාරව සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% නොඉක්මන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/4 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් 2013 ජනවාරි 01 දින සිට සියළුම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ඔප්පුවලින් පැන නගින සම්පූර්ණ වගකීමෙන් 30%ක ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20% ක් විය.

## අදාළ අනෙකුත් කරුණු

### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

මෝටර් රථ වාහන පනතට සිදු කරන ලද සංශෝධනය යටතේ 1998 දී මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ස්ථාපනය කරන ලදී. එය ප්‍රවාහන සහ මහා මාර්ග අමාත්‍යංශයේ විෂය පථය යටතේ පවතියි. තෙවන පාර්ශවීය අවදානම් සම්බන්ධයෙන් මෝටර් රථ රක්ෂණ ඔප්පු නිකුත් කරන සෑම රක්ෂණකරුවෙකුම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් පරිපාලනය සහ කළමනාකරණය කරනු ලබන මාර්ග ආරක්ෂණ අරමුදලට (අරමුදල) වාරිකයෙන් 2% ක් දායක කළ යුතුය. එම දායක මුදල් මෝටර් රථ අනතුරුවල දී මෝටර් රථ හඳුනාගෙන නොමැති අවස්ථාවල මියගිය හෝ තුවාල ලැබූ පුද්ගලයින්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට මූල්‍ය ආධාර සැපයීමට භාවිතා කරයි. මීට අමතරව, මාර්ග ආරක්ෂාව සහ අනතුරු වැළැක්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද අරමුදල භාවිතා කරනු ලැබේ. ජාතික මාර්ග ආරක්ෂණ සභාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඇතුළු රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරන සාමාජිකයින් 17 දෙනෙකුගෙන් සමන්විත වේ.

### මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මින් පෙර පිහිටුවන ලද මූල්‍ය පද්ධති අධීක්ෂණ සභාව වෙනුවට 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ xi කොටස මගින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව ස්ථාපිත කරන ලදී. එය මූල්‍ය අංශයේ නියාමකයන්ගේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන්ගෙන් සමන්විත වන අතර මහ බැංකු අධිපතිවරයා එහි සභාපතිත්වය දරයි. කමිටුවේ පරමාර්ථය වනුයේ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමට දායක වීමයි. අධ්‍යක්ෂ ජනරාල්වරයා මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවෙහි කොමිෂන් සභාව නියෝජනය කරයි.

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය

1989 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකට ම ලබා ගත හැකි ය.

සියළුම රක්ෂණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා රක්ෂණ සංගමෙහි විධායක කමිටුව, විශේෂයෙන් රක්ෂණ කර්මාන්තයේ පොදු ගැටළුවල දී කර්මාන්තය තුළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන අතර තම ක්ෂේත්‍රවලට අදාළ විෂයයන් පිළිබඳ විධායක කමිටුවට නිර්දේශ ඉදිරිපත් කරන පහත කමිටු මගින් එයට සහාය ලබා දේ:

- ජීවිත රක්ෂණ සන්සදය
- සාමාන්‍ය රක්ෂණ සන්සදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සන්සදය
- මානව සම්පත් අනු කමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණ හා විකුණුම් සන්සදය
- ආයුගණක අනු කමිටුව

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය නියෝජනය කරනු ලබන්නේ රක්ෂණ කොමිෂන් සභාව සමග ලියාපදිංචි වූ රක්ෂණ තරැව්කාර සමාගම් වන අතර එය පිහිටුවා ඇත්තේ රක්ෂණ තැරැව්කරුවන්ගේ යහපත සඳහාය.

### ශ්‍රී ලංකා ආයුගණක සංගමය

2008 වසරේදී පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයුගණක සංගමය දිවයින තුළ සිටින ආයුගණකඥයින් සහ ආයුගණක විෂය හදාරන සිසුන් නියෝජනය කරන එකම වෘත්තීය ආයතනය වේ. එය ශක්තිමත් සදාචාරාත්මක පාලනයක්, උසස් අධ්‍යාපන හා ප්‍රායෝගික ප්‍රමිතීන් මෙන්ම පර්යේෂණ සහ පොදු ජන යහපත උදෙසා වන මුලපිරීම් සඳහා වන සක්‍රීය කැපවීම තුළින් වෘත්තීය ප්‍රමිතීන් ප්‍රවර්ධනය කරන සහ ආරක්ෂා කරන, සාමාජිකයින් විසින් මෙහෙයවනු ලබන සංගමයකි. ජාත්‍යන්තර ආයුගණක සංගමයේ පූර්ණ සාමාජික සංගමයක් ලෙස, ශ්‍රී ලංකා ආයුගණක සංගමය ජාත්‍යන්තර වශයෙන් වෘත්තීය සබඳතා ශක්තිමත් කරන අතර ශ්‍රී ලාංකික ආයුගණකඥයන් ගෝලීය වෘත්තීය සමග සම්බන්ධ කරමින් සාමාජිකයින්ගේ සහ කර්මාන්තයේ කොටස්කරුවන්ගේ විකාශනය වන අවශ්‍යතා සඳහා සහයෝගය දක්වයි.

2024 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන රාමුව තුළ වෘත්තීය ආයතනයක් ලෙස පිළිගැනීමට ලක්වූ දින සිට, ශ්‍රී ලංකා ආයුගණක සංගමය ප්‍රධාන නියාමන සහ කර්මාන්ත ප්‍රමුඛතා හරහා තාක්ෂණික දායකත්වය සහ ප්‍රායෝගික සහාය ලබා දෙමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග පවතින සබඳතාවය තවදුරටත් ව්‍යාප්ත කර ඇත.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්ත වන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සඳහා අරමුදල් ලැබෙන්නේ රක්ෂණකරුවන් විසින් කරනු ලබන දායකත්වයන්, එහි සාමාජිකයින්ගේ වාර්ෂික දායකත්ව ගාස්තු සහ එය විසින් සංවිධානය කරනු ලබන වෙනත් වැඩසටහන් මගිනි.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලන්ඩනයේ චරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධිත වන අතර එමගින් එවැනි වෘත්තීය ආයතනවල රක්ෂණ පරීක්ෂාවන් පරිපාලනය කරයි. රක්ෂණ ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පුද්ගලයින් සඳහා කෙටි කාලීන ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු රක්ෂණ අධ්‍යාපනයට අදාළ විවිධ වැඩසටහන් ආයතනය විසින් පවත්වනු ලැබේ. මීට අමතරව, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) සම්මන්ත්‍රණ, රක්ෂණයට අදාළ සමුළු, අන්තර් රක්ෂණ සමාගම් පැන විසඳුම් වැඩසටහන් සහ අන්තර් රක්ෂණ සමාගම් ක්‍රිකට් සහ දැල් පන්දු තරඟාවලි පැවැත්වීම මෙමගින් සිදු කෙරෙන අනෙකුත් ක්‍රියාකාරකම් කිහිපයකි.

රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ පැවැත්වීමේ වගකීම කොමිෂන් සභාව විසින් මෙම ආයතනයට පවරා ඇත. මෙම ආයතනය විසින් රක්ෂණ ව්‍යාපාරයේ පන්ති දෙකටම අදාළ වන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ ලිඛිත හා දුරස්ථ පරීක්ෂාව සහිත පරිඝණක පාදක මාර්ගගත යන දෙයාකාරයෙන් ම අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි.

## රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2019 පෙබරවාරි මස රක්ෂණ ඔම්බුඩ්ස්මන්වර ලෙස ආචාර්ය රංජිත් රණරාජා මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම රනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා එකී පාර්ශවයන් දෙක විසින් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ඇත.

## රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙකු ලෙස, කොමිෂන් සභාවට ප්‍රකාශන, රක්ෂණයේ මූලික මූලධර්ම වැනි මාර්ගෝපදේශ සහ රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු නිතිපතා ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන ඇතැම් ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට සහ මෙහෙයවීමට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය

කලාපීය රක්ෂණ නියාමන සහයෝගීතා යාන්ත්‍රණයක් වන රක්ෂණ නියාමකයන්ගේ අසියානු සංසදය 2006 දී අරම්භ කරන ලද අතර චීන රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මේ සඳහා මුල පුරන ලදී. කොමිෂන් සභාව මෙහි සාමාජිකත්වය දරයි.

රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය ආසියාතික රක්ෂණ නියාමකයින්ගේ රට රටවල් අතර අධීක්ෂණ කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

රක්ෂණ නියාමකයින් අතර නියාමන තොරතුරු තාක්ෂණය හා නියාමන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ රක්ෂණ කර්මාන්තයේ වෘත්තිකයන් හුවමාරු කර ගැනීම රට රටවල් අතර පවතින නියාමනය කිරීමේ අවදානම අඩු කරමින් සහයෝගීතාව වැඩි දියුණු කරමින් ද රක්ෂණ කටයුතු නියාමනය කිරීමේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම තුළින් ගෝලීය රක්ෂණ නියාමනයේ වඩාත් ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම මෙහි අරමුණ වේ.

## ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වය

ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වය යනු සිංගප්පූරුවේ මූල්‍ය අධිකාරිය සහ සිංගප්පූරුවේ නැන්යැං තාක්ෂණික විශ්ව විද්‍යාලය (NTU) සහ ගෝලීය රක්ෂණ කර්මාන්ත හවුල්කරුවන් එක්ව ආසියාවේ ආරක්ෂණ හිඩැස් අඩු කරන අතරම ආසියාවේ දිගුකාලීන වශයෙන් අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ දැක්ම සහිතව අරඹන ලද කාර්යයකි. එය රක්ෂණ කර්මාන්තය, නියාමකයින් සහ ශාස්ත්‍රඥයින් අතර ලාභ නොලබන ත්‍රෛපාර්ශ්වික හවුල්කාරිත්වයකි. ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වයෙහි නිතැතින් පර්යේෂණ කරන පරිසර (Living Lab), ප්‍රතිපත්ති බුද්ධි මණ්ඩල (Policy Think Tank) සහ කුසලතා සංවර්ධනය (Talent Development) යන ප්‍රධාන අංග තුනෙන් සමන්විත වේ. සිංගප්පූරුවේ නැන්යැං තාක්ෂණික විශ්ව විද්‍යාලය, ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වයෙහි අධ්‍යයන හවුල්කරු ලෙස කටයුතු කරන අතර ආසියාව මුහුණ දෙන දැනට පවතින සහ නව ආරක්ෂණ හිඩැස් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කර්මාන්තය සහ කලාපීය ප්‍රතිපත්ති සම්පාදකයින් බල ගැන්වීම සඳහා ක්‍රියාවට නැංවිය හැකි පර්යේෂණ, දත්ත, විදසුන් සහ ප්‍රතිපත්ති නිර්දේශ සකස් කරනු ඇත.

2019 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ආයතනය ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වයෙහි අනුබද්ධ හවුල්කරුවෙකු ලෙස එක් වූ අතර එමගින් රක්ෂණ කර්මාන්තයේ ආරක්ෂණ හිඩැස් අඩු කිරීම සඳහා දැනුම බෙදා ගැනීමෙන් සහ ධාරිතා වර්ධනය කිරීමෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ද ප්‍රතිලාභ හිමි වනු ඇත.

## 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නීති සහ බලාත්මක කිරීමේ අධ්‍යක්ෂවරයා තොරතුරු නිලධාරියා ලෙසත් අධ්‍යක්ෂ ජනරාල්වරයා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ අරමුණු සඳහා නම් කරන ලද නිලධාරියා ලෙසත් පත් කර ඇත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2025 දෙසැම්බර් 31 වන දිනට සිය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව මහජනතාවගෙන් ලැබුණු තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ ඉල්ලීම්වලට අදාළ තොරතුරු පහත පරිදි වේ:

| අයිතමය | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය යටතේ අවශ්‍යතාවය | තොරතුරු/ තත්ත්වය |
|---|---|---|
| 1 | 2025 වසර තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ලැබුණු මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 11 |
| 2 | තොරතුරු ලබා දුන් තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 7 |
| 3 | තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 4<br>(ඉල්ලුම් කරන ලද තොරතුරු අදාළ පොදු අධිකාරිය සන්තකයේ (භාරයේ) නොමැති වීම හේතුවෙන් 2ක් ප්‍රතික්ෂේප විය) |
| 4 | 2017.02.03 දිනැති අංක 2004/66 දරන ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසිවල 4 (6) රෙගුලාසිය ප්‍රකාරව අදාළ අනෙකුත් පොදු අධිකාරීන් වෙත යොමු කර ඇති 2025 වසර තුළ ලැබුණු මුළු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව. | 0 |
| 5 | තොරතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වසර තුළ එකතු කරන ලද ගාස්තු | ගාස්තු කිසිවක් අය කර නොමැත. |
| 6 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන | 2 |
| 7 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි තොරතුරු ලබා දුන් වාර ගණන | 1 |
| 8 | තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ඉදිරිපත් වූ අභියාචනා ගණන | 1 |
| 9 | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි වාර්තා නඩත්තු කිරීම, කළමනාකරණය කිරීම සහ විනාශ කිරීම සම්බන්ධ පරිචයන් | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7 වන වගන්තියේ ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් අදාළ ලිඛිත නීතිවලට අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වාර්තා / තොරතුරු පවත්වාගෙන යනු ලබයි. |
| 10 | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 8 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට අදාළ ක්‍රියාකාරකම් | අදාළ නොවේ. |
| 11 | විනිවිදභාවයට අදාළ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ඇත්නම් | නැත. |

# මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සහ සමූලඝාතක අවි ව්‍යාප්තිය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ සමාලෝචනය

2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 23 වැනි වගන්තියට අනුව රක්ෂණ ක්ෂේත්‍රයේ අධීක්ෂණ අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව එම ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ අනුකූලතාව අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වන වගකීම දරයි. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව කටයුතු කිරීම සඳහා සහ ක්ෂේත්‍රයේ නීතිමය අවශ්‍යතා වලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම අධීක්ෂණය සඳහාම වෙන් වූ විශේෂ ඒකකයක් පිහිටුවා ඇත.

මෙම ඒකකය මගින් රක්ෂණ ක්ෂේත්‍රයේ පවතින මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ අවදානම් තක්සේරු කරනු ලබයි. එමෙන්ම, අනුකූලතාව නිරීක්ෂණය කිරීමේදී අවදානම මත පදනම් වූ අධීක්ෂණ ප්‍රවේශයක් අනුගමනය කරන අතර ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබා දීම සහ කිසියම් අනුකූල නොවීමක් සිදුවුවහොත් ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම සිදු කරයි. තවද, අවශ්‍ය අවස්ථාවල දී මෙම ඒකකය නීතිය බලාත්මක කරන ආයතන සහ මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගයෙන් කටයුතු කරයි.

## ස්ථානීය නොවන අධීක්ෂණය

### 1. ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ අවධානම් තක්සේරු කිරීම"

මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට අනුව රක්ෂණ සමාගම්වල මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ අවදානම තහවුරු කර ගැනීම සඳහා අවදානම් තක්සේරු කිරීමේ මෙවලමක් භාවිත කරමින්, දිගුකාලීන රක්ෂණ සමාගම්වල මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ අවදානම් තක්සේරුවක් ස්ථානීය නොවන පදනම මත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. මෙම අවදානම් තක්සේරුව සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරනු ලබන්නේ සියළුම දිගුකාලීන රක්ෂණ සමාගම් වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලියක් මගිනි. එමගින් එක් එක් සමාගමට අදාළ ව්‍යුහය, හිමිකාරිත්වය, නිෂ්පාදන, ගණුදෙනුකරුවන්, දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින්, බෙදාහැරීමේ මාර්ග, භූගෝලීය පිහිටීම්, ආයතනික පාලනය, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි, අවදානම් කළමනාකරණය, සේවක තත්ත්ව විශ්ලේෂණය, අනුකූලතාව, අභ්‍යන්තර පාලනයන්, පුහුණුව සහ වාර්තා කිරීම වැනි පුළුල් පරාසයක තොරතුරු රැස් කරනු ලබයි. මෙම මෙවලම මගින් ලබා ගන්නා ප්‍රතිඵල පසුව ඉදිරි වසර සඳහා අවදානම මත පදනම් වූ ස්ථානීය අධීක්ෂණ සැලසුම සකස් කිරීම සඳහා යොදා ගනියි. මෙම මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ අවදානම් තක්සේරුව 2025 වසරේ සිව්වන කාර්තුව තුළදී සිදු කරන ලදී.

## 2. තේමාත්මක සමාලෝචන

තේමාත්මක සමාලෝචනයක් යනු කිසියම් නිශ්චිත තේමාවක් යටතේ ස්ථානීය නොවන පදනම මත සිදුකරනු ලබන සවිස්තරාත්මක අධ්‍යයනයකි. රක්ෂණ සමාගම් සතු ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පාලන පියවරයන් සමාලෝචනය කිරීම සඳහාත් අදාළ නිශ්චිත තේමාව පිළිබඳ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාළ රෙගුලාසි සම්බන්ධයෙන් ඔවුන් සතු සමස්ත දැනුම සහ දැනුවත්භාවය තක්සේරු කිරීම සඳහාත් සියළුම දිගුකාලීන රක්ෂණ සමාගම් අතර බෙදා හරින ලද ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු රැස් කරනු ලබයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2025 වසර තුළ "අවධානම් පැතිකඩකරණය හා අවධානම තක්සේරු කිරීම" සහ "අනුකූලතාව හා වාර්තා කිරීමේ කාර්යයන්" යන තේමාවන් යටතේ තේමාත්මක සමාලෝචන දෙකක් සිදු කරන ලදී.

# අවදානම් පාදක අධීක්ෂණය

## 1. ස්ථානීය පරීක්ෂාවන්

රක්ෂණ සමාගම්වල මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ අවදානම මත පදනම්ව, සම්පත් කාර්යක්ෂමව වෙන් කරමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ස්ථානීය පරීක්ෂාවන් සිදු කරනු ලබයි. ඵලදායී අවදානම් පාදක අධීක්ෂණයක ආරම්භක පියවර ලෙස මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ අවදානම් තක්සේරුවක් සිදු කරනු ලැබේ. එම තක්සේරුවේ ප්‍රතිඵල මත පදනම්ව, අවදානම් පාදක ස්ථානීය පරීක්ෂණ සැලසුම සකස් කරනු ලැබේ. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 18 සහ 23 වගන්ති සමග කියවිය යුතු 15(1)(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, 2025 වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මූල්‍ය බුද්ධි ඒකකය සමග ඒකාබද්ධව මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ ස්ථානීය පරීක්ෂාවන් පහක් සිදු කරන ලදී. මෙම පරීක්ෂාවන්හි අරමුණ වූයේ රක්ෂණ සමාගම් විසින් මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සහ 2019 අංක 1 දරන රක්ෂණකරුවන්ගේ (ගණුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීතිවල දක්වා ඇති නීතිමය සහ නියාමන අවශ්‍යතා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන්නේද යන්න ස්වාධීනව තහවුරු කර ගැනීමයි. පරීක්ෂණයේ විෂය පථය සහ සොයාගැනීම් විස්තර කෙරෙන සවිස්තරාත්මක වාර්තා අදාළ රක්ෂණ සමාගම් වෙත යොමු කරන ලද අතර හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නිර්දේශිත පියවර සහ ඒ සඳහා ලබාදෙන කාලසීමාවන් ද එහි ඇතුළත් විය.

## 2. පසු විපරම් පරීක්ෂාවන්

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම / සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වන පසු විපරම් පරීක්ෂාවන්හි අරමුණ වන්නේ, පෙර ස්ථානීය පරීක්ෂාවලදී හඳුනාගත් අඩුපාඩු රක්ෂණ සමාගම් විසින් නිවැරදි කර ඇත්ද යන්න සහ ඔවුන් නීතිමය අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීමයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2025 වසර සඳහා මෙවැනි පසු විපරම් පරීක්ෂණ අටක් පවත්වන ලදී.

# ක්ෂේත්‍රය සඳහා මඟපෙන්වීම සහ දැනුවත් කිරීම

## 1. දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2025 වර්ෂය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් පවත්වන ලද අතර ඒවායේ විස්තර පහත වගුවේ දක්වා ඇත:

| දිනය | සහභාගිවන්නන් | ආවරණය කරන ලද මාතෘකා | මාධ්‍යය | සම්පත්දායකයන් |
|---|---|---|---|---|
| 2025.06.04 | රක්ෂණ තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය නියෝජනය කරමින් සහභාගී වූ ගණන 140 කි. | මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම / සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ හැඳින්වීම<br>ගණුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම<br>මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම / සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය තුළ රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්යභාරය | පුද්ගලිකව පැමිණීමෙන් | දමයන්ති ප්‍රනාන්දු මහත්මිය - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව<br>ආචාර්ය අයේෂ් ආරියසිංහ මහතා - මූල්‍ය බුද්ධි ඒකකය<br>තේජා පත්බේරිය මහත්මිය - මූල්‍ය බුද්ධි ඒකකය<br>රාජන් නිරූබසිංහම් මහතා - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව<br>තුෂාරි විජේගුණවර්ධන මහත්මිය - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව |

| | | | | |
|---|---|---|---|---|
| 2025.10.28 | රක්ෂණ තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් නියෝජනය කරමින් සහභාගී වූ ගණන 83 කි. | අවදානම් කළමනාකරණය | පුද්ගලිකව පැමිණීමෙන් | තුෂාරි විජේගුණවර්ධන මහත්මිය - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව |
| 2025.11.12 | රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල අනුකූලතා නිලධාරීන් නියෝජනය කරමින් සහභාගී වූ ගණන 57 කි. | අන්‍යෝන්‍ය ඇගයීමට මුහුණ දෙන ආකාරය පිළිබඳ පුහුණු සැසිය. | පුද්ගලිකව පැමිණීමෙන් | මූල්‍ය බුද්ධි ඒකකය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් සම්බන්ධිකරණය කරන ලද ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය සමඟ සහයෝග යෙන් ඉන්දිය ආදායම් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව පවත්වන ලදී. |
| 2025.11.17 | රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය, අනුකූලතා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය නියෝජනය කරමින් සහභාගී වූ ගණන 440 කි. | රක්ෂණ ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම / සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වන බැඳීම් | මාර්ගගතව | දමයන්ති ප්‍රනාන්දු මහත්මිය - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව<br>ආචාර්ය සුභානි කීර්තිරත්න මහත්මිය - මූල්‍ය බුද්ධි ඒකකය<br>රාජන් නිරූබසිංහම් මහතා - රක්ෂණ නියාමන කොමිෂන් සභාව |

## 2. මාර්ගෝපදේශ නිකුත් කිරීම

රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා "මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම / සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම වැඩසටහන පිළිබඳ මාර්ගෝපදේශ" ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. මෙම මාර්ගෝපදේශ නිකුත් කිරීමේ අරමුණ වූයේ, සමාග මක මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම / සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමේ වැඩසටහන සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, 2019 අංක 01 දරන ගණුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ රීතිවල අනුකූලතා අවශ්‍යතාවන් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමයි.

### අන්තර් නියාමන සම්බන්ධීකරණය සහ සහයෝගීතාව

2025 වසර තුළදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තොරතුරු හුවමාරු කර ගැනීම මගින් අදාළ දේශීය හා විදේශීය නියාමන බලධාරීන් සමග සමීපව සහයෝගයෙන් කටයුතු කිරීම දිගටම සිදු කරගෙන යන ලදී. තවද, බලපත්‍රලාභී රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම / ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම /





සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීතිවලට අනුකූල වීම සම්බන්ධයෙන් ඒකාබද්ධ අධීක්ෂණය සඳහා පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, මූල්‍ය බුද්ධි ඒකකය සමග විධිමත් යොමු කිරීම් අනුදේශයකට (Terms of Reference) එළඹුණි.

### මහජනතාව දැනුවත් කිරීම

2025 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම /

ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම / සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණ කටයුතු පිළිබඳවත්, රක්ෂණ ඔප්පු මිලදී ගැනීමේදී පාරිභෝගිකයන් විසින් සැපයිය යුතු ලේඛන සහ තොරතුරු පිළිබඳවත් මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. එහි විස්තර පහත වගුවේ දක්වා ඇත:

| දිනය | මාතෘකාව |
|---|---|
| 2025.07.28 | මාධ්‍ය නිවේදනය - රක්ෂණ තැරැව්කරුවන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වන අනුකූලතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබයි. |
| 2025.09.28 | ගණුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම පිළිබඳව රක්ෂණ පාරිභෝගිකයින් වෙත නිකුත් කරන පොදු නිවේදනය. |
| 2025.12.12 | මාධ්‍ය නිවේදනය - ඒකාබද්ධ අධීක්ෂණ කටයුතු පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ මූල්‍ය බුද්ධි ඒකකය අතර යොමු කිරීම් අනුදේශය සඳහා අත්සන් තැබේ. |



### රක්ෂණ නිෂ්පාදන සමාලෝචනය

2021 අංක 1 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, රක්ෂණ සමාගම් විසින් කිසියම් නිෂ්පාදනයක් වෙළඳපොළට හඳුන්වා දීමට පෙර එය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි සාධාරණ හා සාධාරණීය බව පිළිබඳව කොමිෂන් සභාවේ මතය ලබාගත යුතුය. මෙම රක්ෂණ නිෂ්පාදන සමාලෝචනය කිරීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නීති අංශය සහ ආයු ගණක ඒකකය මගින් ඒකාබද්ධව සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලියේ අරමුණ වන්නේ යෝජිත නිෂ්පාදනවල නීත්‍යානුකූලභාවය ප්‍රතිපත්තිමය රාමුව සහ ශක්‍යතාව සමාලෝචනය කිරීම මගින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ පිළිබැඳියාවන් ආරක්ෂා කිරීමයි. සමාලෝචනය අවසන් කිරීමට පෙර, අවශ්‍ය අවස්ථාවලදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිශ්චිත නිරීක්ෂණ සම්බන්ධයෙන් සමාගම්වලින් පැහැදිලි කිරීම් ලබා ගන්නා අතර ඔවුන්ගේ ප්‍රතිචාර ද සැලකිල්ලට ගනු ලබයි. 2025 වර්ෂය තුළදී රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගු කාලීන රක්ෂණ නිෂ්පාදන සහ අතිරේක ආවරණ 13ක් සඳහා සහ සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන 8 ක් සඳහා සිය මතය ලබා දෙන ලදී.

# අධීක්ෂණ සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධීක්ෂණ අංශය, රක්ෂණ කර්මාන්තය ඥානාන්විත අවශ්‍යතා සහ නියාමන ප්‍රමිතීන්ට අනුකූලව අඛණ්ඩව කටයුතු කරන බව සහතික කිරීම සඳහා අධීක්ෂණය කරනු ලබයි. ඵලදායී අධීක්ෂණය තුළින් එම අංශය සාධාරණත්වය, මූල්‍ය ස්ථාවරත්වය සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව ප්‍රවර්ධනය කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිය නියාමන කාර්යයන් ඉටු කිරීමේදී අවදානම පදනම් කරගත් අධීක්ෂණ රාමුවක් අදාළ කරගන්නා අතර ව්‍යවස්ථාපිත වාර්තා විශ්ලේෂණය, අදාළ නීති හා රීතිවලට අනුකූලතාවය ඇගයීම, රක්ෂණක සමාගම්වල අවදානම් ශ්‍රේණිගත කිරීම් තක්සේරු කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක ගණනය කිරීම වැනි බාහිර අධීක්ෂණ කටයුතු එහි ප්‍රධාන ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ. මීට අමතරව, නියාමනය කරනු ලබන ආයතනවල මෙහෙයුම්, මූල්‍ය සහ පාලන භාවිතයන් ඇගයීම සඳහා මෙම අංශය මගින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරනු ලබන අතර නියාමන තීරණ ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීමට රක්ෂණ කර්මාන්තයේ සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම ද සිදු කරනු ලබයි.

## රක්ෂණ සමාගම්වලින් පිටත සිදු කෙරෙන අධීක්ෂණය

### 1. ව්‍යවස්ථානුකූල වාර්තා පිළිබඳ සමාලෝචනය

#### i. වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණිත මූල්‍ය ප්‍රකාශන හා ආයුගණක වර්තා

2021 දෙසැම්බර් 31 වන දින සංශෝධිත විධාන අංක 14 සහ 15 ට අනුව, සියළුම ලියාපදිංචි රක්ෂණ සමාගම් අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී මාස හතරක් ඇතුළත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. මීට අමතරව, දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් තම ආයුගණක වාර්තා සහ එහි සංක්ෂිප්තයන් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමග ඉදිරිපත් කළ යුතුය.

ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියමිත කාල රාමුවට අනුකූල වීම සහ නිවැරදි බව මෙන්ම අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වන බවට සහතික වීම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම අධීක්ෂණය කරන ලදී. එම වාර්තා ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවන්ගෙන් බැහැර වන අවස්ථා නියමිත දිනයන්ට නිවැරදි කරන ලෙස රක්ෂණ සමාගම් වෙත උපදෙස් ලබා දෙන ලදී. අවශ්‍ය අවස්ථාවලදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පසු විපරම් කිරීම ද සිදු කරන ලදී. මීට අමතරව, ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කිරීමේ දී හඳුනාගත් ඇතැම් කරුණු ක්ෂේත්‍රගත විමර්ශන අතරතුර දී තවදුරටත් ඇගයීමට ලක් කරන ලදී.

#### ii. රක්ෂණ සමාගම්වල අභ්‍යන්තර පාලනය අනුකූලතාව සහ අවදානම් කළමනාකරණය තක්සේරු කිරීම

රක්ෂණ සමාගම් සිය වාර්ෂික වාර්තාවල කොටසක් ලෙස වාර්ෂික අවදානම් තක්සේරු වාර්තාවක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව මගින් ආයතනික පාලනය, හිමිකාරිත්ව ව්‍යුහය, කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන්, අනුකූලතාවය, අවදානම් කළමනාකරණය, අලෙවිකරණය සහ බෙදාහැරීම සහ හිමිකම් පෑම් කළමනාකරණය ඇතුළු මූලික මෙහෙයුම් කාර්යයන් පිළිබඳ ප්‍රධාන ගුණාත්මක තොරතුරු ගෙනහැර දක්වයි.

එක් එක් රක්ෂණ සමාගමේ ආයතනික පාලන ප්‍රමිතීන්, පාලන පරිසරය, අවදානම් කළමනාකරණ රාමුව සහ සමස්ත නියාමන අනුකූලතාවය ඇගයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මෙම අවදානම් තක්සේරු වාර්තාව සමාලෝචනය කරයි.

#### iii. ප්‍රතිරක්ෂණ/අවදානම් මාරු කිරීමේ වැඩසටහන්

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 31(1) වගන්තිය යටතේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව, රක්ෂණකරුවන් විසින් 2025 වර්ෂය සඳහා වන ඔවුන්ගේ ප්‍රතිරක්ෂණ/අවදානම් හුවමාරු වැඩසටහනේ විස්තර 2025 ජනවාරි 31 දිනට හෝ ඊට පෙරත්, ඔවුන්ගේ ප්‍රතිරක්ෂණ ගිවිසුම් කටයුතු අදාළ සහතික කිරීම් ද සමග 2025 මාර්තු 15 දිනට හෝ ඊට පෙරත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

රක්ෂණ සමාගම් හතරක් නියමිත දිනට සිය ගිවිසුම්ගත ප්‍රතිරක්ෂණ සැකසුම් ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. මින් සමාගම් තුනක් බලාත්මක කිරීමේ උපායමාර්ගයට අනුකූලව දින 14ක් ඇතුළත වාර්තා ඉදිරිපත් කළ අතර ඉතිරි සමාගම බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගවලට අනුකූලව අවශ්‍ය පියවර ගැනීමෙන් අනතුරුව ඒවා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, සියළුම රක්ෂණ සමාගම් සිය අභිමත ප්‍රතිරක්ෂණ සැකසුම් පිළිබඳ විස්තර කාර්තුමය පදනමින් ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

ප්‍රතිරක්ෂණ වැඩසටහන් ප්‍රමාණවත් බව, ඵලදායී ලෙස අවදානම් හුවමාරුවක් සිදුවන බව සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුම් සැකසුම් සමාලෝචනය කරනු ලබයි. මෙම සමාලෝචනය මගින් ප්‍රතිරක්ෂණකරුවන්ගේ මූල්‍ය ශක්තිය මෙන්ම රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සහ රක්ෂණ සමාගම්වල මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි ඇති වන සමස්ත බලපෑම ද ඇගයීමට ලක් කරයි. සමාලෝචනයේදී පැන නගින නිරීක්ෂණ, අවශ්‍ය අවස්ථාවලදී නිවැරදි කිරීමේ පියවර ගැනීම සඳහා අදාළ රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙනු ලැබේ. තවද, සාමාන්‍ය රක්ෂණ සමාගම්වලට අදාළ නියාමන අනුකූලතාවය කඩවූ අවස්ථා දෙකක් වැඩිදුර පියවර ගැනීම සඳහා නීති අංශය වෙත යොමු කරන ලදී.

### iv. කාර්තුමය වාර්තා

විධාන අංක 12 ට අදාළව 2022 ඔක්තෝම්බර් 06 දිනැතිව සිදු කළ සංශෝධනය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් එක් එක් කාර්තුව අවසන් වී දින 30ක් ඇතුළත සිය කාර්තුමය වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. නියමිත කාලසීමාව තුළ සිය කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ රක්ෂණ සමාගම්වලට එරෙහිව අධීක්ෂණ අංශය විසින් බලාත්මක කිරීමේ උපායමාර්ගයට අනුකූලව සුදුසු පියවර ගෙන ඇත.

2025 වර්ෂය තුළදී, රක්ෂණ සමාගම්වල කාර්යසාධනය ඇගයීම සඳහාත් අදාළ පනතේ විධිවිධාන, රීති සහ රෙගුලාසිවලට අනුකූලතාවය සහතික කිරීම සඳහාත් කාර්තුමය වාර්තා ඉතා සූක්ෂ්ම ලෙස පරීක්ෂාවට ලක් කරන ලදී. වත්කම් සහ බැරකම්, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, (නුබුන්වත්භාවය) ද්‍රවශීලතාවය සහ අනෙකුත් ප්‍රධාන අවදානම් සහිත අංශ විශ්ලේෂණය කිරීම මගින් එක් එක් රක්ෂණ සමාගමේ මූල්‍ය තත්ත්වය කාර්තුමය පදනමින් අඛණ්ඩව නිරීක්ෂණය කරන ලදී. මෙම සමාලෝචනයේදී හඳුනාගත් කිසියම් විෂමතාවයක්, අනනුකූලතාවක් හෝ සැලකිය යුතු වෙනස්කමක් පිළිබඳව අදාළ රක්ෂණ සමාගම වෙත වහාම දැනුම් දුන් අතර නිශ්චිත කාලසීමාවන් තුළ ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ලබා දීමට හෝ නිවැරදි කිරීමේ පියවර ගැනීමට උපදෙස් ලබා දෙන ලදී. තවද, වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය වූ කරුණු, අවශ්‍ය අවස්ථාවලදී නීති අංශය වෙත යොමු කරන ලදී.

රක්ෂණ සමාගම්වල කාර්තුමය කාර්යසාධනය ඇගයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය සඳහා වන වාරික ආදායම, ප්‍රතිරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය විශ්ලේෂණය කරන ලදී. මීට අමතරව, අංශය විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරෙන කාර්තුමය ප්‍රතිලාභ මත පදනම්ව රක්ෂණ සමාගම්වල පූර්ව අනතුරු ඇඟවීම් අනුපාත කාර්තුමය පදනමින් ගණනය කරනු ලබයි. මෙම අනුපාතවලට වාරික වර්ධනය සහ ස්ථායීතාව, හිමිකම් පෑම් අනුපාතය, වියදම් අනුපාතය, රඳවා තබා ගැනීමේ අනුපාතය, ඒකාබද්ධ අනුපාතය, ප්‍රතිරක්ෂණ ප්‍රතිඵල, වත්කම් මත ප්‍රතිලාභ, හිමිකම් මත ප්‍රතිලාභ, ද්‍රවශීලතා අනුපාතය සහ අනෙකුත් ලාභදායීත්වය දර්ශක යනාදිය ඇතුළත් වේ. ප්‍රවණතා සමාගම් මට්ටමින් මෙන්ම කර්මාන්ත මට්ටමින්ද නිරීක්ෂණය කර සංසන්දනය කරන ලද අතර එහිදී අනාවරණය වූ සැලකිය යුතු වෙනස්කම් සහ සමාලෝචනයේදී මතු වූ අනෙකුත් නිරීක්ෂණ රක්ෂණ සමාගම් වෙත වැඩිදුර පරීක්ෂණ සඳහා යොමු කරන ලදී. ප්‍රවණතා සමාගම් මට්ටමින් මෙන්ම කර්මාන්ත මට්ටමින්ද නිරීක්ෂණය කර සංසන්දනය කරන ලද අතර එහිදී අනාවරණය වූ සැලකිය යුතු වෙනස්කම් සහ සමාලෝචනයේදී මතු වූ අනෙකුත් නිරීක්ෂණ රක්ෂණ සමාගම් වෙත වැඩිදුර පරීක්ෂණ සඳහා යොමු කරන ලදී.

රක්ෂණ සමාගම් විසින් තම කාර්තුමය වාර්තා සමග අනුකූලතා සහතික ඉදිරිපත් කිරීම ද අනිවාර්ය වේ. එමගින් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද රීති හා රෙගුලාසි සහ 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අදාළ විධිවිධානවලට අනුකූලව කටයුතු කර ඇති බව තහවුරු කළ යුතුය.

### v. මාසික වාර්තාකරණය

2025 වර්ෂය තුළදී අනුකූලතාවය පිළිබඳ ගැටළු හේතුවෙන් රක්ෂණකරුවන් දෙදෙනෙකු දැඩි අධීක්ෂණයට ලක් කරන ලද අතර ඒ අනුව විධාන අංක 12හි දක්වා ඇති තොරතුරු අවශ්‍යතාවලට අනුකූලව මාසික වාර්තා ඉදිරිපත් කිරීමට ඔවුන්ට නියම කරන ලදී. මෙම ඉහළ නංවන ලද වාර්තාකරණ අවශ්‍යතාවය හේතුවෙන් ඔවුන්ගේ නියාමන අනුකූලතාවය සහ මූල්‍ය තත්ත්වය සමීපව නිරීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට හැකියාව ලැබුණි.

හඳුනාගත් අනනුකූලතාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද උපදෙස් එම රක්ෂණකරුවන් විසින් පිළිපදින ලදී. මාසික වාර්තා සමාලෝචනය කිරීමේ දී මතු වූ නිරීක්ෂණ අදාළ රක්ෂණකරුවන් වෙත නිල වශයෙන් දැනුම් දුන් අතර නිශ්චිත කාලසීමාවන් තුළ නිවැරදි කිරීමේ පියවර ගන්නා ලෙසට ඔවුන්ට උපදෙස් දෙන ලදී. තවදුරටත් නියාමන ක්‍රියාමාර්ග අවශ්‍ය වූ කරුණු, සුදුසු පසු විපරම් කටයුතු සඳහා නීති අංශය වෙත යොමු කරන ලදී.

## 2. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති ප්‍රකාර අනුකූලතාවය සහ බලාත්මක උපායමාර්ගය අධීක්ෂණය කිරීම

2015 දී ප්‍රකාශිත නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති නියමයන්ට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ සමාගමක්ම 120%ක අවම ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතයක් සහ රු.මි. 500ක මුළු ලබා ගත හැකි ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු අතර එම ගණනය කිරීම් මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන වාර්තා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවදානම් පාදක ප්‍රාග්ධන නියමයන්ට දක්වන අනුකූලතාවය විශ්ලේෂණය කරනු ලබයි. අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා නොමැති අවස්ථාවල දී සහ ගණනය කිරීම් සාවද්‍ය වන අවස්ථාවල දී නියම කරන ලද කාලයක් ඇතුළත අනුකූලතාවයන් සපුරා ගන්නා ලෙස සහ නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස අදාළ රක්ෂණකරුවන් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දෙනු ලැබේ.

නුබුන්වත් සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීතිවල නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්තා ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට රක්ෂණකරුවෙකු අපොහොසත් වීමේ අවදානමක් ඇති අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවදානම් පාදක ප්‍රාග්ධනයෙහි බලාත්මක කිරීමේ උපාය මාර්ගයට අනුකූල වන ලෙස නියම කිරීම මගින් නිවැරදි කිරීමේ පියවරයන් ක්‍රියාත්මක කරයි. මෙහි අරමුණ වන්නේ ගැටළු විසඳීම සඳහා ප්‍රායෝගික හා ඵලදායී පිළියම් යෙදීමට හැකි වන පරිදි ගැටළුසහගත රක්ෂණ සමාගම් මුල් අවධියේදී ම හඳුනාගැනීමයි. මෙමගින් අදාළ රක්ෂණ සමාගම්වල මූල්‍ය තත්වය හෝ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු ලෙස පහළ යාමට පෙර තම අධීක්ෂණ මැදිහත්

වීම් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ඉඩ සැලසෙන අතර ඇති විය හැකි අර්බුධය මගහරවා ගැනීමට හැකිවේ

සමාලෝචිත වර්ෂය තුළදී රක්ෂණකරුවන් දෙදෙනෙක් ඔවුන්ගේ පවතින මුළු ප්‍රාග්ධනය අවම නියාමන අවශ්‍යතාවය වන රුපියල් මිලියන 500 ට වඩා අඩු මට්ටමක පවතින බව වාර්තා කළහ. මින් එක් රක්ෂණකරුවෙකු එම වසර තුළදීම සිය ප්‍රාග්ධන මට්ටම යථා තත්ත්වයට පත් කර ගනිමින් අනුකූලතාවය සපුරා ගත් අතර අනෙක් රක්ෂණකරු වසර අවසානය වන විටත් නියමිත සීමාවට වඩා අඩු මට්ටමක පසුවූ බැවින් අඛණ්ඩව අධීක්ෂණයට යටත් විය.

මීට අමතරව, එක් රක්ෂණකරුවෙකුගේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතය 160%ට වඩා අඩු මට්ටමක පවතින බව වාර්තා වූ අතර ඒ අනුව එම සමාගම නියාමන බලාත්මක කිරීමේ නිරීක්ෂණ මට්ටමට ඇතුළත් වියි කෙසේ වෙතත්, එම රක්ෂණකරු වසර තුළදී සාර්ථකව සිය ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතය අනුපාතය ඉහළ නංවා ගනිමින් නැවතත් අනුකූලතාවය ලබා ගත්තේයි තවද, තවත් එක් රක්ෂණකරුවෙකු අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන 120%ට වඩා අඩු ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතයක් වාර්තා කළ අතර වසර අවසානය වන විටත් අනුකූලතාවය සපුරා නොතිබුණි. කාලෝචිත නිවැරදි කිරීමේ පියවර ගැනීම සහතික කිරීම සඳහා මෙම රක්ෂණකරු අඛණ්ඩව දැඩි අධීක්ෂණය යටතේ පසුවේ.

## 3. ආයෝජන පිරිවිතරයන්ට අනුකූල වීම පිළිබඳ නිරීක්ෂණය කිරීම

### i. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

සියළු ම රක්ෂණ සමාගම් තම රක්ෂණ අරමුදල්වලින් කොටසක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව තාක්ෂණික සංචිතවලින් 20%ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම්වලින් 30%ට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුයි මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් එකී විධිවිධානවලට අනුකූලව කටයුතු කර ඇත්දැයි යන්න වාර්තා හා අදාළ ලේඛන මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කරනු ලබයි.

නිරීක්ෂණය කරනු ලබන දෝෂ සහ නියාමන අවශ්‍යතාවන්ගෙන් බැහැර වීම් නියම කරනු ලබන කාල සීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාළ ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

### ii. විධාන අංක 1 අනුව කෙරෙන අනෙකුත් ආයෝජන

2011 මාර්තු 1 දින දරණ විධාන අංක 01 සහ පසුව කළ සංශෝධනවලට අදාළ වන පරිදි සියළු ම රක්ෂණ සමාගම් තමන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව පවතින වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව පවතින වත්කම් ආයෝජනය කළ යුතුය. විධාන අංක 01 හි අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා ඉදිරිපත් කරන වාර්තා මත පදනම්ව තාක්ෂණික සංචිතයට අදාළව සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ ආයෝජන විස්තර මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබයි.

වසර තුළදී රක්ෂණකරුවන් තිදෙනෙකු විසින් විධාන අංක 01 හි විධිවිධාන උල්ලංඝනය කර ඇති බවත් ඒවායින් බැහැරව කටයුතු කර ඇති බවත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් හඳුනා ගන්නා ලදී. අදාළ රක්ෂණකරුවන් වෙත ඒ පිළිබඳව වහාම දැනුම් දුන් අතර නියමිත කාලසීමාවන් තුළ අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. පසුව සියළුම රක්ෂණකරුවන් එම දෝෂ නිවැරදි කර අදාළ ආයෝජන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළහ.

## 4. රක්ෂණ සමාගම්හි ස්ථානීය අධීක්ෂණය

2025 වර්ෂය තුළදී රක්ෂණකරුවන්ගේ කාර්යසාධනය, මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ අභ්‍යන්තර පාලන රාමු ඇගයීම සඳහා අධීක්ෂණ අංශය විසින් ස්ථානීය පරීක්ෂණ පහක් සිදු කරන ලදී. මෙම පරීක්ෂණ ප්‍රධාන වශයෙන් ආයෝජන කළමනාකරණය, මෙහෙයුම් ක්‍රියාවලීන්, මූල්‍ය තත්ත්වය, ව්‍යවසාය අවදානම් කළමනාකරණය සහ ආයතනික පාලන පිළිවෙත් කෙරෙහි අවධානය යොමු කර ඇත.

මෙම පරීක්ෂණවලදී මතු වූ නිරීක්ෂණ සහ ප්‍රධාන සොයාගැනීම්, වැඩිදියුණු කළ යුතු අංශ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දුන් නිර්දේශ ද සමගින් අදාළ රක්ෂණකරුවන් වෙත නිළ වශයෙන් දැනුම් දෙන ලදී. රක්ෂණකරුවන්ට නිශ්චිත කාලසීමාවන් තුළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සහ එහි ප්‍රගතිය කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට නියම විය.

ස්ථානීය පරීක්ෂණවල සොයාගැනීම් අනුව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වූ අවස්ථාවලදී අදාළ නීතිමය සහ අධීක්ෂණ රාමුවට අනුකූලව සුදුසු නියාමන පියවර ගැනීම සඳහා එම කරුණු නීති අංශය වෙත යොමු කරන ලදී.

## සංඛ්‍යාන වාර්තාකරණය සහ අනෙකුත් ක්‍රියාකාරකම්

### 1. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2024

කර්මාන්ත අත්පොත මගින් රක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දළ විශ්ලේෂණයක් සපයනු ලබන අතර වෙළඳපල පුරා පවතින ප්‍රවණතා මෙන්ම තනි තනි සමාගම්වල කාර්යසාධනය ද ඉදිරිපත් කරනු ලබයි. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සහ ජනගහන ප්‍රවණතා වැනි පුළුල් සාර්ව ආර්ථික සන්දර්භය තුළ රක්ෂණ වාරික ආදායම, වර්ධන වේගය, රක්ෂණ වෙළඳපල විනිවිද යාම සහ රක්ෂණ ඝනත්වය ඇතුළු ප්‍රධාන කර්මාන්ත දර්ශක එහි දක්වා ඇත. තවද, මෙම විශ්ලේෂණය මගින් මුළු වත්කම්, වත්කම් බෙදා හැරීම දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ අංශවල ලාභදායිත්වය, කොටස් හිමියන්ගේ අරමුදල්, හිමිකම් පෑමේ අත්දැකීම් මෙන්ම ශාඛා සංඛ්‍යාව, සේවකයින් සහ නියෝජිතයින් ඇතුළත් මෙහෙයුම් දත්ත ද විග්‍රහ කරනු ලබයි.

සමාගම් මට්ටමින් ගත් කල, මෙම අත්පොත 2020 සිට 2024 දක්වා කාලය තුළ එක් එක් රක්ෂණ නිෂ්පාදන පෙළ සඳහා දළ ලිඛිත වාරික, වෙළඳපල කොටස සහ අංශ මට්ටමින් ලබා දුන් දායකත්වය ආවරණය කරමින් සවිස්තරාත්මක කාර්යසාධන තක්සේරුවක් ලබා දෙයි. බලාත්මකව පවතින ඔප්පු, අලුතින් නිකුත් කරන ලද ඔප්පු සහ වර්ධනය සඳහා

එක් එක් නිෂ්පාදනවල දායකත්වය එමගින් නිරීක්ෂණය කරනු ලැබේ. මෙම වාර්තාව මගින් ප්‍රතිරක්ෂණ සැකසුම්, රඳවා ගැනීමේ මට්ටම් සහ හිමිකම් පෑමේ අත්දැකීම් ඇතුළු අවදානම් කළමනාකරණ පිළිවෙත් මෙන්ම වියදම් විශ්ලේෂණය සහ ඒකාබද්ධ අනුපාත හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව ද ඇගයීමට ලක් කරයි.

එක් එක් රක්ෂණ සමාගමේ මූල්‍ය යහපැවැත්ම, වත්කම් සංකේන්ද්‍රණය, ණය ගුණාත්මකභාවය, නුබුන්වත් ක්‍රියාමාර්ග (පවතින මුළු ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ප්‍රමාණය අනුපාතය) සහ නියාමන අනුකූලතාවය (අවධානම්පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවය) ඇසුරින් පරීක්ෂා කරනු ලැබේ. ජීවිත රක්ෂණ සමාගම් සඳහා ගෙවන ලද ප්‍රතිලාභ සහ රක්ෂණ ඔප්පු අවලංගු වීම වැනි දර්ශක ද මීට ඇතුළත් වේ. මෙම තොරතුරු 2023-2024 වර්ෂ සඳහා වන සවිස්තරාත්මක ශේෂ පත්‍ර සහ ආදායම් ප්‍රකාශන මගින් තවදුරටත් පූරණය වන අතර එමගින් සමස්ත කර්මාන්තයේ කාර්යසාධනය සහ තනි තනි සමාගම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ පූර්ණ හා ඒකාබද්ධ දැක්මක් ලබා දෙයි.

## 2. මුදල් අමාත්‍යාංශය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

අධීක්ෂණ අංශයේ ප්‍රගතිය, ප්‍රතිඵල සහ ප්‍රධාන ජයග්‍රහණ ගෙනහැර දක්වමින් එම අංශය විසින් සවිස්තරාත්මක කාර්තුමය වාර්තාවක් පිළියෙළ කරනු ලබන අතර එය මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ මෙම වාර්තාව මගින් අදාළ කාර්තුව තුළ සිදු කරන ලද නියාමන සමාලෝචන, පරීක්ෂණ, අනුකූලතාවය නිරීක්ෂණය කිරීම, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සහ අනෙකුත් වැදගත් වර්ධනයන් ඇතුළු අධීක්ෂණ ක්‍රියාවලීන් පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් සපයයි.

## 3. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ක්‍රියාත්මක කිරීම

ගෝලීය ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ වර්ධනයට ප්‍රතිචාර වශයෙන් විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 - රක්ෂණ ගිවිසුම් පිළිබඳ ප්‍රමිතිය නිකුත් කිරීමත් සමඟ, ශ්‍රී ලංකා වරලත්ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා නියාමන බලධාරීන් සහ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමඟ සක්‍රීයව සම්බන්ධ විය. සමාගම් මුහුණ දෙන ප්‍රායෝගික අභියෝග හඳුනා ගනිමින්, පාලක සභාව විසින් සංශෝධිත බලාත්මක වීමේ දිනයක් අනුමත කරන ලද අතර ඒ අනුව 2026 වර්ෂයේදී ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ක්‍රියාත්මක කිරීමට නියම කරන ලදී. 2025 වර්ෂය තුළදී, බහුජාතික රක්ෂණ සමාගම් තුනක් සාර්ථකව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ක්‍රියාත්මක කළ අතර අනෙකුත් රක්ෂණකරුවන්ගේ සූදානම නිරීක්ෂණය කිරීමට සහ නව වාර්තාකරණ ප්‍රමිතිය වෙත බාධාවකින් තොරව මාරු වීම සඳහා ඔවුන්ගෙන් ප්‍රගති වාර්තා ලබා ගන්නා ලදී. එම තොරතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත ද දැනුම් දෙන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 ට අනුකූලව නියාමන වාර්තාකරණ ආකෘතියක් සකස් කර ඇති අතර ඒ පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා එය රක්ෂණ ක්ෂේත්‍රය වෙත යොමු කර ඇත.

## 4. අවදානම් මෙවලම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිය අවදානම් පාදක අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර අවදානම් තක්සේරු මෙවලමක් සකස් කර ඇත. මෙම මෙවලමෙහි මූලික පරමාර්ථය වන්නේ රක්ෂණ සමාගම් තුළ පවතින අවදානම් ක්‍රමවත්ව හඳුනා ගැනීම, මැන බැලීම, නිරීක්ෂණය කිරීම සහ අවම කිරීම සඳහා පහසුකම් සැලසීමයි. එමගින් රක්ෂණ ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

මෙම තක්සේරුව රක්ෂණකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය සහ අනෙකුත් අදාළ තොරතුරු භාවිතා කරමින් වාර්ෂිකව සිදු කරනු ලැබේ. අධීක්ෂණ අත්දැකීම්, වැඩිදියුණු කළ යුතු යැයි හඳුනාගත් අංශ සහ ක්ෂේත්‍රය තුළ මතුවන අලුත් ප්‍රවණතා මත පදනම්ව මෙම තක්සේරු නිර්ණායක වරින් වර සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලබයි. මෙම මෙවලම පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයක් ලෙස ද ක්‍රියා කරන අතර එමගින් ඉහළ අවදානම් සහිත රක්ෂණ සමාගම් කල්තියා හඳුනා ගැනීමටත්, ක්‍රියාකාරී ලෙස අධීක්ෂණ මැදිහත්වීම් සිදු කිරීමටත් අවස්ථාව සැලසේ.

දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා අවදානම් ගැනීමේ හැකියාව ඇගයීම වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලබන අතර ඒ සඳහා අවදානම් තක්සේරු සාරාංශ, නුබුන්වත්භාවය පිළිබඳ වාර්තා, මූල්‍ය ප්‍රකාශන සහ ස්ථානීය පරීක්ෂණ සොයාගැනීම්වලින් ලබාගත් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පරාමිතීන් ඇතුළත් කරගනු ලැබේ.

ප්‍රධාන ප්‍රමාණාත්මක දර්ශක අතරට ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, වත්කම්වල ගුණාත්මකභාවය, අදාළ පාර්ශවයන්ට ඇති නිරාවරණය සහ සමස්ත ව්‍යාපාරික හා මෙහෙයුම් කාර්යසාධනය ඇතුළත් වේ. මීට අමතරව, හිමිකාරිත්ව ව්‍යුහය, සමූහ ව්‍යුහය, ආයතනික පාලන රාමුව, අවදානම් කළමනාකරණ පද්ධතිවල ඵලදායීතාවය, අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත්භාවය, ප්‍රතිරක්ෂණ විධිවිධාන සහ හිමිකම් කළමනාකරණ පිළිවෙත් වැනි ගුණාත්මක සාධක ද සර්ව සම්පූර්ණ ලෙස ඇගයීමට ලක් කෙරේ.

සමස්ත අවදානම් ලකුණු මත පදනම්ව, රක්ෂණකරුවන් "ඉහළ" "මධ්‍යම" හෝ "අඩු" අවදානම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. අධීක්ෂණ අංශය විසින් එක් එක් රක්ෂණකරුගේ වාර්ෂික කාර්යසාධනය සහ අවදානම් පැතිකඩ භාවිතා කරමින් ඔවුන්ට අදාළ අවදානම් කාණ්ඩය තීරණය කරනු ලැබේ. "ඉහළ අවදානම්" ලෙස වර්ගීකරණය කර ඇති රක්ෂණකරුවන් වැඩි දියුණු කළ නිරීක්ෂණයට සහ සමීප අධීක්ෂණයට යටත් වේ. අධීක්ෂණයේ තීව්‍රතාවය සහ සමාගමට විශේෂිත වූ නියාමන අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම, තක්සේරු කරන ලද අවදානම් මට්ටමට සමානුපාතික වන අතර එමගින් වඩාත් ඉලක්කගත සහ ඵලදායී අධීක්ෂණ ප්‍රවේශයක් සහතික කෙරේ.

### 5. යෝජිත සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී විසින් ඇලියන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් අත්පත් කර ගැනීම

වසර තුළදී, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී ආයතනය විසින් කොටස් මිලදී ගැනීමේ ගනුදෙනුවක් හරහා අලයන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් හි 100% ක කොටස් හිමිකාරිත්වය අත්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් නියාමන අනුමැතිය ඉල්ලා සිටියේය.

අධීක්ෂණ අංශය විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කරන ලද අතර එහිදී අත්පත් කර ගන්නා සමාගමේ මූල්‍ය තත්ත්වය සහ යෝජිත ඒකාබද්ධ ආයතනයේ තිරසාරභාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙම ඇගයීමට අරමුදල් සපයා ගන්නා මාර්ග අත්පත් කර ගැනීමෙන් පසු සහ ඒකාබද්ධ වීමෙන් පසු අවස්ථාවන් යටතේ කාර්තුමය මූල්‍ය හා නුබුන්වත් ප්‍රක්ෂේපණයන් ඇතුළු ප්‍රධාන අංශ ඇතුළත් විය.

පවතින මුළු ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ප්‍රමාණය අනුපාතය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සියළුම අදාළ විධානයන්ට සහ නියෝගවලට අනුකූල වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

මෙම සමාලෝචනයේ අරමුණ වූයේ යෝජිත ගනුදෙනුව මගින් අත්පත් කර ගන්නා සමාගමේ හෝ ඒකාබද්ධ වූ ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වයට හානියක් නොවන බව සහතික කිරීමයි. එමගින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ සමස්ත වෙළඳපල ස්ථාවරත්වය පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ.

### 6. රක්ෂණ මූලික මූලධර්ම 8 - අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන් මත පදනම්ව රක්ෂණ සමාගම් සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම

2024 වර්ෂයේදී, පවතින අධීක්ෂණ සහ නියාමන රාමුවල ඵලදායීතාවය ඇගයීමට සහ වැඩිදියුණු කළ යුතු අංශ හඳුනා ගැනීමට අධීක්ෂණ අංශය විසින් රක්ෂණ මූලික මූලධර්ම 8 සම්බන්ධයෙන් පරතර විශ්ලේෂණයක් සිදු කරන ලදී. මෙම ඇගයීමේ සොයාගැනීම් මත පදනම්ව, අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම, අභ්‍යන්තර පාලන රාමු ඉහළ නැංවීම සහ රක්ෂණකරුවන් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා 2025 වසරේදී අංශය විසින් සවිස්තරාත්මක මාර්ගෝපදේශයක් සකස් කරන ලදී.

ශක්තිමත් අවදානම් කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීමට රක්ෂණකරුවන්ට සහාය වීම සඳහා සහ රක්ෂණ ක්ෂේත්‍රය පුරා යහපත් ආයතනික පාලනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම මාර්ගෝපදේශය ප්‍රධාන මෙවලමක් ලෙස භාවිත වේ.

### 7. රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAIS) රක්ෂණයේ මූලික මූලධර්මය (ICP) 10 පිළිබඳ සමියුරු සමාලෝචන ක්‍රියාවලිය

වසර තුළදී, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධීක්ෂණ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමය විසින් නිර්මාණය කරන ලද තක්සේරු උපාය මාර්ග යේ කොටසක් වන රක්ෂණයේ මූලික මූලධර්මය 10 සම්බන්ධ අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ සමියුරු සමාලෝචනයක් සිදු කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ අධීක්ෂණ සහ නියාමන රාමුවල යම් දුර්වලතා හෝ හිඩැස්වල ස්වභාවය සහ ප්‍රමාණය හඳුනා ගැනීම සහ වත්මන් අධීක්ෂණ ධාරිතා මට්ටම සහ අනාගත අධීක්ෂණ සංවර්ධනයේ ප්‍රමාණය පිළිබඳ තොරතුරු සැපයීමයි.

### 8. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමයේ රක්ෂණ මූලික මූලධර්ම අංක 16 පිළිබඳ ස්වයං-සමාලෝචනය

2025 වර්ෂයේදී, අධීක්ෂණ අංශය විසින් රක්ෂණ මූලික මූලධර්ම අංක 16 - නුබුන්වත් අවශ්‍යතා සඳහා වන ව්‍යවසාය අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් පරතර විශ්ලේෂණයක් සිදු කරන ලදී. මෙම ඇගයීමේ අරමුණ වූයේ අදාළ අධීක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීමේ මට්ටම ඇගයීම සහ වැඩිදියුණු කළ යුතු අංශ හඳුනා ගැනීමයි. මෙම ක්‍රියාවලියට පවතින නියාමන සහ අධීක්ෂණ රාමුව රක්ෂණ මූලික මූලධර්ම අංක 16 හි අවශ්‍යතා සමග සන්සන්දනය කිරීම, වත්මන් භාවිතයන්හි ඵලදායීතාවය ඇගයීම සහ කිසියම් අඩුපාඩු හෝ දුර්වලතා හඳුනා ගැනීම ඇතුළත් විය. මෙම පරතර විශ්ලේෂණයේ සොයාගැනීම්, ඉලක්කගත ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රතිපත්තිමය වැඩිදියුණු කිරීම් සකස් කිරීම සඳහා පදනම වනු ඇති අතර එමගින් සමස්ත අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර හොඳම පිළිවෙත් සමග අනුකූල වීම සහතික කෙරේ.

### 9. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

2025 දී, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි පහත තොරතුරු ඉදිරිපත් කරන ලදී.

අ) කාර්තුමය වාර්තාවලින් සසඳන ලද සංඛ්‍යානමය සහ අනෙකුත් තොරතුරු මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ සාර්ව විචක්ෂණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා කාර්තුමය පදනමින්.

ආ) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ රක්ෂණ කර්මාන්ත පරිශිෂ්ඨය සඳහා රක්ෂණ ක්ෂේත්‍ර තොරතුරු වාර්ෂික පදනමින්.

ඇ) මහ බැංකුව විසින් සකස් කරන ලද පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තුවල තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා වාරික ආදායම, ගෙවන ලද හිමිකම් සහ වෙනත් ආදායම් පිළිබඳ පළාත් දත්ත.

ඈ) මහ බැංකුව විසින් සිදු කරනු ලබන ඒකාබද්ධ අධීක්ෂණ කටයුතු පහසු කිරීම සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම.

# ආයුගණක ඒකක සමාලෝචනය

ශක්තිමත් විචක්ෂණශීලී නියාමන රාමුවක සහාය ඇතිව රක්ෂණකරුවන් පිළිබඳ දැඩි අධීක්ෂණය හරහා ඔරොත්තු දෙන සහ ස්ථාවර රක්ෂණ කර්මාන්තයක් ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කැපවී සිටියි. ආයුගණක දෘෂ්ටිකෝණයකින් නියාමන සහ අධීක්ෂණ ප්‍රමිතීන් සහතික කිරීම මගින් මෙම ක්‍රියාවලිය තුළ ආයුගණක ඒකකය අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නියාමන අනුකූලතාවය නිරීක්ෂණය කිරීම, ප්‍රධාන වශයෙන් ස්ථානීය සහ ස්ථානීය නොවන විශ්ලේෂණයන් හරහා මූල්‍ය පරීක්ෂණ සිදු කිරීම සහ ආයුගණක ප්‍රතිපාදනවල ප්‍රමාණවත්භාවය හා ක්‍රමවේදයන්හි නිවැරදිභාවය ඇගයීම මගින් මෙම ඒකකය රක්ෂණ වෙළඳපල ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරයි. එමෙන්ම, කර්මාන්තය පුරා අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතා ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමටත්, අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීමට හා නිර්දේශ කිරීමටත්, අඛණ්ඩ සම්බන්ධතාවයකින් නිරත වෙමින් රක්ෂණකරුවන්ගේ ආයුගණක කාර්යයන්හි කාර්යක්ෂමතාව සහ වාර්තාකරණයේ ගුණාත්මකභාවය ඇගයීමටත් ඒකකය කටයුතු කරයි. මීට අමතරව, රක්ෂණ ඔප්පු හිමියන්ගේ පිළිබැඳියාවන් ප්‍රමාණවත් පරිදි සුරක්ෂිත කර ඇති බව සහතික කිරීම සඳහා දීර්ඝකාලීන රක්ෂණ නිෂ්පාදනවල ආයුගණක සහතික සමාලෝචනය කිරීමද මෙම ඒකකය මගින් ඉටු කරයි.

## රක්ෂණ සමාගම්වල පිළිබඳ සිදුකරන සාමාන්‍ය අධීක්ෂණය

### ව්‍යවස්ථාපිත වාර්තා - කාර්තුමය වාර්තා - රක්ෂණ ඔප්පු වගකීම්, ආයුගණක සාරාංශ සහ සංචිත වාර්තා සමාලෝචනය කිරීම

රක්ෂණ සමාගම්හි ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ මට්ටම් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2016 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රාමුව ක්‍රියාත්මක කරන ලදී. පනතේ 26 (1), 47 (1) සහ 56 යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලද අංක 14 දරන විධානය සහ පනතේ 48 (1) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද අංක 15 දරන විධානයට අනුව ලියාපදිංචි සියළුම රක්ෂණ සමාගම් වාර්ෂික ව්‍යවස්ථාපිත වාර්තා ඉදිරිපත් කිරීමට බැඳී සිටියි. පනතේ 49 (ඩී) වගන්තිය යටතේ නිකුත් කරන ලද අංක 12 දරන විධානය ප්‍රකාරව කාර්තුමය වාර්තා ඉදිරිපත් කළ යුතුය.

සිය විෂය පථයට අදාළ ආයුගණක හැකියාවන් තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා 2024 අගෝස්තු 1 වන දින සිට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් Willis Towers Watson India Private Limited (WTW) ආයතනය වසර දෙකක උපදේශන සේවාවක් සඳහා සම්බන්ධ කරගෙන ඇත. මේ යටතේ එම ආයතනයේ ආයුගණකඥයින් දෙදෙනෙකු අනුයුක්ත කර ඇති අතර මෙමගින් රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධීක්ෂණ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සහ රක්ෂණ ක්ෂේත්‍රය තුළ වඩාත් ශක්තිමත් නියාමන ක්‍රියාවලියක් පවත්වාගෙන යාම අපේක්ෂා කෙරේ.

WTW ආයතනයේ ආයුගණකඥයින් අනුයුක්ත කිරීමෙන් පසුව රක්ෂණ සමාගම් ඉදිරිපත් කරන දත්ත සහ වාර්තා ඇගයීම ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණය යන දෙඅංශය සඳහාම සවිස්තරාත්මක සමාලෝචන පරීක්ෂාවන් හඳුන්වා දෙන ලදී. මෙම පරීක්ෂාවන්ට අවදානම් පාදක ප්‍රාග්ධන නුබුන්වත් ආකෘති පත්‍රවල ඇති සියළුම ප්‍රමාණාත්මක දත්ත සත්‍යාපනය කිරීම, කාර්තුමය සහ වාර්ෂික ප්‍රශ්නාවලි සඳහා ලබා දී ඇති ප්‍රතිචාර සවිස්තරාත්මකව විශ්ලේෂණය කිරීම, රක්ෂණ සමාගම්වල මූල්‍ය යහපැවැත්ම පිළිබඳ ගුණාත්මක ඇගයීම් සිදු කිරීම සහ සැලකිය යුතු වෙනස්කම් හඳුනා ගැනීම සඳහා වර්තමාන දත්ත පෙර තක්සේරු කිරීම් සමඟ සංසන්දනය කිරීම ඇතුළත් වේ. මෙම ප්‍රමිතිගත සමාලෝචන රාමුව මගින් එක් එක් රක්ෂණ සමාගමෙහි ඓතිහාසික සහ වත්මන් දත්ත ඒකාබද්ධ කෙරෙන අතර එමගින් දත්තවල පවතින අඩුපාඩු හඳුනා ගැනීම, ප්‍රවණතා විශ්ලේෂණය සහ ප්‍රධාන මූල්‍ය මිතික ඇතුළත් සාරාංශගත දත්ත පුවරු හරහා වඩාත් කේන්ද්‍රීය පරීක්ෂාවන් සිදු කිරීමට හැකි වේ. තවද, අභ්‍යන්තර පිරික්සුම් ලැයිස්තු සහ දත්ත පුවරු මගින් රක්ෂණ සමාගම්වල ඇති විය හැකි අවදානම්සහගත තත්ත්වයන් කල්තියා හඳුනා ගැනීමට සහාය වේ.

සමාලෝචිත වර්ෂය තුළදී දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙතින් ආයුගණක වාර්තා සහ සාරාංශ 16 ක්, සංචිත වාර්තා 14 ක් සහ කාර්තුමය වාර්තා 120 ක් (එක් කාර්තුවකට ව්‍යවස්ථාපිත වාර්තා 30 බැගින්) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ලැබී ඇත.

## රක්ෂණ සමාගම්වල ස්ථානීය අධීක්ෂණ කටයුතු

සමාලෝචිත වර්ෂය තුළ අංශයේ අධීක්ෂණ කටයුතුවල කොටසක් ලෙස එහි ප්‍රථම ස්ථානීය පරීක්ෂාව සිදු කරන ලදී. මෙම පරීක්ෂාව WTW ආයතනයේ ආයුගණකඥයින්ගේ සහාය ඇතිව සිදු කරන ලද අතර එහිදී අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි සහ ප්‍රවේශයන් ස්ථාපිත අධීක්ෂණ ප්‍රමිතීන් හා ක්‍රමවේදයන්ට අනුකූලව සකස් කරන ලදී. ස්ථානීය පරීක්ෂාව සඳහා රක්ෂණ ආයතන තෝරා ගැනීම අවදානම් පාදක අධීක්ෂණ රාමුවක් මත සිදු කරන ලදී. එහිදී, ස්ථාපිත අවදානම් තක්සේරු කිරීමේ නිර්නායකයක් භාවිතා කරමින් ආයතන හඳුනාගත් අතර වැඩිදුර අධීක්ෂණ අවධානයක් අවශ්‍ය බවට තීරණය කරන ලද ආයතන සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

මෙම පරීක්ෂණයේ අරමුණ වූයේ රක්ෂණ සමාගමේ ක්‍රියාකාරිත්වය පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර ඔස්සේ ඇගයීමට ලක් කිරීමයි:

අ) 2015 අවදානම් පාදක ප්‍රාග්ධන රීතිවලට අනුකූල වීම.

ආ) ආයුගණක කාර්යයන් සඳහා අදාළ වන නියෝග, චක්‍රලේඛ සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම.

ඇ) ආයතනය තුළ පවතින පොදු තත්ත්ව පාලන සහ චර්යා ධර්ම යාන්ත්‍රණයන්ගේ ස්වභාවය.

ඒ අනුව, තෝරාගත් එක් ජීවිත රක්ෂණ සමාගමක ස්ථානීය පරීක්ෂාවක් පවත්වන ලදී. රක්ෂණ ක්ෂේත්‍රයේ අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ එහි ආරක්ෂාව, යහපැවැත්ම මෙන්ම ඵලදායී ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වන අඛණ්ඩ අධීක්ෂණ ප්‍රයත්නයන්හි කොටසක් ලෙස මෙම කටයුත්ත සිදු කරන ලදී.

## දිගුකාලීන රක්ෂණ නිෂ්පාදනවල ආයුගණක සහතික සමාලෝචනය කිරීම

2021 අංක 1 දරන චක්‍රලේඛයට අනුව පනතේ 37 (1) වගන්තියේ සඳහන් පරිදි රක්ෂණ සමාගම් විසින් නව රක්ෂණ නිෂ්පාදනයක් හඳුන්වා දීමට අපේක්ෂිත දිනය පිළිබඳව රක්ෂණ නියාමන කොමිෂන් සභාව දැනුවත් කළ යුතු අතර එම නිෂ්පාදනයේ විස්තර ගොනු කළ යුතුය. සමාලෝචිත වර්ෂය තුළ, මෙම ඒකකය විසින් රක්ෂණ නිෂ්පාදන සහ අතිරේක ආවරණ සමාලෝචනය කරන ලද අතර එහි නියමයන් සහ කොන්දේසි සාධාරණ හා අපක්ෂපාතී බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව ඉන් 13 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මෙම ක්‍රියාවලිය තුළ අවශ්‍ය අවස්ථාවලදී සමාගම්වලින් පැහැදිලි කිරීම් ලබාගත් අතර අවසන් තීරණ ගැනීමට පෙර ඔවුන්ගේ ප්‍රතිචාර කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙහිදී, රක්ෂණ නිෂ්පාදනවල ලක්ෂණ සහ මිල නියම කිරීමේ ප්‍රවේශයන් දැනට පවතින මිල නියම කිරීමේ රෙගුලාසි සමග අනුකූලදැයි පරීක්ෂා කිරීම, මිල නියම කිරීමේදී භාවිතා කර ඇති උපකල්පනවල යෝග්‍ය බව ඇගයීම, ආයතනික අභ්‍යන්තර ඉලක්කයන්ට සාපේක්ෂව එම නිෂ්පාදනවල ලාභදායීතාවය තක්සේරු කිරීම සහ හඳුනාගත් අවදානම් සංවේදීතාවන් සඳහා පවතින අවදානම් කළමනාකරණ පද්ධති ඇගයීම සිදු කරනු ලැබේ.

## 2015 අවදානම් පාදක ප්‍රාග්ධන රීතිවල වැඩිදියුණු කිරීම් සිදු කිරීම

රක්ෂණ ක්ෂේත්‍රයේ නුබුන්වත්භාවය හෙවත් වගකීම් පියවීමේ හැකියාව පිළිබඳ රාමුව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව දරන උත්සාහයේ කොටසක් ලෙස 2016 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ 2015 අවදානම් පාදක ප්‍රාග්ධන රීති අඛණ්ඩව සමාලෝචනයට භාජනය කෙරේ. මීට පෙර සිදු කරන ලද ඇගයීම් සහ සාකච්ඡා පදනම් කරගනිමින්, මෙම වැඩපිළිවෙළ සමාලෝචිත වර්ෂය තුළදී පවතින අඩුපාඩු හඳුනාගැනීමේ මට්ටමේ සිට විධිමත් උපදේශන සහ ප්‍රමාණාත්මක පරීක්ෂණ මට්ටම දක්වා ප්‍රගතියක් ලබා ඇත. පවතින අවදානම් පාදක ප්‍රාග්ධන රීතිවල ඇති අඩුපාඩු පිළිබඳව පෙර වසරවලදී සිදු කරන ලද සවිස්තරාත්මක ඇගයීමකින් අනතුරුව මෙම සමාලෝචන ක්‍රියාවලියට සහාය වීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි නායකත්වයෙන් යුත් ඒකාබද්ධ කමිටුවක්/කාර්ය සාධක බලකායක් පිහිටුවන ලදී. මෙම කමිටුව/කාර්ය සාධක බලකාය, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් ආයුගණක සහ වෙළඳපොළ පළපුරුද්දක් ඇති විශේෂඥයන්ගෙන් මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL), ශ්‍රී ලංකා ආයුගණකඥයින්ගේ සංගමය (AASL), ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත වේ. හඳුනාගත් අඩුපාඩු ඇගයීම, ජාත්‍යන්තර භාවිතයන් කෙරෙහි අවධානය යොමු කිරීම සහ අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව සඳහා සුදුසු සංශෝධන නිර්දේශ කිරීම මෙම කමිටුවේ වගකීම වේ.

වසර තුළදී, කාර්ය සාධක බලකාය සිය කටයුතු නිම කර අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව, ජාත්‍යන්තර වෙළඳපලේ අවදානම් පාදක ප්‍රාග්ධන භාවිතයන් සහ ශ්‍රී ලංකා රක්ෂණ වෙළඳපොළට ඒවායේ ඇති අදාළත්වය විශ්ලේෂණය කරමින් සකස් කරන ලද උපදේශන පත්‍රිකාවක් මහජන අදහස් විමසීම සඳහා නිකුත් කරන ලදී. යෝජිත අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව පිළිබඳව මහජන අදහස් විමසන ලද අතර එහිදී ලැබුණු සියළුම අදහස් හා යෝජනා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සමාලෝචනය කර ඊට අදාළ ප්‍රතිචාර ප්‍රකාශයට පත් කරන ලදී.

යෝජිත වෙනස්කම්වල බලපෑම තවදුරටත් ඇගයීම සඳහා ප්‍රමාණාත්මක බලපෑම් අධ්‍යයනයක් - (QIS) ආරම්භ කරන ලද අතර නියමිත කාලසීමාව තුළ එහි ප්‍රතිඵල ඉදිරිපත් කරන ලෙස රක්ෂණ සමාගම්වලින් ඉල්ලා සිටින ලදී. මෙම QIS ක්‍රියාවලිය මගින් හඳුනාගත් වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර සඳහා විවිධ විසඳුම් පරීක්ෂාවට ලක් කෙරෙන අතර රක්ෂණ සමාගම්වල වගකීම් තක්සේරු කිරීම් සහ නුබුන්වත් තත්ත්වයන් කෙරෙහි ඉන් ඇති වන බලපෑම් පිළිබඳ ප්‍රමාණාත්මක ඇගයීමක් කරනු ලැබේ. තවද, මෙම අභ්‍යාසය රක්ෂණ සමාගම්වලට ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් සහ ආකෘති නැවත සකස් කිරීමට සහාය වන අතර විකල්ප නියාමන ප්‍රවේශයන් ඇගයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට උපකාරී වේ. එමෙන්ම, මෙය ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි අභියෝග හඳුනා ගැනීම ද මෙහිදී පහසු කරවයි. QIS ප්‍රතිචාර මෙම වර්ෂය තුළ ලබා ගැනීමට මුලින් සැලසුම් කර තිබුණද රක්ෂණ ක්ෂේත්‍රයේ ඉල්ලීම පරිදි එම කාලසීමාව ඊළඟ වසරේ මාර්තු මාසය දක්වා දීර්ඝ කරන ලදී.

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි උපායමාර්ගික දැක්මට සහායවීම: ආයුගණක ඒකකයේ මුලපිරීම්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි 2023-2027 උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත්තේ එහි මූලික වගකීම් වන රක්ෂණ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම යන කාර්යයන් සමග එහි අරමුණු සහ කාර්යභාරයන් ඒකාබද්ධ වන අයුරිනි. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි ආයුගණක ඒකකය ප්‍රධාන උපායමාර්ගික අරමුණු දෙකක් සඳහා වගකීම දරයි. ඒවානම්, ප්‍රතිචාරාත්මක නෛතික සහ නියාමන රාමුවක් සහතික කිරීම සහ ආරක්ෂිත, සාධාරණ සහ ස්ථාවර රක්ෂණ ක්ෂේත්‍රයක් ප්‍රවර්ධනය කිරීමයි.

"ප්‍රතිචාරාත්මක නෛතික සහ නියාමන රාමුවක් සහතික කිරීම" යන උපායමාර්ගික අරමුණ තවදුරටත් සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ඒකකය විසින් රක්ෂණ මූලික මූලධර්ම යටතේ එන ICP 17 ("ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය") සහ ICP 14 ("අධීක්ෂක විසින් නුබුන්වත් අරමුණු සඳහා අවශ්‍ය වත්කම් සහ වගකීම් තක්සේරු කිරීමේ අවශ්‍යතා ස්ථාපිත කරයි") සම්බන්ධයෙන් ස්වයං-ඇගයීම් සහ සවිස්තරාත්මක සමාලෝචන සිදු කරන ලදී. පවතින අධීක්ෂණ සහ නියාමන රාමුවල ඇති දුර්වලතා සහ පරතරයන් හඳුනා ගැනීමටත්, අඛණ්ඩ සංවර්ධන ප්‍රයත්නයන්ට සහාය වීමටත්, අධීක්ෂණ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් මෙම ඇගයීම් සිදු කරන ලදී. මෙම සමාලෝචන කටයුතු පෙර වසරවලදී නිම කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගත් දුර්වලතා සහ පරතරයන් මත පදනම්ව ඉලක්කගත නිර්දේශ මාලාවක් සකස් කරන ලදී. ඒ අනුව, එම සුදුසු නිර්දේශයන් අවදානම් පාදක ප්‍රාග්ධන සාකච්ඡා පත්‍රිකා සහ අවදානම් පාදක ප්‍රාග්ධන කාර්ය සාධක බලකායේ අවසන් වාර්තා කෙටුම්පතට ඇතුළත් කරමින්, අවදානම් පාදක ප්‍රාග්ධන රාමුවේ සිදු කෙරෙන අඛණ්ඩ වැඩිදියුණු කිරීම්වලට එක් කරන ලදී.

ආරක්ෂිත, සාධාරණ සහ ස්ථාවර රක්ෂණ ක්ෂේත්‍රයක් ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ගික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ආයුගණක ඒකකය නව රක්ෂණ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම මගින් රක්ෂණ ඔප්පු හිමියන් සහ රක්ෂණ ක්ෂේත්‍රය සුරක්ෂිත

කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, එම ඒකකය විසින් අනෙකුත් දකුණු ආසියානු නියාමන ආයතනවල නව නිෂ්පාදන අනුමත කිරීමේ ක්‍රියාවලීන් සහ මාර්ගෝපදේශ සමාලෝචනය කර ඒවා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පවතින ක්‍රියා පටිපාටි සමග සංසන්දනය කර එම සොයාගැනීම් සවිස්තරාත්මක වාර්තාවක් ලෙස ලේඛනගත කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ මෙම වාර්තාවේ තහවුරු කිරීම සහ වැඩිදියුණු කිරීම් සිදු කරන ලද අතර සුදුසු පරිදි කරුණු ඇතුළත් කරන ලදී. මෙම පදනම මත පිහිටා, විවිධ නිෂ්පාදන කාණ්ඩ යටතේ පවතින රීති සහ නව රක්ෂණ නිෂ්පාදන අනුමත කිරීමේ ක්‍රියා පටිපාටිවල ඇති අඩුපාඩු සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට ඒකකය දැන් කටයුතු ආරම්භ කර ඇත. මෙම ක්‍රියාකාරකම 2026 වසර දක්වා අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂිත අතර එහි අවසාන ප්‍රතිඵලය ලෙස නව නිෂ්පාදන අනුමත කිරීමේ රාමුව ශක්තිමත් කිරීම සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව තවදුරටත් ඉහළ නැංවීම අරමුණු කරගත් සංශෝධිත මාර්ගෝපදේශ සකස් කර නිකුත් කරනු ඇත.

වසර තුළදී, දිගුකාලීන රක්ෂණ නිෂ්පාදන සඳහා වන ආයුගණක සහතික කිරීම් සම්බන්ධයෙන් 2021 අංක 01 දරන චක්‍රලේඛයට අදාළ පැහැදිලි කිරීමක් නිකුත් කිරීමට ද ආයුගණක ඒකකය දායක විය.

# නියාමන සමාලෝචනය

## රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

වසර තුළදී කොමිෂන් සභාව විසින් කිසිදු රක්ෂණකරුවෙකු අලුතින් ලියාපදිංචි කර නැත. කෙසේ වෙතත්, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී සමාගම විසින් වසර තුළදී අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සමාගමේ කොටස් හිමිකාරිත්වය අත්පත් කරගෙන ඇති අතර සමාගමේ නම අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සිට සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් ලෙස වෙනස් වී ඇත. වසර සඳහා ලියාපදිංචි රක්ෂණ සමාගම් සංඛ්‍යාව 29 ක් ලෙසම පැවතිණි

**පරිශිෂ්ටය :** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ සමාගම්වල නාම ලේඛණය සහ එම සමාගම් සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

#### අත්හිටුවීම්

පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම සහ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් රෙගුලාසියක් හෝ යම් රීතියක් කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් හෝ නිශ්චය කිරීමක් කඩ කර තිබීම හේතුවෙන් රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම සම්පූර්ණයෙන් ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් හෝ අනු පන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

2015 ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව සම්බන්ධයෙන් වන (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීතිවලට සහ අංක 01 දරන නිශ්චය කිරීමට අනුකූල වන පරිදි කටයුතු නොකිරීම, සමාගමේ මූල්‍ය ශක්‍යතාව පිළිබඳ බරපතල සැකයක් පැවතීම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත අසත්‍ය හා වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව පනතේ 18(1) (ඈ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති ප්‍රකාරව, 2025 දෙසැම්බර් 05 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, පනතේ 18(2) වගන්තියට අනුව සති තුනක කාලයක් සඳහා අදාළ දීර්ඝකාලීන රක්ෂණ සමාග මේ ලියාපදිංචිය අත්හිටුවීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇති අතර ඊට අමතරව එම සමාගමේ කටයුතු පිළිබඳව ස්වාධීන විගණකවරයෙකු සහ ස්වාධීන ආයුගණකඥයෙකු ලවා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් විමර්ශනයක් සිදු කිරීමට ද නියෝග කර ඇත.

එම ලියාපදිංචිය අත්හිටුවීම ඉවත් කළ යුත්තේ මන්දැයි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස සමාගමට දන්වා තිබුණද සමාගම එසේ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් පනතේ 18 (4) (ආ) වගන්තිය ප්‍රකාරව අත්හිටුවීමේ කාලසීමාව තවදුරටත් දීර්ඝ කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී. ඒ අනුව පනතේ 18 (5) (අ) වගන්තිය යටතේ සමාගම විසින් අවදානම් පාදක ප්‍රාග්ධන රීතිවලට අනුකූල වන තෙක් සහ අදාළ අනුකූල නොවීම් නිවැරදි කරන තෙක් 2025 දෙසැම්බර් 27 සිට 2026 ජනවාරි 30 දක්වා බලපැවැත්වෙන පරිදි එම අත්හිටුවීම තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

### කොමිෂන් සභාව නිකුත් කරන ලද විධානයන්

1. පනතේ 57 (1) (ආ) සහ 3 වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන උපදේශකවරයා ඉවත් කිරීමට සහ 2022 අංක 2 දරන විධානයට අනුකූල බව තහවුරු කිරීම සඳහා රක්ෂණකරුවෙකු වෙත.

2. පනතේ 57 (1) වගන්තිය යටතේ ව්‍යාපාරික කටයුතුවල නෛතික වලංගුභාවය පිළිබඳ ගැටළුව නිරාකරණය කර ඒ පිළිබඳ අනුකූලතාව තහවුරු කිරීම සඳහා රක්ෂණකරුවෙකු වෙත.

3. පනතේ 18 (7) වගන්තිය යටතේ, අදාළ පාර්ශ්වයන් අතර සිදු කෙරෙන ගනුදෙනු සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද විධානයන් උල්ලංඝනය කිරීම වැළැක්වීම සහ එම නියෝග මින් ඉදිරියට උල්ලංඝනය නොකරන බවට රක්ෂණකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන ප්‍රතිඥාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා රක්ෂණකරුවෙකු වෙත.

4. පනතේ 18 (7) වගන්තිය යටතේ, අංක 1 දරන නිශ්චය කිරීම උල්ලංඝනය කිරීමෙන් වැළකී සිටීම සඳහා රක්ෂණකරුවෙකු වෙත.

5. පනතේ 57 (1) වගන්තිය යටතේ, අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා 2025 වසරේ සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට, හඳුනාගත් ගැටළු සම්බන්ධයෙන් විශේෂ විගණනයක් පැවැත්වීමට, 2025 ඔක්තෝබර් 30 දක්වා එකතු කරන ලද සියළුම අතිරික්ත රක්ෂණ වාරික අදාළ රක්ෂණ ඔප්පු හිමියන් වෙත ආපසු ගෙවීමට සහ 2022 ජනවාරි 1 සිට 2025 සැප්තැම්බර් 30 දක්වා පසුගිය වසර තුන තුළ එම අතිරික්ත වාරික මුදල් භාවිත කළ ආකාරය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පත් කරන ලද අභ්‍යන්තර විගණකවරයා මගින් ඉදිරිපත් කිරීම සඳහා රක්ෂණකරුවෙකු වෙත.

6. පනතේ 57 වගන්තිය යටතේ සංශෝධිත ප්‍රාග්ධන සම්පාදන සැලැස්ම වහාම ක්‍රියාත්මක කිරීමට සහ සෑම මාසයක්ම අවසානයේ වැඩ කරන දින පහක් ඇතුළත එහි මාසික ප්‍රගතිය වාර්තා කිරීමට, රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව තම දීර්ඝකාලීන රක්ෂණ කළඹ වෙනත් බලපත්‍රලාභී දිගුකාලීන රක්ෂණ සමාගමකට හෝ සුදුසු ආයතනයකට වහාම පවරා දීමට සහ එම පැවරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාල රාමුවක් නිශ්චිත කාලසීමාව තුළ කොමිෂන් සභාවේ සලකා බැලීමට ඉදිරිපත් කිරීම සඳහා රක්ෂණකරුවෙකු වෙත.

7. පනතේ 57 (1) වගන්තිය යටතේ 2025 නොවැම්බර් මාසයේ සිට අංක 12 දරන විධානයට අනුකූලව මාසික වාර්තා ඉදිරිපත් කිරීමට එක් එක් වාර්තාව මාසය අවසානයේ සිට දින 21ක් ඇතුළත ලබා දිය යුතු බව සහ දිගු කලක් ප්‍රමාද වී ඇති සියළුම ලේඛන සහ තොරතුරු 2025 දෙසැම්බර් 19 වන දිනට පෙර

ඉදිරිපත් කරන බව සහතික කිරීම සඳහා රක්ෂණකරුවෙකු වෙත.

## කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අවවාද කිරීම්

1. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා වන කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් රක්ෂණකරුවෙකුගේ ප්‍රධාන නිලධාරියා වෙත.

2. රක්ෂණ සමාගමක කළමනාකාර අධ්‍යක්ෂ ධුරය දරන අතරතුර, එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නොමග යැවීම සහ පනතේ සඳහන් විධිවිධානවලට අනුකූල වන ලෙස කළමනාකාරීත්වයට හසුරුවනු නොලැබීම මගින් පනතේ 29 (1) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රක්ෂණකරුවෙකුගේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂවරයා වෙත.

3. අදාළ පාර්ශ්වයන් අතර සිදු කෙරෙන ගනුදෙනු සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද නියෝග උල්ලංඝනය කිරීම වෙනුවෙන් එම ගනුදෙනු සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් සෘජුවම වගකිව යුතු අදාළ පාර්ශ්වයන්ගේ ගනුදෙනු පිළිබඳ කමිටුවේ සාමාජිකයින් වන අධ්‍යක්ෂවරුන් කිහිපදෙනෙකු වෙත සහ සමාගමේ නියාමන අනුකූලතාව සහතික කරමින් කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා වගකිව යුතු ප්‍රධාන නිලධාරියා වෙත.

4. 2025 මාර්තු 31 සහ 2025 ජුනි 30 යන දිනවලින් අවසන් වූ කාර්තුවලදී අංක 1 දරන විධානයට අනුකූල නොවීම සම්බන්ධයෙන් රක්ෂණකරුවෙකුගේ ප්‍රධාන නිලධාරියා වෙත.

5. විශේෂ සහයෝගිතා කේත (Affinity Codes) අත්හිටුවීමෙන් පසුවත් එම කේතවලට අයත් පාර්ශ්වයන් වෙත ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් රක්ෂණකරුවෙකුගේ යෝජිත ප්‍රධාන නිලධාරියා වෙත.

6. කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම මගින් අංක 12 දරන නිශ්චය කිරීම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් තුනක ප්‍රධාන නිලධාරීන් වෙත.

නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම.

මෙම වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ව්‍යාපාර යෝජනා පහක් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. කොමිෂන් සභාව විසින් වසර තුළ සමාගම් සංස්ථාගත කිරීම සඳහා පුද්ගලයන් හතර දෙනෙකු වෙත නම් සඳහා අනුමැතිය ලබා දී ඇත. කොමිෂන් සභාව විසින් මෙම වසර තුළ සමාගම් දෙකකට රක්ෂණ තැරැව්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචිය ලබා දෙන ලදී. දැනට පවතින තවත් සමාගම් දෙකකට (සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි නියැලී සිටින) දිගු කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි නියැලීම සඳහා ලියාපදිංචිය ලබා දෙන ලදී.

2026 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 80 කින් ඉල්ලුම්පත්‍ර කොමිෂන් සභාව වෙත ලැබුණු අතර එම සමාගම් 80 අතරින් සමාගම් 79 ක්ලියාපදිංචිය අළුත් කරන ලදී. අලුත් කිරීමේ අවශ්‍යතා සපුරාලීම සිදු කර නොමැති බැවින් එක් සමාගමක ලියාපදිංචිය අලුත් කිරීමේ කටයුතු ඉතිරිව ඇත.

පරිශිෂ්ඨය ii: කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඒ සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ තැරැව්කාර සමාගම්

#### විධානයන්

2025 වසර තුළ කොමිෂන් සභාව විසින් රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත කිසිදු විධානයක් නිකුත් කර නොමැත.

#### අවවාද කිරීම්

1. පනතේ 86 (2) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සමාගම් හතරක ප්‍රධාන නිලධාරීන් වෙත අනතුරු ඇඟවීම් නිකුත් කරන ලදී.

2. රුපියල් මිලියන 4ක අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරියා වෙත අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.

#### අත්හිටුවීම්

වසර තුළ කිසිදු තැරැව්කාර සමාගමක් සඳහා අත්හිටුවීම් පනවා නැත.

අලාභ ගැළපුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ අලාභ ගැළපුම්කරුවන්ගේ වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීම.

වසර තුළදී එක් සමාගමකට අලාභ ගැළපුම්කරුවෙකු ලෙස කොමිෂන් සභාව විසින් ලියාපදිංචිය ලබා දෙන ලදී. එම වසර තුළ අලාභ ගැළපුම්කරුවන් සඳහා කිසිදු නැවත ලියාපදිංචි කිරීමක් කොමිෂන් සභාව විසින් සිදු නොකරන ලද අතර පුද්ගලයන් විසිහතර දෙනෙකුට අලාභ ගැළපුම්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා වන වාර්ෂික ගාස්තු ගෙවීම් කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලදී.

පනතේ 114 (1) වගන්තියට අනුව “අලාභ ගැළපුම්කරු” යනු රක්ෂණ හිමිකම් පෑමකදී සිදුවන අලාභයන් විමර්ශනය කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති පනතේ විධිවිධාන යටතේ අලාභ ගැළපුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වූ තැනැත්තෙකි.

පරිශිෂ්ඨය iii: කොමිෂන් සභාව සමග ලියාපදිංචි වී සිටින අලාභ ගැලපුම්කරුවන්ගේ නාම ලේඛණය සහ ලියාපදිංචිය බලාත්මක වන දිනය දැක්වේ.

## නියාමන/උපදේශන ක්‍රියාමාර්ග

1. සංශෝධිත පනත මගින් හඳුන්වා දෙන ලද නව විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලද අතර එවැනි අයදුම්පත් සමාලෝචනය සඳහා අවශ්‍ය ලේඛන සම්පූර්ණ කරන තෙක් අයදුම්පත් කිහිපයක් තීරණාපේක්ෂිතව පවතී.

   පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලද අතර ප්‍රධාන නිලධාරියෙකු පත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ ඒ සඳහා සුදුසු පුද්ගලයෙකු පත් කිරීමට සහ එම පත් කිරීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

2. චක්‍රලේඛ අංක 36 ප්‍රකාරව විදේශීය සෞඛ්‍ය රක්ෂණයන් අළුත් කිරීම සඳහා වන රක්ෂණ තැරැව්කරුවන් ගණනාවකගේ ඉල්ලීම් සමාලෝචනය

කරන ලදුව කොමිෂන් සභාව විසින් බලය හිමිවන කාල සීමාව තවත් වසරක් සඳහා අළුත් කරන ලදී.

3. ලියාපදිංචි සහතිකයේ සහ 2017 ජූලි 05 වන දින අංක 2026/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රීතිවල 5 සහ 2 (1) (ඊ) රීති හි දක්වා ඇති කොන්දේසිවලට අනුකූල නොවීම හේතුවෙන් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 89 (1) (අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අලාභ ගැලපුම්කරුවන් සඳහා වන බලපත්‍ර හතරක් අවලංගු කරන ලදී.

4. රක්ෂණකරුවෙකුගේ ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව කොළඹ කොටස් වෙළඳපොළේ ආයතනික පාලන රීතිවලට අනුකූල වීමට එම රක්ෂණකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සැලසීම පිණිස, ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නැවත පත් කිරීමට අවසර දෙමින් කොමිෂන් සභාව විසින් විධානයක් සංශෝධනය කරන ලදී.

5. වෙන් කරන ලද දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් දෙකක මව් සමාගම වෙත, පවතින අධිකරණ ක්‍රියාවලියක් අවසන් වන තෙක් කොන්දේසිවලට යටත්ව එහි නමෙහි "රක්ෂණ" යන වචනය තබා ගැනීමට කොමිෂන් සභාව විසින් කාල දිගුවක් ලබා දුන් අතර දිගුකාලීන රක්ෂණ සමාගම වෙත අංක 15 දරන විධානයේ අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා ද කාල දිගුවක් ලබා දෙන ලදී.

6. රක්ෂණ සමාගමක අනුබද්ධිත රක්ෂණ සමාගමක නඩු කටයුතු සඳහා ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් එම මව් සමාගම වෙත කරුණු දැක්වීමේ නිවේදනයක් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. එහිදී, අනෙකුත් කරුණු අතර එම ගෙවීම් කොටස් හිමියන්ගේ අරමුදලින් සිදු කර ඇති බව සලකා බැලූ කොමිෂන් සභාව, අධ්‍යක්ෂවරුන්ට එරෙහිව වැඩිදුර ක්‍රියාමාර්ග නොගැනීමට තීරණය කර ඇත.

7. ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ ඉල්ලීම සලකා බැලූ කොමිෂන් සභාව ප්‍රතිරක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ යෙදෙන සහ ඒ සඳහා අයදුම් කරන රක්ෂණ තැරැව්කරුවන්ට වහාම බලපැවැත්වෙන පරිදි 2004 සැප්තැම්බර් 09 දිනැති රක්ෂණ තැරැව්කරුවන් ලියාපදිංචි කිරීමේ අතිරේක අවශ්‍යතා පිළිබඳ අංක 3 දරන රීතිය සංශෝධනය කිරීමට නිර්දේශ කරන ලදී.

8. රක්ෂණ සමාගමක අධ්‍යක්ෂවරුන් සඳහා වන රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එම සමාගමේ හිටපු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් ලැබුණු ඉල්ලීම් දෙකකට කොමිෂන් සභාව විසින් එකඟතාව පළ කරන ලදී.

9. ධුරයෙන් ඉවත් කරන ලද රක්ෂණ සමාගමක හිටපු ප්‍රධාන නිලධාරියෙකුගෙන් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ලැබී තිබුණි. එම අභියාචනය විභාග කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ පෙර තීරණය එලෙසම පවත්වා ගැනීමට කොමිෂන් සභාව තීරණය කළේය.

10. 2017 අංක 17 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ (සංශෝධන) පනතේ 15ආ වගන්තිය ප්‍රකාරව, බලපත්‍රලාභී කොටස් වෙළඳපොළක ලැයිස්තුගත වීමෙන් නිදහස් වීම සඳහා රක්ෂණකරුවෙකු වෙත කොමිෂන් සභාව විසින් නිදහස් කිරීමක් ලබා දෙන ලදී.

11. සිදු කරන ලද ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව, සාර්ව විචක්ෂණ අධ්‍යනය සඳහා දත්ත සහ තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුව සමග ගිවිසුමකට එළඹුණි.

12. "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ රහස්‍යභාවය සහ රහස්‍ය තොරතුරු සුරැකීමේ ප්‍රතිපත්තිය" සහ "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ආචාර ධර්ම පද්ධතියේ" සංශෝධන සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

# විමර්ශන සමාලෝචනය

රක්ෂණ හිමිකම් පෑමකට අදාළව ඇති වන ආරවුලක් විමර්ශනය කර පසුව කොමිසමට සුදුසු යැයි හැඟෙන්නේ නම් නියෝගයක් නිකුත් කිරීම සඳහා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත හරහා කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිතව පැවරී ඇති බලය, විමර්ශන අංශය හරහා ක්‍රියාත්මක කරනු ලැබේ.

ආරවුලක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර ආරවුලට අදාළ සියළු පාර්ශවයන්ගේ කරුණු ඉදිරිපත් කිරීමට ඇති අයිතිය ලබාදීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ අරමුණෙන් හිමිකම් පෑමට අදාළව ලැබුණු ආරවුල්, අංශය විසින් සමාලෝචනය කරනු ලැබේ. හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කිරීමට රක්ෂණකරු විසින් පදනම් කරගත් සාක්ෂි ප්‍රමාණවත් හෝ තීරණාත්මක නොවන බව පෙනී යන්නේ නම්, එය ප්‍රතික්ෂේප කිරීමට ගත් තීරණය සංශෝධනය කිරීමට හෝ නැවත සලකා බැලීමට රක්ෂණකරුවෙකු වෙත දැනුම් දීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

සමාලෝචිත කාළසීමාව තුළ කොමිෂන් සභාව වෙත පැමිණිලි 585 ක් ලැබී ඇති අතර 2024 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද නොවිසඳුනු පැමිණිලි සංඛ්‍යාව 77කි. වසර තුළ පරීක්ෂණ සිදුකර පැමිණිලි 517 ක් සඳහා විසඳුම් ලබා දෙන ලදී. ඉන් පැමිණිලි 184 ක් හිමිකම් පාන්නන්ට වාසිසහගත වන ආකාරයෙන් විසඳා ඇති අතර ඒවායේ දළ වටිනාකම රුපියල් මිලියන 53.96 ක් පමණ වේ.

**1 රූප සටහන:** පසුගිය වසර පහ තුළ ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව (2021-2025)




පසුගිය වසර පහ (5) තුළ අංශයට ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 2279 කි.

සමාලෝචිත කාල සීමාව තුළ කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 2024 වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇත.

**2 රූප සටහන:** 2025 වසර තුළ ලැබුණු පැමිණිලිවල මාසික විශ්ලේෂණය




2 රූප සටහන මගින් අංශය වෙත ලැබුණු පැමිණිලිවල මාසික විශ්ලේෂණය පෙන්නුම් කෙරේ. 2025 වර්ෂයේදී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ සැප්තැම්බර් මාසය තුළ වන අතර අඩුම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ අප්‍රේල් මාසය තුළදීය.

**3 රූප සටහන:** 2025 වසරේ දී රක්ෂණ ව්‍යාපාර පංතිය මත පදනම්ව පැමිණිලි වර්ගීකරණය




3 රූප සටහන මගින් 2025 වර්ෂය තුළ ලැබුණු සමස්ථ පැමිණිලි ප්‍රමාණය දක්වා ඇත. සමස්ථ පැමිණිලිවලින් බහුතරය, එනම් 376 (ලැබුණු මුළු පැමිණිලිවලින් 64.3%) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද පැමිණිලි 140 (ලැබුණු මුළු හිමිකම් පෑම්වලින් 23.9%)ක් දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය ආශ්‍රිතව ද වේ. ඉතිරි පැමිණිලි 69 (ලැබුණු මුළු පැමිණිලිවලින් 11.8%) ප්‍රධාන වශයෙන් රක්ෂණ නියෝජිතයන් සමග වන ගැටළුවලට අදාළ වේ. පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 65.2% (වසරේ දී) සිට 64.3% දක්වා සුළු අඩු වීමක් පෙන්නුම් කළ අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 22.7% (2024 වසරේ දී) සිට 23.9% දක්වා සුළු වැඩි වීමක් පෙන්නුම් කළේය. අනෙකුත් පැමිණිලිවල ප්‍රතිශතය 12% සිට (2024 වසරේදී) 11.8% දක්වා සුළු වශයෙන් අඩු වී ඇත.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලිවල, ගැටළුව අනුව විශ්ලේෂණයක් 1 වන වගුවේ දක්වා ඇත.

**1 වගුව:** සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි : ගැටළුව අනුව

| ගැටළුව | පැමිණිලි ගණන | % |
|---|---|---|
| **රක්ෂණ වන්දි ආරවුල්** | **316** | **84%** |
| වගකීම පිළිනොගැනීම | 166 | 53% |
| ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 111 | 35% |
| හිමිකම් ගෙවීම ප්‍රමාද වීම | 30 | 9% |
| මුදල් ආපසු ගෙවීමේ / අවලංගු කිරීමේ හෝ නැවත බලාත්මක කිරීමේ ඉල්ලීම | 2 | 1% |
| වෙනත් | 7 | 2% |
| **වෙනත් පැමිණිලි** | **60** | **16%** |
| **එකතුව** | **376** | **100** |

1 වන වගුවෙහි දැක්වෙන පරිදි සමස්ථ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පැමිණිලි අතුරින් (376) රක්ෂණ වන්දි ආරවුල් 316 (84%) වන අතර ඉතිරි පැමිණිලි 60 (16%) මධ්‍ය කාලීනව රක්ෂණ ඔප්පු අවලංගු කිරීම්, අසන ලද ප්‍රශ්නවලට ප්‍රතිචාර නොදැක්වීම් ආදී වෙනත් පැමිණිලි වේ.

වගකීම පිළිනොගැනීමට අදාළව (53%) පැමිණිලිවල මූලසාධකය විශ්ලේෂණය කිරීමේ දී මෝටර් රථ වාහන හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ ප්‍රධාන හේතු ලෙසට අනාවරණය වන්නේ අනතුර සම්බන්ධයෙන් වන වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම (රක්ෂණය ලබාගත් අරමුණට පරිබාහිර අරමුණු සඳහා වාහනය භාවිතා කිරීම, රියදුරු බීමත්ව සිටීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් රිය පැදවීම හෝ හිමිකම් පාන්නාට (රක්ෂිතයාට) වාහනය කෙරෙහි එය විකිණීමෙන් පසුව රක්ෂණීය බැඳියාවක් නොමැති වීම හේතුවෙන්) අනතුර පිළිබඳ ලබා දුන් විස්තරය අනතුරෙන් සිදු වූ අලාභහානිවලට නොගැළපීම හෝ අනතුර සිදුවන දිනය වන විට මුළු රක්ෂණ වාරික මුදල නොගෙවීම මත රක්ෂණ ඔප්පුව අවලංගු වීමයි. රක්ෂණ හිමිකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ දී අවශ්‍ය අවස්ථාවන්හි දී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පොලිස් ස්ථාන, රෝහල් හා තුන්වන පාර්ශව සාක්ෂිකරුවන් වෙතින් නිරීක්ෂණ කැඳවීමෙන් (අවශ්‍ය වූ විට) හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණ පවත්වන ලදී.

රක්ෂණ වන්දි ආරවුල් යටතේ පැමිණිලි ලැබීමට බලපෑ අනෙක් ප්‍රධාන හේතුව වූයේ (35%) පිරිනමන වන්දිය පිළිබඳ අතෘප්තිමත් බවයි. මෙම පැමිණිලිවලට මූලික හේතූන් වූයේ රක්ෂණ ඔප්පුවෙහි කරුණු වරදවා වටහා ගැනීම සහ රක්ෂකයන් විසින් ගෙවන ලද අලාභ ගැලපුම්/අඩු කිරීම් පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබා නොදීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී හිමිකම් පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දීම මගින් මෙවැනි බොහෝමයක් ආරවුල් විසඳාගත හැකි විය. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරුණු ඉතිරි පැමිණිලි 30 (9%) හිමිකම් මුදල් ගෙවීමේ ප්‍රමාදයට අදාළවය. මෙම ප්‍රමාදයන් අතුරින් බොහෝමයක් උද්ගත වී ඇත්තේ සමාගම විසින් හිමිකම්පෑම් පිළිබඳ වැඩිදුර විමර්ශන පැවැත්වීම බව නිරීක්ෂණය විය. මීට අමතරව, රක්ෂිතයාගේ හෝ අළුත්වැඩියාකරුවන්ගේ පාර්ශවයෙන් හිමිකම් නිරාකරණය කිරීමට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත් කිරීමේ දී සිදුවන ප්‍රමාදයන් ද නිරීක්ෂණය විය.

## දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරයට අදාළව ලැබුණු පැමිණිලිවල ගැටළුව අනුව විශලේෂණය 2 වගුවෙන් දක්වා ඇත.

**2 වගුව:** දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි: ගැටළුව අනුව

| ගැටළුව | පැමිණිලි ගණන | % |
|---|---|---|
| **රක්ෂණ වන්දි ආරවුල්** | **60** | **42.86%** |
| වගකීම පිළිනොගැනීම | 34 | 56.67% |
| හිමිකම් ගෙවීම ප්‍රමාද වීම | 11 | 18.33% |
| පිරිනමන ලද හිමිකම් පෑමේ වටිනාකම පිළිබඳ අතෘප්තිමත් වීම | 11 | 18.33% |
| මුදල් ආපසු ගෙවීමේ / අවලංගු කිරීමේ හෝ නැවත බලාත්මක කිරීමේ ඉල්ලීම් | 1 | 1.67% |
| කල් පිරීමේ සහ වටිනාකම ආපසු ලබා ගැනීමේ ප්‍රතිලාභ | 1 | 1.67% |
| වෙනත් | 2 | 3.33% |
| **වෙනත් පැමිණිලි** | **80** | **57.14%** |
| පිරිනමන ලද හිමිකම් පෑම් පිළිබඳ අතෘප්තිමත් වීම | 1 | 1.25% |
| කල් පිරීමේ සහ වටිනාකම ආපසු ලබා ගැනීමේ ප්‍රතිලාභ | 6 | 7.50% |
| වගකීම භාර නොගැනීම | 6 | 7.50% |
| මුදල් ආපසු ගෙවීමේ / අවලංගු කිරීමේ හෝ නැවත බලාත්මක කිරීමේ ඉල්ලීම | 35 | 43.75% |
| වාරික ගෙවීම් / වාරික මුදල් අවභාවිත කිරීම | 7 | 8.75% |
| වෙනත් | 25 | 31.25% |
| **එකතුව** | **140** | **100** |

2 වන වගුවට අනුව, වසර තුළ දී දිගුකාලීන රක්ෂණය සම්බන්ධයෙන් පැමිණිලි 140 ක් ලැබී ඇත. ඉන් පැමිණිලි 60 ක් (42.86%) හිමිකම් ආරවුල්වලට අදාළ වන අතර ඉතිරි පැමිණිලි 80 (57.14%) අනෙකුත් පැමිණිලි ගණයට අයත් වේ.

රක්ෂණ වන්දි ආරවුල් සඳහා මූලික හේතුව වගකීම පිළිනොගැනීමට අදාළ විය. හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප වීමට පාදක වී ඇත්තේ රක්ෂණ ඔප්පුව ලබා ගැනීමේ දී හෝ පුනස්ථාපනය කිරීමේ දී රක්ෂිතයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීමයි. එවැනි ආරවුල් ඇති වීමට ප්‍රධාන හේතුව වන්නේ රක්ෂණ ඔප්පුවේ ඇති කරුණු පිළිබඳ අවබෝධය මද බව සහ රක්ෂකයන් විසින් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සිදු නොකිරීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී හිමිකම් පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දීම මගින් මෙවැනි බොහෝමයක් ආරවුල් විසඳන ලදී.

රක්ෂණ ගිවිසුමක පදනම වන "උපරිම සද්භාවය" (uberrimae fidei) නම් මූලික නෛතික මූලධර්මය රක්ෂණ ගිවිසුමේ දෙපාර්ශවයටම එනම් රක්ෂකයාට මෙන්ම රක්ෂිතයාටද එකසේ ක්‍රියා කරයි. යෝජකයා විසින් රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කරන තොරතුරු මත පදනම්ව රක්ෂණ යෝජකයාගේ ජීවිතය පිළිබඳ අවදානම පිළිගන්නේ ද යන වග සහ රක්ෂණ ගිවිසුමට අදාළ වන කොන්දේසි හා නියමයන් රක්ෂකයා විසින් තීරණය කරනු ලබයි. එවන් අවස්ථාවක රක්ෂිතයා විසින් කිසියම් වැදගත් කරුණක් හෙළිදරව් නොකළහොත් හෝ

වරදවා දැක්වීමක් සිදු කළහොත් "උපරිම සද්භාවය" මූලධර්මය උල්ලංඝණය වේ.

ඇතැම් අවස්ථාවල දී යෝජකයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හා වරදවා දැක්වීමට හේතු වී ඇත්තේ අදාළ රක්ෂණ මූලධර්ම හා වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීම පිළිබඳ දැනුම මඳ නිසා බව නිරීක්ෂණය විය. වැදගත් කරුණු වරදවා දැක්වීම හිතාමතා හෝ නොසැලකිල්ලෙන් නොවන අවස්ථාවන් කිහිපයක දී පමණක් අදාළ රක්ෂණ හිමිකම් පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

හිමිකම් පෑම් පිළිබඳ ආරවුල්වලින් තවත් 18.33% ඉදිරිපත් කළ හිමිකම් මුදල පිළිබඳ සෑහීමට පත් නොවීම සම්බන්ධයෙනි.

රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති කාල වකවානුව තුළ හා නියමිත පරිදි වාරික ගෙවීම රක්ෂණ ඔප්පු හිමියාගේ ගිවිසුම්ගත වගකීමක් වේ. අලාභය සිදුවන විට වාරික නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අප්‍රාණිකව පැවති අවස්ථාවලදී රක්ෂණ වන්දි ගෙවීම ප්‍රතික්ෂේප වී ඇත.

නියමිත වේලාවට රක්ෂණ වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙන යාම රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීමක් වන අතර ආරවුලක දී ඉදිරිපත් කිරීමට සිදු වුවහොත් ගෙවීම් තහවුරු කිරීමට සාක්ෂි ඔවුන් සතුවිය යුතුය. ඒ අනුව, නියමිත කාල සීමාව තුළ වාරික ගෙවන ලද බව තහවුරු කළ හැකි හෝ ගෙවීමේ දී සිදු වූ ප්‍රමාදය සාධාරණීකරණය කළ හැකි අවස්ථාවලදී පමණක් කොමිෂන් සභාවට සහාය විය හැකිය.

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අනෙකුත් පැමිණිලිවලින් බහුතරයක් (43.75%) ආපසු ගෙවීම/අවලංගු කිරීම හෝ රක්ෂණ ඔප්පු නැවත බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීම් යටතේ ඉදිරිපත් විය. අවලංගු කිරීමේ කාල සීමාව (එනම් රක්ෂණ ඔප්පුව ලද දින සිට දින 21 ක් ඇතුළත) ඉකුත් වීමෙන් අනතුරුව රක්ෂණ ඔප්පු හිමියාට එවැනි අයිතියක් නොමැති වීම නිසා රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් වන පැමිණිලි සඳහා සහාය වීමට හැකියාවක් නොලැබුණි කෙසේ වුවද, ඇතැම් අවස්ථාවල රක්ෂණ හිමිකම් පාන්නන්ගේ දුර්වල මූල්‍ය තත්වය සැලකිල්ලට ගෙන රක්ෂණකරුවන් සහන සලසා ඇත. රක්ෂණ ඔප්පුව පුනස්ථාපනය කිරීමට පියවර ගැනීමට ප්‍රමාද වූ කරුණු සාධාරණීකරණය කළ හැකි විටදී පමණක් නියමිත කාලය ඉකුත් වීමෙන් පසුව සිදු කරන ලද පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම්වලට රක්ෂණ ඔප්පු හිමියන්ට සහාය වීමට හැකි විය. ගෙවූ රක්ෂණ වාරික මුදල් ආපසු ගෙවන ලෙස වන ඉල්ලීම්වලට මූලික හේතු වන්නේ රක්ෂණ ඔප්පු හිමියන් තුළ ජීවිත රක්ෂණයේ වැදගත්කම පිළිබඳ අවබෝධය මඳ බව සහ අඛණ්ඩව වාරික ගෙවා රක්ෂණ ඔප්පු පවත්වාගෙන යාමේ දී මුහුණ පාන්නට වන ආර්ථික දුෂ්කරතායි.

## වෙනත් පැමිණිලි

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි 69ක් ප්‍රධාන වශයෙන් අසාධාරණ අයුරින් නියෝජිතභාවය අවසන් කිරීම සහ නියෝජිතයන්ගේ අධ්‍යාපන සුදුසුකම්වලට අදාලව වන අතර හැකි සෑම අවස්ථාවක දී ම පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නියෝජිත පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

## "දිට්වා" සුළි කුණාටුව

2025 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට බලපෑ 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් දිස්ත්‍රික්ක 25 පුරා වෙසෙන පුද්ගලයන් සහ පවුල් දැඩි පීඩාවට පත් වූ අතර එමගින් ඔවුන්ගේ ජීවනෝපායන්, අත්‍යවශ්‍ය සේවා සහ ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික ක්‍රියාවලියටම බාධා එල්ල විය.

මෙම තත්ත්වය හමුවේ රක්ෂණ සමාගම් සතු සුවිශේෂී කාර්යභාරය හඳුනාගත් කොමිෂන් සභාව, රක්ෂණ සමාගම් සමඟ අඛණ්ඩව සාකච්ඡා පවත්වමින් පීඩාවට පත් රක්ෂණ ඔප්පු හිමියන්ට කඩිනමින් වන්දි ගෙවීම සඳහා ගත යුතු ඉදිරි පියවර පිළිබඳව සාකච්ඡා කරන ලදී. සුළි කුණාටුවෙන් සිදු වූ හානි හේතුවෙන් ඉදිරිපත් වූ හිමිකම් පෑම්වලට අදාළ දත්ත දිනපතා රක්ෂණ සමාගම් වෙතින් රැස් කිරීමට ද පියවර ගන්නා ලදී.

රක්ෂණ සමාගම් විසින් සිදු කරන හිමිකම් ගෙවීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව මේ වන විටද සතිපතා නිරීක්ෂණය කරමින් සිටින අතර ප්‍රතික්ෂේප කරන ලද හිමිකම්පෑම් අසාධාරණ පදනමක් මත සිදු කර ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා ඒ පිළිබඳව වන තොරතුරු කැඳවා ඇත. තවද, රක්ෂණ සමාගම් විසින් වගකීම භාරගෙන ඇති හිමිකම් පෑම් සඳහා ගෙවීම් අවසන් කිරීමට කාලීන ක්‍රියාකාරී සැලැස්මක් රක්ෂණ සමාගම් වෙත ලබා දී ඇත.

# වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ, වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා අංශය, නියාමනය සහ එමගින් ආරක්ෂා කරන පොදු මහජනතාව අතර පවතින අත්‍යවශ්‍ය සබැඳියක් ලෙස ක්‍රියා කරයි. එහි මෙහෙවර හුදෙක් එදිනෙදා මෙහෙයුම්වලින් ඔබ්බට විහිදෙන අතර ඉතා සූක්ෂ්ම සැලසුම්කරණය, උපායමාර්ගික මැදිහත්වීම සහ නොපසුබට උත්සාහය තුළින් සංකීර්ණ රක්ෂණ සංකල්ප සරල කරමින් මහජනතාව තුළ පැහැදිලි බව සහ විශ්වාසය ගොඩනැංවීමට කටයුතු කරයි.

2025 වසරේදී, කොමිෂන් සභාව රක්ෂණය පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම, අධ්‍යාපනය ලබාදීම සහ රක්ෂණ ඔප්පුහිමියන් තුළ අවබෝධය ඇති කිරීම අරමුණු කරගත් ප්‍රචාරක වැඩසටහන් මාලාවක් රූපවාහිනිය, සමාජ මාධ්‍ය ජාල සහ ප්‍රජා වැඩසටහන් ඔස්සේ මෙහෙයවන ලදී. මෙම සෑම මුලපිරීමක්ම රක්ෂණ ඔප්පුහිමියන් දැනුවත් කිරීම, අධ්‍යාපනය ලබා දීම සහ සවිබල ගැන්වීම සඳහා ඉතා සැලකිලිමත් ලෙස නිර්මාණය කර තිබුණි. සෑම විකාශනයකම, සෑම සන්නිවේදනයකම සහ සෑම පොදු ක්‍රියාකාරකමකම දැනුමෙහි පවතින පරතරයන් අවම කිරීම, රක්ෂණ ඔප්පු හිමියන් සුරක්ෂිත කිරීම සහ විනිවිදභාවයෙන් යුත් ශක්තිමත් රක්ෂණ පද්ධතියක් ගොඩනැගීම සඳහා වූ සැලසුම්සහගත උපායමාර්ග අන්තර්ගත විය.

## ආරක්ෂාව පිළිබඳව සංස්කෘතිය ගොඩනැගීම

වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා අංශයේ ක්‍රියාකාරකම්වල බලපෑම හුදෙක් සන්නිවේදනයෙන් ඔබ්බට විහිදෙන්නකි. එය මූලික සංස්කෘතික පරිවර්තනයක් පිළිබඳ කාරණයකි. රක්ෂණය යනු හුදෙක් "අනිවාර්ය වගකීමක්" යන මහජන මතය, "මූල්‍ය සුරක්ෂිතභාවයේ මූලික පදනම" යන මතය ලෙස වෙනස් කිරීම මගින් කොමිෂන් සභාව වඩාත් ආරක්ෂිත සහ විශ්වාසදායක සමාජයක් ගොඩනඟයි.

මෙම කැපවීමේ ගමන් මග පහතින් විස්තර කෙරෙන අතර ශ්‍රී ලංකාව තුළ වඩාත් පරිපූර්ණ සහ ශක්තිමත් රක්ෂණ ක්ෂේත්‍රයක් කරා යන මාවත ආලෝකමත් කිරීමට කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කරන ආකාරය ඉන් පැහැදිලි කරයි.

## ජන සන්නිවේදනය

### මුද්‍රිත මාධ්‍ය තුළින් මහජනතාවගේ මනසට සමීපවීම

2025 වසරේදී, වැදගත් යාවත්කාලීන තොරතුරු, සන්ධිස්ථාන සහ වටිනා තොරතුරු සහ දත්ත ඉතා සැලකිලිමත් ලෙස විශ්ලේෂණය කරමින් සැකසූ පුවත්පත් ලිපි හරහා කොමිෂන් සභාව විසින් රක්ෂණ විෂයය පිළිබඳ මහජනතාව තුළ දැනුම්වත්භාවයක් ඇති කරන ලදී. සෑම පුවතක්ම මහජනතාව සහ රක්ෂණ කර්මාන්තය අතර සබැඳියාවක් ඇති කළ අතර එමගින් දැනුම්වත්භාවය සහ විශ්වාසය ඇති කිරීමට මහඟු පිටුවහලක් විය.

- ආචාර්ය අජිත් රවීන්ද්‍ර ද මෙල් මහතා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපති ලෙස තනතුර භාර ගැනීම (ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවලින්)
- රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය 2019 සිට 2023 දක්වා කාල සීමාව සහ 2024 වසරේ තෙවන කාර්තුව පිළිබඳ සමාලෝචනයක්.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 'සිත්තරා' චිත්‍ර තරඟය සාර්ථකව නිමා කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සඳහා නව කොමිෂන් සභා සාමාජිකයින් පත් කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාල හා වෘත්තීයවේදීන් සමග දැනුම හුවමාරු කර ගැනීම සහ රක්ෂණ ක්ෂේත්‍රයේ සහයෝගීතාව සඳහා වන සමාරම්භක වැඩසටහන සාර්ථකව පවත්වයි.
- රජය සහ රක්ෂණ අංශය අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා, මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙයි.
- රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දීපව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩසටහනක් මාතර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය සමාලෝචනය කිරීම: 2020 සිට 2024 දක්වා කාල සීමාව සහ 2025 වසරේ පළමු කාර්තුව.
- ශක්තිමත් සහ ස්ථාවර රක්ෂණ අනාගතයකට පියවර තැබීම, පදනම් කොටගෙන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි නිලධාරීන් ඉන්දීය රක්ෂණ නියාමන අධිකාරිය සහ අනෙකුත් ඉන්දීය රක්ෂණ ක්ෂේත්‍රයේ ආයතන නිරීක්ෂණය සඳහා අධ්‍යයන සංචාරයක නිරත වීම.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මාතලේ පැවති මූල්‍ය සාක්ෂරතා ප්‍රදර්ශනයට සහභාගී වෙයි.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව "සුරක්ෂිත අනාගතයකට සැමට රක්ෂණය" යන තේමාව යටතේ උතුරු පළාතේ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ කටයුතු පුළුල් කරයි.

"සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්" යන තේමාව යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව උතුරු පළාතේ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වීදි සංදර්ශන (Road show) පවත්වයි.

- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අන්තර් විශ්වවිද්‍යාල රක්ෂණ දැනුම මිනුම තරඟය - "InsureChamp 2025" ආරම්භ කරයි.
- ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය නූතන සංකල්ප සමඟ යාවත්කාලීන කිරීමේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි මෙහෙයුම.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින්, ජීවිත රක්ෂණ නිපැයුම් සමාලෝචනය සහ සංවර්ධනය පිළිබඳව මහජන අදහස් විමසීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සඳහා නව කොමිෂන් සභා

සාමාජිකයින් පත් කිරීම.

- “දිට්වා” සුළි කුණාටුව සහ ගංවතුර ආශ්‍රිත රක්ෂණ හිමිකම් ලබා දීම කඩිනම් කිරීමේ පියවර පිළිබඳව මහා භාණ්ඩාගාර ලේකම් සාකච්ඡා කරයි.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල අනුකූලතා නිලධාරීන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම වැළැක්වීම හා මර්ධනය/විනාශකාරී ආයුධ ප්‍රසාරණය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම වැලැක්වීම (AML/CFT/PWMD) පිළිබඳ දැනුවත් කිරීම.
- Solvency Margin (Risk Based Capital) නීති 2015 සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජන උපදේශන ක්‍රියාවලියක් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහ මූල්‍ය බුද්ධි ඒකකය අතර මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම වැළැක්වීම සහ විනාශකාරී ආයුධ ප්‍රසාරණය පිළිබඳ අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා බලපත්‍රලාභී රක්ෂණ සමාගම් සහ තැරැව්කාර සමාගම් සඳහා ඒකාබද්ධ නියාමන ක්‍රියාවලියකට අදාල Terms of Reference (TOR) ගිවිසුමක් අත්සන් කරන ලදී.




දෛනික සහ සතිඅන්ත පුවත්පත් හරහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ වූ පුවත්පත් නිවේදන මගින් රක්ෂණය පිළිබඳ අත්‍යවශ්‍ය කරුණු පාඨකයන් වෙත ගෙන යන ලදී. මෙම සෑම නිවේදනයක්ම හුදු තොරතුරු සැපයීමක් පමණක් නොව, ප්‍රජාව සවිබල ගැන්වීම, දැනුවත්භාවය ඇති කිරීම සහ වඩාත් විශ්වාසදායී, දැනුවත් මහජනතාවක් නිර්මාණය කිරීම උදෙසා තැබූ පියවරක් විය.

- “වෙළඳපොල මිලට රක්ෂණය නොකිරීම හේතුවෙන් ඔබගේ මෝටර් වාහන රක්ෂණ හිමිකම අඩු වීමක් සිදු වුවාද ? එසේනම් අපට අමතන්න”
- “ඔබේ ජීවිත රක්ෂණ ප්‍රතිලාභ අහිමි වීමට ඉඩ නොදෙන්න”
- “මෝටර් වාහන අනතුරු හේතුවෙන් තුන්වන පාර්ශවයන්ට සිදුවන හානි සඳහා රුපියල් 1,000,000 ක් දක්වා වන්දි ලබාගත හැකි විකල්ප ක්‍රමවේදය”




## දැනුම්වත්භාවය ඉහළ නැංවීම: රූපවාහිනිය සහ ගුවන්විදුලිය

රට පුරා රක්ෂණය පිළිබඳ පණිවිඩය රැගෙන යාම සඳහා කොමිෂන් සභාව රූපවාහිනී සහ ගුවන්විදුලි මාධ්‍ය හොඳින් උපයෝගී කර ගත් අතර එමගින් රක්ෂණයේ ප්‍රධාන සංකල්ප ජනතාව වෙත සමීප කිරීමට හැකි විය. සෑම වැඩසටහනක්ම පාහේ මහජනතාව දැනුවත් කිරීමට, ඔවුන් සම්බන්ධ කර ගැනීමට සහ ඔවුන් සමග සමීප සබඳතාවක් ගොඩනැගීමට හැකි වන පරිදි ඉතා සැලසුම් සහගතව නිර්මාණය කර තිබුණි. සංකීර්ණ රක්ෂණ සංකල්ප, සාමාන්‍ය ජනතාවට තේරුම් ගත හැකි සරල කතන්දර බවට පත් කරමින්, විශ්වාසදායී තීරණ ගැනීමට මහජනතාව සවිබල ගැන්වීම මෙහි අරමුණ විය.

- සාරප්‍රභාගිර ගුවන්විදුලි වැඩසටහන - 2025 ජූනි 20 (කොමිෂන් සභාව විසින් නිර්මාණය කල රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පෙළ, ඉතා හරවත්, ආකර්ෂණීය හා සරල ලෙස මහජනතාව වෙත ගෙනයාමට හැකිවීම).
- වනක්කම් නේත්‍රා රූපවාහිනි වැඩසටහන - 2025 නොවැම්බර් 24: රක්ෂණයේ ප්‍රධාන අංශ පිළිබඳ සාකච්ඡාව දමිළ භාෂාවෙන් දමිළ ප්‍රේක්ෂකයින් අතරට ගෙන යන ලදී).
- InsureChamp 2025 - රූපවාහිනි නාලිකාව ඔස්සේ - 2025 දෙසැම්බර් 07: අන්තර් විශ්ව විද්‍යාලීය ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සහ විවිධ ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ කර ගන්නා ලදි).
- ටෙලිවිෂන් වංගුව - 15 වන කොටස - Supreme TV නාලිකාව ඔස්සේ - 2025 දෙසැම්බර් 23: රක්ෂණ හිමිකම්, කඩිනම් වන්දි පියවීම් සහ රක්ෂණ ක්ෂේත්‍රයේ නවතම තොරතුරු පිළිබඳව මෙහිදී අවධාරණය කෙරුණු අතර එමගින් මහජන විශ්වාසය සහ විනිවිදභාවය තහවුරු කරන ලදී).

මෙම විකාශන හරහා සංකීර්ණ සංකල්ප සරල හා තේරුම් ගත හැකි අයුරින් ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව කටයුතු කළ අතර එමගින් ජනතාව තුළ රක්ෂණය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇති කිරීමට සහ රට පුරා විශ්වාසයක් ගොඩනැගීමට හැකි විය.




## ඩිජිටල් අනාගතය: මාර්ගගත ක්‍රම ඔස්සේ පාඨකයන් වෙත සමීප වීම

### නවතම තොරතුරු ඔබ අසලටම: ඊ-පුවත් ලිපිය

කොමිෂන් සභාව විසින් නිර්මාණය කරනු ලැබූ ඊ-පුවත් ලිපිය, රක්ෂණ ක්ෂේත්‍රයේ නවතම තොරතුරු සහ වැදගත් රක්ෂණ දැනුම සෑපුවම පාඨකයන් වෙත සමීප කරන වාර්ෂික ප්‍රකාශනයකි. එයට ලැබෙන දායකත්වය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින්, රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සහ විද්වතුන් ඇතුළු විවිධ පාර්ශවකරුවන්ගෙන් ලිපි ලබා ගනිමින් කොමිෂන් සභාව විසින් වඩාත් පුළුල් හා අන්තර්ග්‍රාහී ප්‍රවේශයක් අනුගමනය කරන ලදි. මෙම ලිපි ඉතා සුපරීක්ෂාකාරීව සමාලෝචනයට ලක් කෙරුණු අතර එමගින් විවිධ දෘෂ්ටිකෝණයන්, පර්යේෂණ සහ ප්‍රායෝගික අත්දැකීම් එක්තැන් කිරීමට හැකි විය.

කොමිෂන් සභාවේ 25 වන සංවත්සරය සනිටුහන් කරමින් 2026 මාර්තු මාසයේදී විශේෂ කලාපයක් ලෙස මෙම ලිපි එකතුව එළිදැක්වීමට නියමිතය. මෙම විශේෂ කලාපය මගින් රක්ෂණ ක්ෂේත්‍රයේ සාමූහික හඬ නිරූපණය වන අතර නවතම දෘෂ්ටිකෝණයන් සහ ගැඹුරු අවබෝධයක් ලබා දෙන අන්තර්ගතයන් ඉදිරිපත් කරමින් පාඨකයන් දැනුවත් කිරීමටත් ඔවුන් දිරිමත් කිරීමටත් අපේක්ෂා කෙරේ.

### අන්තර්ජාල අනාගතය: සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ දැනුම්වත්භාවය ඇති කිරීම

රක්ෂණය පිළිබඳ දැනුම්වත්භාවය ඇති කිරීම සඳහා කොමිෂන් සභාව විසින් Facebook, LinkedIn, YouTube සහ රක්ෂණ ක්ෂේත්‍රයේ පිරිස් කැටිකොට සෑදූ WhatsApp සමූහ වැනි සමාජ මාධ්‍ය ජාලයන් උපයෝගී කර ගන්නා ලදී. ඉතා සුපරීක්ෂාකාරීව සකස් කරන ලද පළ කිරීම් හරහා රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම්වල සිට ක්ෂේත්‍රයේ නවතම ප්‍රවණතා සහ අධ්‍යාපනික පණිවිඩ දක්වා වූ විවිධ තොරතුරු සහ අත්දැකීම් බෙදා ගැනීමට කටයුතු කෙරිණි. මෙම සෑම සන්නිවේදනයක්ම පාහේ මහජනතාව දැනුවත් කිරීමටත් විශ්වාසදායී තීරණ ගැනීමට ඔවුන් සවිබල ගැන්වීමටත් සැලසුම් කර තිබුණි. තවද, මෙම මාධ්‍යයන් ඔස්සේ කාලෝචිත ලෙස නියාමන යාවත්කාලීන කිරීම් ලබා දීම සඳහා කොමිෂන් සභාව නිසැකව කටයුතු කළ අතර එමගින් මහජනතාව සහ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් නිරන්තරයෙන් දැනුවත්ව සිටීම සහතික කෙරිණි.

මෙම ඩිජිටල් වැඩසටහන් මගින් පුළුල් හා උද්‍යෝගිමත් ප්‍රේක්ෂක පිරිසක් වෙත සමීප වූ අතර සංකීර්ණ රක්ෂණ මාතෘකා පහසුවෙන් තේරුම් ගත හැකි දැනුමක් බවට පරිවර්තනය කරමින් රට පුරා රක්ෂණය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති කිරීමට දායක විය.












## ජංගම දුරකථනය වෙත රක්ෂණය පිළිබඳ නව තොරතුරු එසැනින් කෙටි පණිවිඩ සේවා (SMS) මගින් ජනතාව වෙත සමීප වීම

මහජනතාව සෘජුවම රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් කෙටි පණිවිඩ සේවාව සන්නිවේදන මෙවලමක් ලෙස භාවිතා කරන ලදී. මේ සඳහා ආයතනය තුළම සංවර්ධනය කරන ලද 6800 කට අධික ජංගම දුරකථන ග්‍රාහකයින්ගෙන් සමන්විත දත්ත පද්ධතියක් උපයෝගී කරගත් අතර රක්ෂණයේ ප්‍රධාන සංකල්ප අවධාරණය කරමින් සහ නිවැරදි තීරණ ගැනීමට දිරිමත් කරමින් වසර පුරා පණිවිඩ යැවීමට කටයුතු කෙරිණි.




## රක්ෂණය පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමේ කෙටිකතා නිර්මාණ

ගිනි, මෝටර් රථ සහ සෞඛ්‍ය රක්ෂණය පිළිබඳව මහජනතාව වඩාත් හොඳින් දැනුවත් කිරීම සඳහා පහත සඳහන් පරිදි වීඩියෝ කෙටිකතා මාලාවක් නිර්මාණය කරන ලදී:

- **රුවන් සහ හරිනි:** සෞඛ්‍යය සහ බලාපොරොත්තුව පිළිබඳ කතාවක් - සෞඛ්‍ය රක්ෂණයේ වැදගත්කම මෙහිදී අවධාරණය කෙරේ.
- **මෝටර් රථ රක්ෂණය:** නිමල්ගේ කතාව - මෝටර් රථ රක්ෂණයේ ප්‍රතිලාභ සහ වෙළඳපොළ අගය අනුව රක්ෂණය කිරීමේ වැදගත්කම මෙහිදී පැහැදිලි කෙරේ.
- **ගිනි රක්ෂණය:** නිමල් සහ අමිලගේ කතාව - ගින්නක් හේතුවෙන් ඇතිවිය හැකි අවදානම් සඳහා ලැබෙන ආවරණය මෙහිදී නිරූපණය කෙරේ.
- **විකල්ප වන්දි ක්‍රමය:** තෙවන පාර්ශවීය මෝටර් රථ අනතුරු වින්දිතයන් සඳහා ලබාදෙන වන්දි ක්‍රමය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

ආකර්ෂණීය කෙටි කතන්දර නිර්මාණය කිරීමේ කලාව උපයෝගී කර ගනිමින් නිර්මාණය වූ මෙම වීඩියෝ කතා මාලාවන් හරහා රක්ෂණයේ න්‍යායාත්මක සංකල්ප තේරුම් ගත හැකි සරල කෙටි කතා බවට පත් කරන ලදී.




## දැනුම් පියසඃ සෑම රක්ෂණ ඔප්පු හිමියෙකු සඳහාම ඊ අත්පොත්

සිංහල සහ දමිල භාෂාවලින් දැනටමත් පවතින අත්පොත්වලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් සැකසූ සවිස්තරාත්මක ඉලෙක්ට්‍රොනික් අත්පොත් හතක් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෝටර් රථ, ජීවිත, සෞඛ්‍ය, දේපළ සහ සංචාරක රක්ෂණය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සකස් කර ඇති මෙම ඊ-අත්පොත මගින් සංකීර්ණ රක්ෂණ සංකල්ප පැහැදිලි හා ප්‍රායෝගික තොරතුරු බවට පරිවර්තනය කර ලබා දී ඇත. මෙවැනි පහසුවෙන් ලබාගත හැකි සහ තේරුම් ගත හැකි ප්‍රකාශන සම්පත් ලබා දීම මගින් මහජනතාව රක්ෂණය පිළිබඳව දැනුවත්ව තීරණ ගැනීමට සවිබල ගැන්වීම, මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සහ රක්ෂණ ක්ෂේත්‍රය සමග සම්බන්ධ වීමේදී වඩාත් විශ්වාසදායී ලෙස කටයුතු කිරීමට මග පෙන්වීම කොමිෂන් සභාවේ අරමුණයි.



## මූල්‍ය දැනුවත්භාවය ඉහළ නැංවීම: FinLit ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2025

රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාසය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ ප්‍රදර්ශන සඳහා කොමිෂන් සභාව සහභාගී විය. මෙම ප්‍රදර්ශණ මාතලේ (සැප්තැම්බර් 12), අනුරාධපුර (ඔක්තෝබර් 2) සහ මාතර (ඔක්තෝබර් 28) යන නගර කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදී. සම්ප්‍රදායික ප්‍රදර්ශණ කුටිවලින් ඔබ්බට යමින් මෙහිදී සිසුන්, රජයේ නිලධාරීන් සහ මහජනතාව සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ අන්තර්ක්‍රියාකාරී සැසි පවත්වනු ලැබීය. රක්ෂණ හිමිකම් ඉදිරිපත් කරන ආකාරය, නිවැරදි රක්ෂණ නිපැයුම් තෝරා ගැනීමේදී සැලකිය යුතු ප්‍රධාන කරුණු, තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අවබෝධය සහ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීය අවස්ථා පිළිබඳව ගවේෂණය කිරීම වැනි තොරතුරු ලබා ගැනීමට සහභාගිවන්නන්ට මෙහිදී අවස්ථාව සැලසුණි.

මෙම ප්‍රදර්ශන මගින් මහජනතාව තුළ පැවති කුතුහලය සහ ගැටළු මනා අවබෝධයක් බවටත් එම අවබෝධය රක්ෂණය කෙරෙහි ඇති විශ්වාසයක් බවටත් පරිවර්තනය කරන ලදී. සෑම දිනකම අවසානයේ සහභාගිවන්නන් නිසි මූල්‍ය තීරණ ගැනීමට සහ සුරක්ෂිත අනාගතයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය ප්‍රායෝගික දැනුමෙන් සන්නද්ධ විය.




## අනාගතය ගොඩනගන දැනුම: පාසල් විෂය මාලාව

අනාගතය සුරක්ෂිත කරන අධ්‍යාපනය පිළිබඳ අවධානය යොමු කිරීම, කොමිෂන් සභාවෙහි දැක්මෙහි විශේෂ අවධානයක් යොමු කරන අංගයක් වේ. ඒ අනුව, පාසල් විෂය මාලාවට (6 සිට 10 දක්වා ශ්‍රේණි) රක්ෂණය පිළිබඳ විෂය කරුණු ඇතුළත් කිරීමේ යෝජනාවක් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ගරු අග්‍රාමාත්‍යවරිය වෙත ඉදිරිපත් කරන ලදී. තරුණ මනස සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පාඩම් මාලාවන් සකස් කිරීමේ කටයුතු ක්‍රියාකාරී කමිටුවක් විසින් ආරම්භ කරන ලදී. එහිදී හුදෙක් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි පමණක් නොව අවදානම් පිළිබඳ දැනුම්වත්භාවය, ආරක්ෂාව සහ මූල්‍ය සාක්ෂරතාවයේ වැදගත්කම ඉගැන්වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. එමගින් අනාගත පරපුරට ජීවිතයේ අවිනිශ්චිතතාවයන් හමුවේ විශ්වාසයෙන් යුතුව මුහුණ දීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දෙනු ඇත.

## දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

### ශ්‍රී ලංකාව තුළ සියළුම පළාත් ආවරණය වන පරිදි මහජනතාව සඳහා: රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පෙළගැස්ම

ජුනි මාසයේදී, කොමිෂන් සභාව විසින් රක්ෂණ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් වන ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සමග එක්ව "සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්" යන තේමාව යටතේ මාතර දිස්ත්‍රික්කය පුරා දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කරන ලදී. මාර්ග දැක්මන්, අන්තර්ක්‍රියාකාරී වැඩමුළු සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් හරහා රක්ෂණ සංකල්ප, එහි ප්‍රතිලාභ, නියාමන කාර්යයන් සහ වෘත්තීය අවස්ථා පිළිබඳව පාසල් සිසුන්, ගුරුවරුන්, විශ්වවිද්‍යාල සිසුන්, කථිකාචාර්යවරුන්, රජයේ නිලධාරීන් සහ ප්‍රජා සාමාජිකයින් දැනුවත් කරන ලදී. උපකාරක මධ්‍යස්ථාන (Help desk) මගින් ලබා දුන් මග පෙන්වීම් නිසා සංකීර්ණ රක්ෂණ සංකල්ප පහසුවෙන් අවබෝධ කර ගැනීමට සහභාගිවන්නන්ට අවස්ථාව ලැබුණි. ඔක්තෝබර් මාසයේදී මෙම වැඩසටහන යාපනය සහ කිලිනොච්චිය දිස්ත්‍රික්කවලද ක්‍රියාත්මක කරන ලදී. එහිදී එම ප්‍රදේශවල, පාසල් සිසුන්, ගුරුවරුන්, විශ්වවිද්‍යාල සිසුන්, කථිකාචාර්යවරුන්, රජයේ නිලධාරීන් සහ වාණිජ මණ්ඩල සාමාජිකයින් සම්බන්ධ කර ගනිමින් රක්ෂණ සංකල්ප, රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් මෙන්ම ක්ෂේත්‍රයේ පවතින වෘත්තීය අවස්ථා පිළිබඳව ඔවුන්ගේ අවබෝධය ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

මෙම වැඩසටහන් සඳහා 3200 කට අධික පිරිසක් සහභාගී වූ අතර එමගින් රක්ෂණය පිළිබඳ වැඩි දැනුමක්, විශ්වාසයක් සහ සහතිකයක් ගොඩනැගීමට හැකි විය. මෙම මූලාරම්භයන් මගින් රක්ෂණය මහජනතාවට සමීප කළ අතර දිස්ත්‍රික්, පළාත් සහ අවසාන වශයෙන් මුළු රට පුරාම මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී.






### අන්තර් විශ්වවිද්‍යාලීය ප්‍රශ්න විචාරාත්මක තරඟය - රක්ෂණ ක්ෂේත්‍රයේ අනාගතය ගොඩනැගීම

"රක්ෂණ ක්ෂේත්‍රයේ අනාගත නායකයින් සවිබල ගැන්වීම" යන තේමාව යටතේ කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද අන්තර් විශ්වවිද්‍යාලීය රක්ෂණ විෂය ආශ්‍රිත ප්‍රශ්න විචාරාත්මක තරඟය, "InsureChamp 2025" නමින් 2025 නොවැම්බර් 20 වන දින පවත්වන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති විශ්වවිද්‍යාල සහ උපාධි පිරිනමන ආයතන දාහතක් (17) මෙම තරඟයට එක් විය. මෙහිදී ප්‍රශ්න විචාරාත්මක වටයන්ට අමතරව වඩාත් ආකර්ෂණීය කණ්ඩායම තේරීමේ තරඟයක්ද පවත්වන ලදී. ඒ සඳහා ඇතුළත් වූ, ටික්ටොක් වීඩියෝ අභියෝගය මගින් රක්ෂණය නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමට විශ්ව විද්‍යාල සිසුන් ඉතා උනන්දුවක් දක්වන ලදී.

තරඟකරුවෝ, රක්ෂණය, මූල්‍ය සාක්ෂරතාවය සහ දැනුම මිනුම පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ අතර රක්ෂණ ක්ෂේත්‍රයේ පවතින වෘත්තීය අවස්ථා පිළිබඳවද මනා අවබෝධයක් ලබා ගත්හ. ජයග්‍රාහකයින් කුසලාන, පදක්කම්, මුදල් සහ සහතික පත්‍රවලින් පිදුම් ලැබූ අතර එමගින් ඔවුන්ගේ විශිෂ්ටත්වය, කණ්ඩායම් හැඟීම සහ නායකත්වය ඇගයීමට ලක් කෙරිණි. සජීවී විකාශන, සමාජ මාධ්‍ය මඟින්ද සහ පුවත්පත් වාර්තාකරණය හරහා මෙම වැඩසටහන විශාල ප්‍රේක්ෂක පිරිසක් වෙත සමීප විය.

InsureChamp 2025 යනු හුදු ප්‍රශ්න විචාරාත්මක තරඟයක් පමණක් නොව, එය තරුණ මනස දිරිමත් කළ, කුතුහලය ජනිත කළ සහ ඊළඟ පරපුරේ රක්ෂණ නායකයින් උනන්දු කරවූ සුවිශේෂී මූලාරම්භයකි. එමඟින් තරුණ ප්‍රජාව අතර මූල්‍ය සාක්ෂරතාවය සහ ක්ෂේත්‍රය සමග ඇති සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම යන කොමිෂන් සභාවෙහි මෙහෙවර තවදුරටත් තහවුරු විය.



## නියාමන මුල් පිරීම්

2025 වසරේදී, කොමිෂන් සභාවේ මූලික අවධානය යොමු වූයේ විනිවිදභාවයෙන් යුත්, සාධාරණ සහ ශක්තිමත් රක්ෂණ ක්ෂේත්‍රයක් සහතික කිරීම සඳහා නියාමන රාමුව බලගැන්වීම කෙරෙහිය. අනුකූලතා ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම, මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ රක්ෂණ ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවකරුවන් සමග සක්‍රීයව සම්බන්ධ වීම හරහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි පවතින විශ්වාසය ප්‍රවර්ධනය කිරීමටත් කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී.

### සුවිශේෂී අවධානයෙන්: රක්ෂණ දැන්වීම් සමාලෝචනය මගින් ඔප්පු හිමියන් සුරැකීම

රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමේ පළමු පියවර වන්නේ පැහැදිලි සහ නිවැරදි සන්නිවේදනයක් පවත්වා ගැනීමයි. ඒ අනුව, රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ නිපැයුම් වලට අදාළ සෑම ප්‍රචාරණ දැන්වීමක්ම, 2024 අංක 04 දරන විධානයේ සඳහන් ප්‍රමිතීන්ට අනුකූලදැයි අඛණ්ඩව ඉතා සුපරීක්ෂාකාරීව සමාලෝචනය කරනු ලැබේ. එමගින් සෑම ප්‍රකාශයක්ම පැහැදිලි, නිවැරදි සහ විශ්වාසදායී මට්ටමක පවත්වා ගැනීම සහතික කෙරේ.

වසර තුලදී රක්ෂණකරුවන්ගේ නිල සමාජ මාධ්‍ය ජාලයන්හි පළ කරනු ලැබූ දැන්වීම් සම්බන්ධයෙන් පවත්වනු ලබන අඛණ්ඩ නිරීක්ෂණය මගින් එම අන්තර්ගතයන් අනුමත කරන ලද දැන්වීම් සමග අනුකූල වන බව සහතික කරන ලද අතර පැවති විෂමතාවයක් සඳහා වහාම ක්‍රියාමාර්ග ගන්නා ලදී.

අඛණ්ඩ අධීක්ෂණය සහ තීරණාත්මක මැදිහත්වීම් හරහා අනුකූල නොවන තත්ත්වයන් ඇතිවීමට පෙර ඒවා වැළැක්වීමට කොමිෂන් සභාව නිරන්තරයෙන් පියවර ගනියි. මෙහිදී විනිවිදභාවය යනු හුදු පොරොන්දුවක් පමණක් නොව, එමගින් රක්ෂණ ක්‍රියාවලියේ සෑම පියවරකදීම රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සහ ශක්තිමත් විශ්වාසයක් ගොඩනගනු ලැබේ.

### තිරසාර අනාගතයක් සකස් කිරීම: තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ මාර්ගෝපදේශය

වසර ආරම්භ වූයේ වගකීම් සහගත බව උදෙසා තැබූ ප්‍රබල පියවරක් සමඟිනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍ය ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, රක්ෂණ ක්ෂේත්‍රය තිරසාර සංවර්ධන ඉලක්ක කරා යොමු කිරීම සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා රක්ෂණ ක්ෂේත්‍රය පුරා තිරසාර මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය යටතේ කැපවූ ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවීමට නියමිතය.

### සෑම ඔප්පුවකම පැහැදිලි බව: රක්ෂණ නිපැයුම් තොරතුරු ලේඛන සමාලෝචනය

රක්ෂණ ඔප්පුවල පැහැදිලි බව සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සමාග ම්වල රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛන සමාලෝචනය කරන ලදී. එහිදී එම ලේඛන තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය අදහස් හා යෝජනා ලබා දීමට කටයුතු කෙරිණි. සංකීර්ණ රෙගුලාසි සහ වගන්ති, සරල හා තේරුම් ගත හැකි මාර්ගෝපදේශ බවට

පත් කිරීම හරහා විශ්වාසයෙන් යුතුව නිවැරදි තීරණ ගැනීමට රක්ෂණ ඔප්පු හිමියන්ට අවස්ථාව සලසා දෙන ලදී.

## උපායමාර්ගික අවධානය: විනිවිදභාවය, ප්‍රවේශය සහ ඔප්පු හිමියන්ගේ විශ්වාසය ඉහළ නැංවීම

### හිමිකම් පිළිබඳ අවධානය: හිමිකම් පෑම් පිළිබඳ දත්ත

කොමිෂන් සභාව විසින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණකරුවන්ගෙන් ලබාගත් සවිස්තරාත්මක වන්දි හිමිකම් පෑම් පිළිබඳ දත්ත රැස්කර ප්‍රකාශයට පත් කරන ලදී. එමගින් රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්ය සාධනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් රක්ෂණ ඔප්පුහිමියන් වෙත ලබා දීමට හැකි විය. මෙම තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීම හරහා රක්ෂණ ක්ෂේත්‍රයේ විනිවිදභාවය ප්‍රවර්ධනය වූ අතර රක්ෂණාවරණ මිලදී ගැනීමේදී විවිධ රක්ෂණකරුවන් සංසන්දනය කර බලා දැනුවත්ව තීරණ ගැනීමට පාරිභෝගිකයාට අවස්ථාව ලැබේ. තවද, මෙම ප්‍රයත්නය රක්ෂණ ක්ෂේත්‍රයේ වගකීම් සහගත බව ඉහළ නැංවීමටත්, රක්ෂණකරුවන්ගේ වන්දි ගෙවීමේ ක්‍රියාවලීන් සහ පාරිභෝගික සේවාව වැඩිදියුණු කිරීමටත් දිරිගැන්වීමක් විය.







### සියලුම ජනතාවට රක්ෂණ නිපැයුම් පහසුවෙන් ලබා ගැනීමට හැකි පරිදි සම්මත රක්ෂණ නිපැයුම් හඳුන්වා දීම

පුද්ගලික අනතුරු ආවරණය සහ කාලික ජීවිත රක්ෂණය යන සම්මත නිපැයුම් ද්විත්වය සකසා, එය වැඩි දියුණු කිරීම සහ රක්ෂණ ක්ෂේත්‍රයට නිකුත් කිරීම පිළිබඳව අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය වෙත යොමු කරන ලදී. මෙම නිෂ්පාදන මගින් රක්ෂණය වඩාත් සරල, සම්මත සහ පහසුවෙන් ලබාගත හැකි රක්ෂණ නිපැයුම් බවට පත් කෙරේ. මෙහි ඇති සංකීර්ණත්වය අවම කිරීම හරහා විවිධ ප්‍රජාවන් වෙත වඩාත් පහසුවෙන් ලඟාවීම සහ දැරිය හැකි මුදලකට රක්ෂණාවරණයක් ලබා දීමට කොමිෂන් සභාවට හැකි වේ.

### සංවාදය තුළින් විශ්වාසය ගොඩනැගීම: ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ මහජන අදහස් විමසීම

2025 වසරේදී "නවෝත්පාදනය සහ විශ්වාසය වර්ධනය කිරීම" යන තේමාව යටතේ ජීවිත රක්ෂණය සඳහා අනාගතයේ විය යුතු වැඩි දියුණුවීම් සහ පවතින ගැටළු පිළිබඳ සවිස්තරාත්මක ලිඛිත අදහස් හුවමාරුවකට සහභාගී වන ලෙස කොමිෂන් සභාව විසින් සමස්ත ශ්‍රී ලංකාවාසී සියළුම පුරවැසියන්ට ආරාධනා කරන ලදී. මෙහිදී රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කරුව්කාර සමාගම්, පාරිභෝගික කණ්ඩායම්, මූල්‍ය විශේෂඥයන් සහ මහජනතාව යන රක්ෂණ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් ජීවිත රක්ෂණ නිෂ්පාදන, බෙදා හැරීමේ මාර්ග සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලීන් පිළිබඳ ඔවුන්ගේ දෘෂ්ටිකෝණයන් මගින් නව අදහස් ලබා ගන්නා ලදී.

මෙම මහජන අදහස් විමසීම විවෘත ලිඛිත අදහස් හුවමාරුවක් වූ අතර එමගින් පාරිභෝගිකයින්ගේ පුළුල් වන මූල්‍ය ආරක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා පවතින අභියෝග හඳුනා ගැනීමටත් වැඩිදියුණු කිරීම් සහ නව්‍ය විසඳුම් යෝජනා කිරීමටත් සහභාගිවන්නන්ට අවස්ථාව ලැබුණි. මෙමගින් ලබාදුන් තොරතුරු, මගින් රක්ෂණ නිපැයුම් සංවර්ධනය ඉහළ නැංවීමට, වන්දි කළමනාකරණ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමට සහ බෙදා හැරීමේ ක්‍රියාවලියන් වැඩිදියුණු කිරීමට කොමිෂන් සභාවට වටිනා අදහස් සපයා ඇත. මෙම අදහස් සමාලෝචනය කර 2026 වසරේ මුල් භාගයේ දී රක්ෂණ ක්ෂේත්‍රය වෙත අවශ්‍ය නිර්දේශ ලබා දීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.



### රක්ෂණ ඔප්පු හිමියන් සුරැකීම: පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව

කොමිෂන් සභාවේ මූලික අවධානය නිරන්තරයෙන්ම යොමු වූයේ රක්ෂණ ඔප්පු හිමියන් වෙතය. ඒ අනුව, ජාත්‍යන්තර රක්ෂණ නියාමන මූලධර්මයක් වන ICP 19 මගින් දක්වා තිබෙන මාර්ගෝපදේශ හා වත්මන් නියාමන රාමුවෙහි පවතින අඩුපාඩු විශ්ලේෂණය කර පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කළ හැකි අංශ හඳුනාගෙන ඒ පිළිබඳ නිර්දේශ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙහිදී සිදු කරන ලද සෑම ක්‍රියාවක් සහ සමාලෝචනයක් මගින් එක් ප්‍රධාන මූලධර්මයක් අවධාරණය කෙරිණි: එනම්, රක්ෂණ ඔප්පුහිමියන්ගේ විශ්වාසය ගොඩනැගිය හැක්කේ විනිවිදභාවය, සුපරීක්ෂාකාරී වැඩපිළිවෙළ, කැපවීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම තුළින් පමණක් බව.

### රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලයෙහි රක්ෂණ දැනුම හඳුනා ගැනීම: දැනුම්වත්භාවය මැනීමේ ප්‍රශ්නාවලිය

2025 වසරේදී, කොමිෂන් සභාවේ කාර්යභාරය සහ ක්‍රියාකාරකම් පිළිබඳව ක්ෂේත්‍රයේ පවතින අවබෝධය මැන බැලීම සඳහා ප්‍රමුඛ පෙළේ රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල සේවකයින් සහ නියෝජිතයින් සම්බන්ධ කරගනිමින් සමීක්ෂණයක් පවත්වන ලදී. මෙහිදී ලබාගත් තොරතුරු මගින් රක්ෂණ නියාමන කොමිෂන් සභාව පිළිබඳව දැනුම්වත්භාවයේ පවතින අඩුපාඩු සහ සන්නිවේදනය වැඩිදියුණු කළ හැකි අවස්ථා පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලැබිණි. මෙම සොයාගැනීම් පදනම් කරගනිමින් රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලයෙහි කොමිෂන් සභාවේ කාර්යභාරය සහ අනෙකුත් සේවාවන් පිළිබඳ අවබෝධය ශක්තිමත් කිරීමටත් ඉලක්කගත වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමටත් නියමිතය.

තවද, කොමිෂන් සභාව සිය ඩිජිටල් සමාජ මාධ්‍ය ජාල හරහා දැනුවත් කිරීමේහි වැඩසටහන්වල ඵලදායීතාව මැන බැලීම සඳහා කාර්තුමය සමාලෝචන පවත්වනු ලබයි. එමගින් සන්නිවේදන ප්‍රයත්නයන් බලපෑම් සහගත මට්ටමක පවතින බවත් ඒවා රක්ෂණ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සහ මහජනතාව වෙත නිසි ලෙස ළඟා වන බවත් සහතික කෙරේ.

## පුවත් සිරස්තලවලින් ඔබ්බට: රක්ෂණ දැනුම්වත්භාවය ඉහළ නැංවීම

### රක්ෂණ ක්ෂේත්‍රය සහ විශ්ව විද්‍යාල වෘතිකයන් අතර සහයෝගීතාවය: ප්‍රමුඛතා හඳුනාගැනීම සහ සම්බන්ධීකරණය

2025 වසරේදී, රක්ෂණ ක්ෂේත්‍රය සහ විශ්වවිද්‍යාල පද්ධතිය අතර සහයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා සියළුම විශ්වවිද්‍යාල අංශ ප්‍රධානීන් සහ රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පාර්ශවකරුවන් සමග සාකච්ඡා පැවැත්වීමට කොමිෂන් සභාව විසින් පහසුකම් සලසන ලදී. මෙහිදී රක්ෂණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ නැගී එන අභියෝගයන්ට විසඳුම් සෙවිය හැකි පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනා ගැනීමටත් නව අදහස් දිරිමත් කිරීමටත් අවධානය යොමු විය. පර්යේෂණ කටයුතු, වෘත්තීය පුහුණු අවස්ථා සහ ඒකාබද්ධ ව්‍යාපෘති බාධාවකින් තොරව සම්බන්ධීකරණය කිරීම සඳහා අවශ්‍ය නිසි මග පෙන්වීම් ද කොමිෂන් සභාව විසින් සිදු කරන ලදි. මෙම සහයෝගීතාවයේ අරමුණ වන්නේ කුසලතා වර්ධනය කිරීම සහ රක්ෂණ ක්ෂේත්‍රයේ නවයකරණය සඳහා සිසුන්ට මෙන්ම වෘත්තිකයන්ට ද දායක වීමට අවස්ථාව සැලසීමයි.



### වැදගත් සංවාද: මහජන විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

වසර පුරාම, රක්ෂණ ඔප්පු ක්‍රියාවලීන්වල සිට නියාමන මාර්ගෝපදේශ දක්වා වූ පුළුල් පරාසයක විහිදුණු විමසීම් සඳහා රක්ෂණ ඔප්පුහිමියන්, රක්ෂණ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සහ මහජනතාව වෙත කොමිෂන් සභාව ප්‍රතිචාර දැක්වීය. ලැබුණු සෑම ප්‍රශ්නයක්ම හුදු විමසීමකින් ඔබ්බට ගොස්, මහජනතාවගේ රක්ෂණ ගැටළු සඳහා ඔවුන්ට මනා අවබෝධයක් ලැබෙන පරිදි පරිවර්තනය කිරීමට ලැබුණු අවස්ථාවක් ලෙස සලකන ලදී. ඒ අනුව, පැහැදිලි, නිවැරදි සහ කාලෝචිත ප්‍රතිචාර ලබා දීම මගින් රක්ෂණය කෙරෙහි පවතින විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කෙරිණි.

# වෙළඳපොළ අතරමැදි බලපත්‍ර නිකුත් කිරීම සහ අධීක්ෂණය

නීති සහ බලාත්මක කිරීමේ අංශය සහ අධීක්ෂණ අංශය මගින් සිදු කරන ලද ක්‍රියාවලීන් ඒකාබද්ධ කරමින්, රක්ෂණ වෙළඳපොළ අතරමැදියන් සම්බන්ධයෙන් වඩාත් ඉලක්කගත නියාමන කාර්යභාරයක් ඉටු කිරීමේ අරමුණින් 2025 අප්‍රේල් 16 වන දින වෙළඳපොළ අතරමැදි බලපත්‍ර සහ අධීක්ෂණ අංශය පිහිටුවන ලදී. මෙම අංශයේ විෂය පථයට රක්ෂණ තැරැව්කාර සමාගම්, අලාභ ගැලපුම්කරුවන් සහ රක්ෂණ නියෝජිතයින් යන වෙළඳපොළ අතරමැදියන් වර්ග තුනක් ඇතුළත් වේ. මෙම අංශය අධ්‍යක්ෂවරයෙකුගෙන්, සහකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සහ විධායක නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

මෙම අංශය මගින් රක්ෂණ තැරැව්කරුවන් සහ අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදු කරන අතර රක්ෂණ තැරැව්කරුවන්ගේ මූල්‍ය සහ නියාමන අනුකූලතාවය ස්ථානීය සහ ස්ථානීය නොවන අධීක්ෂණ කටයුතු මඟින් සිදු කරනු ලබයි. තවද, දැනට පවතින නීති රාමුවට අනුකූලව රක්ෂණ තැරැව්කාර සමාගම්වලට අදාළව, ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා වන අයදුම්පත් සමාලෝචනය කිරීම; අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ යෝග්‍යතාවය ඇගයීම; විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණයන් ශ්‍රී ලංකාව තුල අලෙවිය සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වලට අවසර ලබා දීම; විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණයන් අලෙවිය සිදු කරන රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා පුද්ගලයන් යොමුකිරීමට වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා අනුමැතිය ලබා දීම; රක්ෂණ තැරැව්කාර කටයුතු නොවන වෙනත් අතිරේක සේවා සැපයීම සඳහා වන අනුමැතිය ලබාදීම, රක්ෂණ තැරැව්කාර සමාගම්වල හිමිකාරීත්වයට සිදුවන සැලකිය යුතු වෙනස් වීම් සඳහා වන අනුමැතිය ලබාදීම සහ වෙළඳ දැන්වීම් ප්‍රවර්ධන සමාලෝචනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

## රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්තුමය මූල්‍ය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන සහ විගණිත මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/16 දරන ගැසට් නිවේදනය සහ එහි පසුකාලීන සංශෝධනවලට අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් සෑම කාර්තුවකම අවසාන දින සිට දින 45ක් ඇතුළත තම කාර්තුමය වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. 2025 වසර තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් 82ක් තම කාර්තුමය වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර එම සමාගම්වල මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ නියාමන විධිවිධානවලට අනුකූල වීම සම්බන්ධව තීරණය කිරීම සඳහා එම වාර්තා සමාලෝචනය කරන ලදී. එහිදී අනාවරණය වූ අනුකූල නොවීම් නිවැරදි කිරීම සඳහා කටයුතු කරන ලෙසද අදාළ තැරැව්කාර සමාගම් වෙත දැනුම් දෙන ලද අතර නිරීක්ෂණය වූ අනෙකුත් අපගමනයන් පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් අදාළ සමාගම් වලින් ලබා ගන්නා ලදි.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 86(2) වගන්තියට අනුව, රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ගිණුම්කරණ කාලසීමාව අවසන් වී මාස හයක් ඇතුළත විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අප අංශය විසින් සමාලෝචනය කරන ලද අතර එහිදී නියාමන විධිවිධානවලින් අපගමනය වීම් නිවැරදි කිරීම සඳහා කටයුතු කරන ලෙස අදාළ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත දැනුම් දෙන ලද අතර අනෙකුත් සැලකිය යුතු නිරීක්ෂණ සම්බන්ධව ගතයුතු පියවර සම්බන්ධවද සමාගම් දැනුවත් කරන ලදී.

## රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා වන අවදානම් තක්සේරු මෙවලම

රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ඉදිරිපත් කරනු ලබන විගණිත මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා මගින් ලබාගන්නා මූල්‍ය හා මූල්‍ය නොවන දත්ත පදනම් කර ගනිමින්, සකස් කරගන්නා ලද අවදානම් තක්සේරු මෙවලමක් රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සිය අධීක්‍ෂණ කටයුතු සඳහා භාවිතා කරයි. මෙම මෙවලම එක් එක් තැරැව්කාර සමාගම හා සම්බන්ධ අවදානම් මට්ටම් හඳුනා ගැනීමට උපකාරී වන පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ලෙස ක්‍රියා කරයි. යම් සමාගමක මුළු වත්කම් ප්‍රමාණය, ශුද්ධ ප්‍රාග්ධනය, කොමිස් ආදායම, ශුද්ධ ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස වත්කම් සංයුතිය, ලාභදායිතා අනුපාතය සහ ද්‍රවශීලතා අනුපාතය වැනි මූල්‍ය දර්ශක මෙන්ම රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය, ව්‍යාපාරයේ ස්වභාවය, අදාල සමාගම අයත්වන සමාගම් සමූහයේ ව්‍යුහය සහ තැරැව්කාර සමාගම ගණුදෙනු සිදුකරනු ලබන රකෂණ සමාගම් සංඛ්‍යාව වැනි මූල්‍ය නොවන දර්ශක පදනම් කරගනිමින් මෙම අවදානම් තක්සේරු මෙවලම් සකස් වී ඇත. මීට අමතරව, මූල්‍ය වාර්තාවල පවතින දෝෂ සහ අතපසුවීම්, දත්තවල පරස්පරතා සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් නොපිළිපැදීම වැනි ගුණාත්මක සාධක ද තැරැව්කාර සමාගම්වල අවදානම් ශ්‍රේණිගත කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත. සමස්ත අවදානම් මට්ටම මත පදනම්ව රක්ෂණ තැරැව්කාර සමාගම් ඉහළ, මධ්‍යම සහ අඩු අවදානම් සමාගම් ලෙස වර්ගීකරණය කර ඇත. මෙහිදී 'ඉහළ අවදානම්' කාණ්ඩයේ පවතින සමාගම්වල ක්‍රියාකාරීත්වය සමීපව නිරීක්ෂණය කිරීම කෙරෙහි අප අංශයේ විශේෂ අවධානය යොමු වේ. අවදානම් ශ්‍රේණිගත කිරීමේදී යම් සමාගමක් අත්කරගන්නා මට්ටමට අනුව එම සමාගම කෙරෙහි ක්‍රියාත්මක වන නියාමන අධීක්ෂණ මට්ටම තීරණය වේ.

## රක්ෂණ තැරැව්කාර සමාගම්වල ස්ථානීය පරීක්ෂණ

මානව සම්පත් හිඟතාවය හේතුවෙන් 2025 වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සිදු කිරීමට හැකි වූයේ ස්ථානීය පරීක්ෂණ තුනක් පමණි. මෙම ස්ථානීය පරීක්ෂණවල අරමුණ වන්නේ රක්ෂණ තැරැව්කාර සමාගම්වල මූල්‍ය කාර්යසාධනය, අභ්‍යන්තර ක්‍රියා පටිපාටි සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි නීති හා රෙගුලාසිවලට දක්වන අනුකූලතාවය ඇගයීමට ලක් කිරීමයි. එකී ස්ථානීය පරීක්ෂණවලදී අනාවරණය වන ප්‍රධාන සොයාගැනීම් හෝ ගැටළු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශයන් ද සමග අදාළ සමාගම් වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබේ.

# වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකයේ සමාලෝචනය

අවදානම්වලට එරෙහිව මූල්‍ය ආරක්ෂාවක් ලබා දීම මගින් රක්ෂණ කර්මාන්තය පුද්ගලයින්, ව්‍යාපාර සහ සමස්ත ආර්ථිකය සුරක්ෂිත කිරීමේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, රක්ෂණයේ කාර්යක්ෂමතාව රඳා පවතින්නේ එහි මූල්‍ය ශක්තිමත්භාවය මත පමණක් නොව, රක්ෂණ සමාගම්, අතරමැදියන් සහ අනෙකුත් වෙළඳපොළ පාර්ශ්වකරුවන් තම ව්‍යාපාරික කටයුතු සිදු කරන ආකාරයද මතය. නුසුදුසු ලෙස රක්ෂණ නිෂ්පාදන අලෙවි කිරීම, ප්‍රමාණවත් තොරතුරු හෙළි නොකිරීම, අසාධාරණ හිමිකම් පියවීමේ පිළිවෙත් සහ දුර්වල පාරිභෝගික පැමිණිලි කළමනාකරණය වැනි ගැටළු රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය බිඳ දැමීමටත්, රක්ෂණ සේවාවන් වෙත යොමු වීම අධෛර්යමත් කිරීමටත් සහ මූල්‍ය අන්තර්ග්‍රාහී බව දුර්වල කිරීමටත් හේතු විය හැක. මෙම පසුබිම තුළ, රක්ෂණ ඔප්පු හිමියන් කෙරෙහි සාධාරණව කටයුතු කිරීම ප්‍රවර්ධනය කිරීමටත්, රක්ෂණ වටිනාකම් දාමය පුරා විනිවිදභාවය සහ වෘත්තීයභාවය ඉහළ නැංවීමටත්, රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි තිරසාර විශ්වාසයක් ගොඩනැගීමටත්, ශක්තිමත් වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණයක් අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ නව ක්‍රියාකාරී අවධියකට පිවිසෙමින්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පැවරී ඇති මූලික අධිකාරය ශක්තිමත් කිරීම සඳහා වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා අධ්‍යක්ෂ යටතේ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය පිහිටුවීම මගින් ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත. මෙම වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකයේ ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව, වෘත්තීයභාවයෙන් යුතුව සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිප්‍රායන් සුරක්ෂිත කිරීමට දැඩි අවධානයක් යොමු කරමින් සිදු කෙරෙන බව තහවුරු කිරීමයි. තම කාර්යභාරය ඉටු කිරීමේදී වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය විසින් නිකුත් කරනු ලැබූ "මූලික රක්ෂණ මූලධර්ම (ICP) 19: ව්‍යාපාරික හැසිරීම" සමඟ තම අධීක්ෂණ ප්‍රවේශය පෙළගස්වා ඇත. මෙම මූලධර්මය මගින් අවධාරණය කරනු ලබන්නේ, රක්ෂණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී, රක්ෂණ ගිවිසුමකට එළඹීමට පෙර සිට එම ගිවිසුම යටතේ ඇති සියළුම වගකීම් ඉටු වන අවසාන මොහොත දක්වාම ගනුදෙනුකරුවන්ට සාධාරණව සැලකීම අනිවාර්ය බවයි.

වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය ස්ථාපිත කිරීමෙන් පහත සඳහන් ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදහස් කෙරේ:

1. රක්ෂණ සේවාවන්හි පූර්ව විකුණුම් අවධියේ සිට පසු විකුණුම් අවධිය දක්වා සෑම අදියරකදීම විනිවිදභාවය, සදාචාරාත්මක පිළිවෙත් සහ සාධාරණව සැලකීම ප්‍රවර්ධනය කිරීම.
2. රක්ෂණකරුවන් තම ගනුදෙනුකරුවන්ගේ උපරිම යහපත උදෙසා, වගකීමෙන් සහ අවංකව කටයුතු කරන බව තහවුරු කිරීම තුළින් රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි මහජන විශ්වාසය ශක්තිමත් කිරීම.
3. සදාචාරාත්මක සහ අනුකූලතාව සහිත ව්‍යාපාරික කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සැපයීම සඳහා හැසිරීම් රීති, මාර්ගෝපදේශ, විධානයන් සහ මෙවලම් සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම.
4. වෙළඳපොළ තුළ සිදුවන නුසුදුසු හෝ නීති විරෝධී ක්‍රියාවන්, ස්ථානීය නොවන නිරීක්ෂණය, අවදානම්-පාදක ස්ථානීය පරීක්ෂණ සහ කාලෝචිත බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග හරහා නිරීක්ෂණය කර, හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම.

## 2025 වසර පිළිබඳ කෙටි විමසුමක්




## 1) වසරේ ප්‍රධාන මූලාරම්භයන්

### අ) ඒකකයේ සම්පත් ශක්තිමත් කිරීම

2025 වසරේදී, වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික සැලසුම් කටයුතු ආරම්භ කිරීමට එම ඒකකය වෙත සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව පියවර ගෙන ඇත. මෙම සහකාර අධ්‍යක්ෂවරයා වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය සඳහා වන උපායමාර්ගික සැලැස්මේ මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීමේදී වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා අධ්‍යක්ෂවරයාට සහාය දැක්වීම ද සිදු කරනු ඇත.

### ආ) රක්ෂණකරුවන්ගේ වෙළඳපොළ හැසිරීම් පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම, 2025

2023-2027 වසර සඳහා වන උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ අංගයක් ලෙස, ප්‍රතිචාරාත්මක නීතිමය සහ නියාමන රාමුවක් සහතික කිරීමේ උපායමාර්ගික අරමුණ යටතේ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණය සඳහා නියාමන රාමුවක් සකස් කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. මෙම කාර්යය වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා අංශය සහ නීති හා බලාත්මක කිරීමේ අංශය වෙත ඒකාබද්ධ කාර්යයභාරයක් ලෙස පවරනු ලැබීය. වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා අධ්‍යක්ෂ යටතේ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය පිහිටුවීමෙන් සහ සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීමෙන් පසුව මෙම කාර්යයභාරය වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය සහ නීති අංශය වෙත පැවරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, සම්මත ක්‍රියාපටිපාටීන් සමඟ පෙළගැස්වීම සඳහාත්, රක්ෂණ කර්මාන්තයේ නිර්දේශයන් ඇතුළත් කිරීම සඳහාත් වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය විසින් රක්ෂණකරුවන්ගේ "වෙළඳපොළ හැසිරීම් පිළිබඳ මාර්ගෝපදේශ" කෙටුම්පත වැඩිදියුණු කරන ලදී. කොමිෂන් සභාවේ 266 වන රැස්වීමේදී ලද අනුමැතිය මත, 2025 ඔක්තෝබර් 03 වන දින ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මෙම මාර්ගෝපදේශ රක්ෂණ කර්මාන්තය වෙත නිකුත් කරන ලදී. මෙම සුවිශේෂී ලේඛනය සදාචාරාත්මක පිළිවෙත් අනුගමනය කිරීම සහ රක්ෂණ ඔප්පු හිමියන්ට සාධාරණව සැලකීම සහතික කිරීම සඳහා වන මූලික නියාමන රාමුව වේ. තවද, මෙම මාර්ගෝපදේශ මගින් රක්ෂණකරුවෙකුගේ මූලික මෙහෙයුම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් වෙළඳපොළ හැසිරීම් සඳහා අවම ප්‍රමිතීන් ස්ථාපිත කරනු ලබයි.

### ඇ) මූලික රක්ෂණ මූලධර්ම 19 හි පරතර විශ්ලේෂණය

උපායමාර්ගික අරමුණු සමඟ සමගාමීව, රක්ෂණකරුවන් සඳහා වන නියාමන සහ අධීක්ෂණ රාමුව තවදුරටත් වැඩිදියුණු කිරීම පිණිස මූලික රක්ෂණ මූලධර්ම 19 (ව්‍යාපාරික හැසිරීම) සම්බන්ධව පරතර විශ්ලේෂණයක් සිදු කිරීමේ වගකීම වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා අංශය වෙතින් වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය භාර ගන්නා ලදී. කොමිෂන් සභාව සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි පවතින නියාමන රාමුව මූලික රක්ෂණ මූලධර්ම 19 හි ප්‍රමිතීන්ට සාපේක්ෂව පුළුල් ඇගයීමකට ලක් කරන ලදී. මෙම විශ්ලේෂණයේදී, මූලික රක්ෂණ මූලධර්ම 19 (ව්‍යාපාරික හැසිරීම) යටතේ පවතින උප-ප්‍රමිතීන් දහතුනකට (13) සාපේක්ෂව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි පවතින රීති, විධානයන්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ සමාලෝචනය කරන ලදී.

### ඈ) රක්ෂණකරුවන් පිළිබඳ තේමාත්මක සමාලෝචනය

අධීක්ෂණ අංශය විසින් සිදු කළ ස්ථානීය පරීක්ෂණයකට සමගාමීව, වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය විසින් සාමාන්‍ය රක්ෂණ සමාගමක් සම්බන්ධයෙන් තේමාත්මක සමාලෝචනයක් සිදු කරන ලදී. මෙම සමාලෝචනය මගින් "රක්ෂණකරුවන්ගේ වෙළඳපොළ හැසිරීම් පිළිබඳ මාර්ගෝපදේශවලට" අනුකූලව, අදාළ සමාගමේ වෙළඳ දැන්වීම්, අලෙවිකරණ පිළිවෙත් සහ පැමිණිලි කළමනාකරණ ක්‍රියා පටිපාටි කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. සමාගම තුළ මතුවෙමින් පවතින ව්‍යාපාර හැසිරීම් සම්බන්ධ අවදානම් මඟහරවා ගැනීමට සහ නිවැරදි කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රධාන අධීක්ෂණ කරුණු එම සමාගම වෙත දැනුම් දෙන ලදී.

### ඉ) දීගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණකරුවන්ගේ හිමිකම්පෑම් පිළිබඳ දත්ත ලබාගැනීමේ ආකෘති පත්‍ර සමාලෝචනය කිරීම

දීගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණකරුවන් සඳහා පැවති වාර්ෂික හිමිකම් දත්ත වාර්තාකරණ ආකෘති පත්‍ර, වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය විසින් වැඩිදියුණු කරන ලදී. මෙම වෙනස්කම් සිදු කිරීමේදී හිමිකම් පෑම පිළිබඳ සාම්ප්‍රදායික දත්තවලින් ඔබ්බට ගොස්, රක්ෂණකරුවන්ගේ හැසිරීම් රටා පිළිබඳ වඩාත් ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

## 2) දැනුම එක්රැස් කිරීමේ මුලපිරීම්

සාමාන්‍ය රක්ෂණ සමාගමක් සම්බන්ධයෙන් සිදු කළ ස්ථානීය පරීක්ෂණයක් සඳහා වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය, විමර්ශන අංශය සමග එක්ව කටයුතු කරන ලදී. මෙම ස්ථානීය පරීක්ෂණය සිදු කරනු ලැබුවේ හිමිකම් පියවීමේ ක්‍රියාවලීන් සහ ඒවා වෙළඳපොළ හැසිරීම් අපේක්ෂාවන්ට අනුකූලද යන්න තක්සේරු කිරීමටයි. මීට අමතරව, වෙළඳපොළ හැසිරීම් මුලපිරීම්, පවතින විචක්ෂණ අධීක්ෂණ රාමුව සමඟ පෙළගැස්වීම කෙරෙහි අවධානය යොමු කරමින් අධීක්ෂණ අංශය සමඟ අන්තර්-අංශ සාකච්ඡාවක්ද පවත්වන ලදී.

**ඉදිරි ගමන: විස්තීර්ණ අධීක්ෂණ ප්‍රවේශයක්**

වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ ඒකකය විසින් බහුවිධ අධීක්ෂණ ආකෘතියක් භාවිතා කරන අතර එය ක්‍රමයෙන් ඉදිරි දැක්මක් සහිත, අවදානම්-පාදක ප්‍රවේශයක් කරා ගමන් කරමින් සිටියි:



# මූල්‍ය සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ආදායම් එකතු කිරීම, ගිණුම්කරණය, මූල්‍ය කටයුතු, ගෙවීම්, ආයෝජන, කොමිෂන් සභා අරමුදල සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල පවත්වාගෙනයාම මෙන්ම තොරතුරු තාක්ෂණ කටයුතු සම්බන්ධයෙන් මුදල් අංශය වගකීම දරනු ලබයි. එම අංශය මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ:

## මූල්‍ය කටයුතු

වාර්ෂික අයවැයකරණය සහ සැලසුම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම, වාර්ෂික/මාසික මූල්‍ය ප්‍රකාශන නියමිත වේලාවට සකස් කිරීම, ලියාපදිංචි ගාස්තු, සෙස් බදු, වාර්ෂික ගාස්තු සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු නියමිත වේලාවට අය කර ගැනීම, අතිරික්ත අරමුදල් විචක්ෂණශීලීව ආයෝජනය කිරීම, වැටුප් ලේඛන කටයුතු සිදු කිරීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අදාළ බදු ගෙවීම් සිදු කිරීම සහ බලතල පැවරීමේ ලේඛන සකස් කිරීම.

**සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය සමාලෝචනය පහත පරිදි වේ:**

## රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ පනවනු ලබන සහ අය කරනු ලබන 'සෙස්' බදු මගින් ලබාගන්නා මුදල් තැන්පත් කිරීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල පිහිටුවා ඇත. දැනට, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ලිඛිත වාරික ආදායමෙන් 0.4% ක් සහ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ලිඛිත වාරිකයෙන් 0.2% ක් සෙස් බදු ලෙස අය කරනු ලැබේ. මෙම අරමුදලෙහි පවතින මුදල්, රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සඳහා සහ ඒ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීති මගින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම නිශ්චිත කාර්යයක් සඳහා භාවිතා කරනු ලැබේ.

පනතේ 103 (3) වගන්තියට අනුව, යම් අවස්ථාවකදී කිසියම් කාර්යයක් සඳහා ක්ෂණිකව අවශ්‍ය නොවන ඕනෑම මුදලක්, යහපත් ප්‍රතිලාභයක් ලැබෙන පරිදි සහ ආයෝජනයේ ආරක්ෂාව තහවුරු වන පරිදි විචක්ෂණශීලීව ආයෝජනය කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. ඒ අනුව, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙත එකතු කරන ලද සෙස් මුදල් කොමිෂන් සභාව විසින් විචක්ෂණශීලී අයුරින් ආයෝජනය කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ පොලී අනුපාත පහත වැටීමේ ප්‍රවණතාවය හේතුවෙන්, සමස්ත පොලී ආදායම සැලකිය යුතු ලෙස අඩු විය. 2021 සිට 2025 දක්වා වසර සඳහා සෙස් බදු මුදල් එකතු කිරීම සහ ආයෝජන ආදායම 1 වැනි ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.

**1 ප්‍රස්තාරය**

**2021 - 2025 කාල පරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම**




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම | 544 | 588 | 648 | 764 | 961 |
| ආයෝජන ආදායම | 516 | 1236 | 2199 | 1538 | 1391 |

සෙස් ආදායම (රු. මිලියන) ආයෝජන ආදායම (රු. මිලියන)

පසුගිය වසර පහක කාලය තුළ සෙස් ආදායමේ වර්ධනය 1 වැනි ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ. හිතකර වෙළඳපල තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන් 2023 වසරේදී ආයෝජන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, 2025 වසරේදී පොලී අනුපාත පහත වැටීම හේතුවෙන් ආයෝජන ආදායම ශීඝ්‍රයෙන් අඩුවී තිබේ.

පසුගිය වසර පහක කාලය තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය ඉහළ ගොස් ඇති අතර 2 වැනි ප්‍රස්තාරයෙන් එය නිරූපණය වේ.

**2 ප්‍රස්තාරය**

**2021 - 2025 කාල පරිච්ඡේදය තුල රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම**




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| ආයෝජන වටිනාකම | 8,441 | 9,381 | 11,532 | 13,128 | 15,063 |

ආයෝජන වටිනාකම

2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ වත්කම් සංයුතිය පහතින් නිරූපණය කෙරේ:

**3 ප්‍රස්තාරය**

**2025 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය**




## කොමිෂන් සභාවේ ආදායම

කොමිෂන් සභාවේ ආදායම පහත සඳහන් මූලාශ්‍රවලින් උපයා ගනු ලැබේ:

- රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම් සහ අලාභ ගැළපුම්කරුවන් වෙතින් ලැබෙන ලියාපදිංචි ගාස්තු.
- රක්ෂණ සමාගම්වලින් අය කරනු ලබන වාර්ෂික ගාස්තු.
- රක්ෂණ තැරැව්කාර සමාගම් සහ අලාභ ගැළපුම්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු.
- අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන පොලී ආදායම.

2021 සිට 2025 දක්වා කාලසීමාව තුළ ලැබුණු සමස්ත ආදායම 4 වැනි ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.

**4 ප්‍රස්තාරය**

**2021 - 2025 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ ආදායම**




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු | 258 | 291 | 319 | 342 | 634 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු | 15 | 17 | 18 | 35 | 40 |
| වෙනත් ආදායම් | 13 | 59 | 82 | 51 | 57 |
| ප්‍රදාන හඳුනාගැනීම් | - | - | 5 | - | - |
| මුළු ආදායම | 286 | 367 | 424 | 428 | 731 |

## කොමිෂන් සභාවේ වියදම්

2021 සිට 2025 දක්වා කාලසීමාව තුළ කොමිෂන් සභාවේ සමස්ත වියදම් පහත 5 වැනි ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ.

**5 ප්‍රස්තාරය**

**2021 - 2025 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ මුළු වියදම**




| | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| මුළු වියදම | 200 | 212 | 229 | 328 | 460 |

## තොරතුරු තාක්ෂණය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය ප්‍රවාහයට සිදුවන බාධා අවම කරමින්, සෑම කණ්ඩායම් සාමාජිකයෙකුටම තාක්ෂණික සහාය ඵලදායී ලෙස ලැබෙන බව මෙම අංශය මගින් සහතික කරයි. දත්තවල නිරවද්‍යතාව සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දෛනික නඩත්තු කටයුතු සිදු කරනු ලබයි. ජාල පද්ධති තුළ පවතින දුර්වලතා නිරන්තරයෙන් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම මගින් කොමිෂන් සභාව සක්‍රීයව ක්‍රියා කරමින් ප්‍රධාන බාධාවන් ඇතිවීමේ අවදානම අවම කරයි. සියළුම දෘඩාංග සහ මෘදුකාංග පද්ධති යාවත්කාලීනව සහ කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අඛණ්ඩ උත්සාහයක නිරත වේ.

පාලනය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා වසර තුළ තොරතුරු ආරක්ෂණ කමිටුවක් සහ තොරතුරු තාක්ෂණ අනු කමිටුවක් පිහිටුවන ලදී. ආයතනයේ සයිබර් ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය සමග සාකච්ඡා ආරම්භ කරන ලදී. කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නියාමන තොරතුරු තාක්ෂණ පද්ධතිය ප්‍රති-ඉංජිනේරුකරණය සඳහා ද පියවර ගන්නා ලදී. මීට අමතරව, පාලනය, ආරක්ෂාව සහ මෙහෙයුම් ප්‍රමිතීන් තහවුරු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති එකොළහක් කෙටුම්පත් කරන ලදී.

කාර්ය මණ්ඩලය අවශ්‍ය තොරතුරු තාක්ෂණ සම්පත්වලින් සන්නද්ධ කිරීම සඳහා, යල් පැන ගිය ලැප්ටොප් පරිගණක කිහිපයක් වෙනුවට නව උපාංග ලබා දෙන ලදී. දැන් කාර්ය මණ්ඩලයට OneDrive හරහා ඕනෑම ස්ථානයක සිට ලිපිගොනු පරිශීලනය කිරීමට සහ සහයෝගීව කටයුතු කිරීමට හැකි වී ඇති අතර එමගින් නම්‍යශීලී වැඩ පරිසරයක් නිර්මාණය වී ඇත.

මෙම නව ක්‍රියාවලීන්ට අමතරව වෙබ් අඩවිය නඩත්තු කිරීම, මෘදුකාංග බලපත්‍ර සහ දෘඩාංග නඩත්තු ගිවිසුම් අලුත් කිරීම මෙන්ම සර්වර්, රවුටර, ඇක්සස් ලක්ෂ්‍ය (Access points), ෆයර්වෝල්, ඇක්ටිව් ඩිරෙක්ටරි සහ පරිශීලක ගිණුම් පවත්වාගෙන යාම ඇතුළු එදිනෙදා මෙහෙයුම් කටයුතු, තොරතුරු තාක්ෂණ ඒකකය මගින් අඛණ්ඩව සිදු කරයි. තවද, දෛනික මෙහෙයුම් සුමටව සහ ආරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික සහාය ලබා දීම, ආරක්ෂණ පරීක්ෂණ පැවැත්වීම, ජාල ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සහ ආයතනික උපාංග කළමනාකරණය කිරීම ද මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි.

# පරිපාලන සමාලෝචනය

පරිපාලන අංශය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මානව සම්පත් කළමනාකරණය, ප්‍රසම්පාදන සහ කාර්යාල පරිපාලනය සඳහා වගකිව යුතු වේ. මෙම අංශය එක් එක් ක්ෂේත්‍රය යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කරයි:

## මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත් සැලසුම්කරණය, බඳවා ගැනීම් සහ තෝරා ගැනීම්, කාර්යසාධන කළමනාකරණය, පුහුණුව සහ සංවර්ධනය, සෞඛ්‍ය සහ ආරක්ෂාව, සේවක සුබසාධනය, වෘත්තීය සැලසුම්කරණය, පැමිණීම සහ නිවාඩු වාර්තා පවත්වාගෙන යාම ඇතුළු සේවක කළමනාකරණය, පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, රැකියාවෙන් ඉවත් වීමේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ ඉල්ලා අස්වීම් හා විශ්‍රාම ගැනීම් සම්බන්ධ කටයුතු සිදු කිරීම යන සියළුම මානව සම්පත් කටයුතු පිළිබඳ සොයා බැලීම.

## කාර්ය මණ්ඩල කළමනාකරණය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාර්ථකත්වයට මානව සම්පත් අත්‍යවශ්‍ය වේ. ඔවුන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි ඵලදායිතාවයට දායක වීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මානව සම්පත් වැදගත් වන්නේ දැනුම, කුසලතා සහ තාක්ෂණය යෙදවීම තුළින් වැඩි සම්පත් නිර්මාණය කිරීමට ඔවුන්ගේ බුද්ධිමය ස්වභාවය උපරිම ලෙස භාවිතා කළ හැකි බැවිනි. එමෙන්ම ඔවුන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතු විශාලතම වත්කම ද වේ.

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පහත සඳහන් බඳවා ගැනීම් සිදු කර ඇත:

| තනතුර | සේවක සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ - වෙළඳපල අතරමැදි බලපත්‍ර සහ අධීක්ෂණ | 1 |
| අධ්‍යක්ෂ - පරිපාලන | 1 |
| සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ | 1 |
| සහකාර අධ්‍යක්ෂ - වෙළඳපල අතරමැදි බලපත්‍ර සහ අධීක්ෂණ | 1 |
| සහකාර අධ්‍යක්ෂ - විමර්ශන | 1 |
| සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය | 1 |
| විධායක | 7 |
| පරිපාලන සහායක | 1 |
| **එකතුව** | **14** |

සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ (අධීක්ෂණ), සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ) සහ විධායක නිලධාරියෙකු ඇතුළු කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු සේවයෙන් ඉල්ලා අස් වූ අතර 2025 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාවේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය 63ක් විය.

### සේවක වර්ගීකරණය අනුව සේවක සංඛ්‍යා තොරතුරු




### සේවා තොරතුරු




### සේවක වයස් විශ්ලේෂණය



## ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංයුතිය




## සේවා නියුක්ති පදනම




## කාර්ය මණ්ඩල පුහුණුව

පුහුණුව සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම මගින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම සහ රැකියාවට අදාළ කුසලතා ලබා ගැනීමට කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම අරමුණු කරගත් පුළුල් ප්‍රතිපත්තියක් ආවරණය කරයි. අදාළ ක්ෂේත්‍රවල දැනුම වැඩිදියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩලයට දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

2025 වසරේදී විදේශීය පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය පහත පරිදි වේ:

| # | වැඩසටහනේ නම | ආයතනය | දිනය / කාල සීමාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ආර්ථික සහයෝගිතාව සඳහා සංවර්ධනය පිළිබඳ සංවිධානය සහ ආසියානු සංවර්ධන බැංකු ආයතනයේ (OECD – ADBI) ආසියාවේ රක්ෂණ සහ විශ්‍රාම වැටුප් ඉතිරිකිරීම් පිළිබඳ වටමේස සමුළුව 2025 | මැලේසියාවේ ක්වාලාලම්පූර් | 2025 ජූලි 9 සහ 10 | 1 |
| 2 | ඉන්දියාවේ රක්ෂණ නියාමන හා සංවර්ධන අධිකාරිය (IRDAI) සහ ඉන්දියාවේ රක්ෂණ ආයතනය (iii) වෙත නිල සංචාරය | ඉන්දියාවේ හයිද්‍රාබාද් සහ මුම්බායි | 2025 අගෝස්තු 25-28 | 4 |
| 3 | ලොව වටා ජීවිත සහ රක්ෂණය දියුණු කිරීමේ පදනම (FALIA) මගින් මෙහෙයවන ලද සෞඛ්‍යාරක්ෂණ වෙළඳපොලේ පවතින වර්තමාන අභියෝග සහ රාජ්‍ය හා පුද්ගලික ජීවිත රක්ෂණයේ කාර්යභාරය පිළිබඳ සම්මන්ත්‍රණය | ජපානයේ ටෝකියෝ | 2025 සැප්තැම්බර් 03-12 | 1 |
| 4 | "සංවාදයේ සිට ක්‍රියාවට - අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව සඳහා සහයෝගීතාව" යන තේමාව යටතේ පැවැති ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්ව සමුළුව 2025 (GAIP සමුළුව 2025) | සිංගප්පූරුව | 2025 සැප්තැම්බර් 15-16 | 2 |
| 5 | ජපන් ජීවිත රක්ෂණ කර්මාන්තයේ ඉතිහාසයෙන් උගත් පාඩම් පිළිබඳ සම්මන්ත්‍රණය | ජපානයේ ටෝකියෝ | 2025 නොවැම්බර් 05-12 | 1 |
| 6 | ජීවිත රක්ෂණය පිළිබඳ තාක්ෂණික විශිෂ්ටත්වය - ජාත්‍යන්තර | ඉන්දියාව | 2025 දෙසැම්බර් 08-13 | 5 |
| 7 | රක්ෂණ අධීක්ෂණය පිළිබඳ 08 වැනි AFIR-FSI-IAIS ආසියා පැසිෆික් උසස් මට්ටමේ රැස්වීම සහ AFIR 20 වැනි වාර්ෂික සමුළුව සහ සම්මන්ත්‍රණය | ඉන්දියාවේ හයිද්‍රාබාද් | 2025 දෙසැම්බර් 09-11 | 2 |

රක්ෂණයට අදාළ ජාත්‍යන්තර සංවිධාන විසින් පවත්වන ලද අතථ්‍ය (Virtual) පුහුණු වැඩසටහන් හරහා කාර්ය මණ්ඩලය දැනුම හුවමාරු කරගත් ආකාරය පහත දැක්වේ:

| වැඩසටහනේ නම | ආයතනය | දිනය / කාල සීමාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ජාතික රක්ෂණ කොමසාරිස්වරුන්ගේ සංගමය මගින් පවත්වන ලද අතථ්‍ය ජාත්‍යන්තර සහයෝගිතා වැඩසටහන 2025 | ජාතික රක්ෂණ කොමසාරිස්වරුන්ගේ සංගමය | 2025 අප්‍රේල් 28 සිට මැයි 12 දක්වා | 5 |
| මූල්‍ය සේවා සහ රක්ෂණය සහ ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය මගින් (FSI - IAIS) පවත්වන ලද නියාමන සහ අධීක්ෂණ පුහුණුව | ජාත්‍යන්තර ජනාවාස බැංකුවෙහි (BIS) මූල්‍ය ස්ථායීතා ආයතනය (FSI) සහ ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ (IAIS) සංගමය | දින 6 | 16 |
| "භෝග රක්ෂණය: පරාමිතික නිෂ්පාදන පිළිබඳ අවධානය" යන තේමාව යටතේ පවත්වන ලද අතථ්‍ය පුහුණු වැඩසටහන | ඉන්දියානු රක්ෂණ ආයතනය (iii) සහ රක්ෂණ විද්‍යාලය (COI) | දින 1/2 | 9 |

2025 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සහභාගී වූ දේශීය පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| වැඩසටහනේ නම | ආයතනය | දිනය / කාල සීමාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ජාතික රක්ෂණ කොමසාරිස්වරුන්ගේ සංගමය මගින් පවත්වන ලද අතථ්‍ය ජාත්‍යන්තර සහයෝගිතා වැඩසටහන 2025 | දකුණු ආසියානු තාක්ෂණික ආයතනය (SAT) | දින 1 | 2 |
| Zoholics ශ්‍රී ලංකා 2025 (ගිණුම්කරණ පැකේජය) වැඩමුළුව | Zoholics APAC | දින 1 | 1 |
| අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන - "තිරසර රක්ෂණය සඳහා වන මූලධර්ම" | ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය | දින 1/2 | 2 |
| අපරාධවලින් ලැබෙන ඉපැයීම් පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන සම්මන්ත්‍රණය | Corporate Management Consultants | දින 1/2 | 4 |
| 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත පිළිබඳ ගැඹුරින් සාකච්ඡා කෙරෙන වැඩමුළුව | Ernst & Young | දින 1 | 5 |
| එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1267, 1988 සහ 1373 දරන යෝජනා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් ත්‍රස්තවාදයට මූල්‍ය අනුග්‍රහය දැක්වීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාව ශක්තිමත් කිරීම | මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව | දින 3 | 2 |

| | | | |
|---|---|---|---|
| කාර්යාල සහායකයින්ගේ සහ රියදුරන්ගේ ආකල්ප සහ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම (සිංහල මාධ්‍යය) | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 1 | 1 |
| වෘත්තීය පාරිභෝගික සන්නිවේදන කලාව | සීඑස්එම් බිස්නස් සොලූෂන්ස් (පුද්) සමාගම | දින 1 | 2 |
| අධ්‍යක්ෂකවරුන්ගේ හා නිලධාරීන්ගේ වගකීම් රක්ෂණය සහ සයිබර් රක්ෂණය පිළිබඳ ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA) | දින 1/2 | 5 |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා අවදානම් පාදක අභ්‍යන්තර විගණනය සහ තොරතුරු තාක්ෂණ විගණනය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | දින 2 | 7 |
| මූල්‍ය අංශයේ නියාමකයින් සඳහා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මූල්‍ය අනුග්‍රහය දැක්වීම වැළැක්වීම පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා මහ බැංකුව | දින 1 | 5 |
| 2024 නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | දින 1 | 1 |
| දත්ත ආරක්ෂණ පනත සහ 2025 සංශෝධන පනත් කෙටුම්පත | සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංගමය | දින 1/2 | 1 |
| කාර්යාලීය ඵලදායිතාව සඳහා යෙදුම් සහ කෘත්‍රිම බුද්ධි මෙවලම් | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 1 | 5 |
| ව්‍යසන ආකෘතිකරණය පිළිබඳ පුහුණුව | ජේ බී බෝඩා ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්. | දින 1/2 | 7 |
| ත්‍රස්තවාදයට මූල්‍ය අනුග්‍රහය දැක්වීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාව ශක්තිමත් කිරීම | මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව | දින 3 | 3 |
| අගය එකතු කළ බදු (VAT) පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | School of Taxation ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | (පැය 3 x සැසි 10) | 1 |
| උසස් මට්ටමේ MS Excel වැඩමුළුව | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 2 | 4 |
| විද්‍යුත් තැපැල් සන්නිවේදන වැඩමුළුව | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 1/2 | 1 |
| මූල්‍ය ආයතන නියාමනය කිරීම තුළ අවදානම් පාදක ප්‍රවේශය | මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව | දින 1/2 | 1 |
| දත්ත ආරක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය | දින 1/2 | 4 |
| වෙනස්කම්වලට අනුවර්තනය වීම - රක්ෂණ ක්ෂේත්‍රය පරිවර්තනය කරන වෛද්‍ය ක්ෂේත්‍රයේ නව සොයාගැනීම් | ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය | දින 1/2 | 1 |
| සයිබර් ආරක්ෂණ වැඩමුළුව | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 2 | 2 |
| රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනය | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | දින 2 | 2 |
| මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වීම වැළැක්වීම පිළිබඳ අධීක්ෂණය සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන | ශ්‍රී ලංකා මහ බැංකුව | දින 5 | 4 |
| MS Excel සහ Power BI භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කිරීම | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 2 | 1 |
| 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනත පිළිබඳ සම්මන්ත්‍රණය | Corporate Management Consultants | දින 1/2 | 5 |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා අවදානම් පාදක අභ්‍යන්තර විගණනය සහ තොරතුරු තාක්ෂණ විගණනය පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | දින 2 | 1 |
| නාම යෝජනා, ව්‍යාපෘති යෝජනා සහ අත්දැකීම් සටහන් ඉදිරිපත් කිරීම - NQI–RIA වැඩමුළුව | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | දින 2 | 3 |
| ඩිජිටල් ගොනු කළමනාකරණය සහිත කාර්යාල පද්ධති පිළිබඳ වැඩමුළුව | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 2 | 2 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් 5S සහ 3R සංකල්ප තුළින් ඵලදායිතාව වැඩිදියුණු කිරීම | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | දින 1 | 1 |
| නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 1 | 5 |
| MS Office අත්‍යවශ්‍ය කරුණු | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය | දින 2 | 1 |
| ලංසු ඇගයීම | ප්‍රාග් ආයතනය | දින 1 | 2 |
| මූල්‍ය ප්‍රකාශන | ප්‍රාග් ආයතනය | දින 1 | 1 |
| නූතන ලේකම්වරයෙකු සඳහා වන මෙවලම් කට්ටලය පිළිබඳ වැඩසටහන (මාර්ගගත) | RH පුහුණු හා සංවර්ධන (පුද්ගලික) සමාගම | (දින 1/2 x දින 6) | 2 |

කාර්ය මණ්ඩලයට ජාතික සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමට පහසුකම් සලසා දී ඇති අතර සහභාගීත්වයේ විස්තර පහත පරිදි වේ:

| වැඩසටහනේ නම | ආයතනය | දිනය /කාල සීමාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| CIPM ජාතික මානව සම්පත් සමුළුව 2025 - සමෘද්ධිමත් ජාතියක් උදෙසා ජනතාව සවිබල ගැන්වීම | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය | දින 2 | 1 |
| හතරවන දකුණු ආසියානු ආයුගණක සමුළුව (SAAC 2025) | ශ්‍රී ලංකා ආයුගණක සංගමය | දින 3 | 4 |
| CPFA සහ APFA වාර්ෂික සමුළුව 2025 - "ආර්ථික පුනර්ජීවනය සඳහා රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ" | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | දින 1/2 | 2 |
| CA ශ්‍රී ලංකා සමුළුව - 2025 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | දින 3 | 3 |
| 43 වැනි ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව 2025 | ශ්‍රී ලංකා පරිගණක සංගමය | දින 2 | 3 |

දෛනික බාධාවන්ගෙන් මිදී දැනුම රඳවා තබා ගැනීම, ජාලගත වීම සහ කුසලතා වර්ධනය ඉහළ නැංවීම සඳහා මෙම කාලසීමාව තුළ සියළුම කාර්ය මණ්ඩලය සඳහා නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. සහභාගිවන්නන්ගේ නියැලීම වැඩිදියුණු කරන සහ ගැඹුරු සබඳතා වර්ධනය කරන දැඩි අවධානය යොමු කළ සහ සහයෝගීතාවයෙන් යුතු පරිසරයකින් ඔප්පු ප්‍රතිලාභ ලැබූහ. වෘත්තීය සංවර්ධනය වේගවත් කිරීම, කණ්ඩායම් ගතිකත්වය වැඩිදියුණු කිරීම සහ න්‍යාය සහ භාවිතය අතර පරතරය සමනය කිරීම මෙම නේවාසික පුහුණු වැඩසටහනෙන් ලබාගත් ප්‍රතිලාභ කිහිපයකි.

## අනුග්‍රාහකත්ව සහ ග්‍රාහකත්වයන් අලුත් කිරීම

රක්ෂණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය විසින් පවත්වනු ලබන රක්ෂණ ඩිප්ලෝමාව හැදෑරීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී. මීට අමතරව, සේවකයාට මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙතද ලැබෙන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන ශ්‍රී

ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය, වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය, වරලත් අලෙවිකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය යනාදී ආයතනවල කාර්ය මණ්ඩලය දරන වෘත්තීය සාමාජිකත්වයට අදාළ ග්‍රාහකත්ව මුදල් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කරන ලදී.

## සීමාවාසික පුහුණු

රක්ෂණ කර්මාන්තයේ නියාමකයාගේ කාර්යයන් පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ට සීමාවාසික පුහුණු අවස්ථා ලබා දීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. අදාළ විශේෂඥතාවය සහිත ක්ෂේත්‍ර පිළිබඳ සිය දැනුම වැඩිදියුණු කිරීම සඳහා සීමාවාසිකයින් දොළොස් දෙනෙකුට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තුළ සීමාවාසික පුහුණුව ලබා දෙන ලදී.

## කාර්ය මණ්ඩල සුබසාධනය

සේවකයින්ගේ යහපැවැත්ම පිළිබඳ සැලකිලිමත් වීම ඔවුන්ව දිරිමත් කිරීමට සහ ඔවුන්ගේ මනෝභාවය ඉහළ නැංවීමට වැදගත් සාධකයක් වී ඇත. වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය සහ රක්ෂණ ක්‍රම, ආපදා ණය සහ වාහන ණය සඳහා සහනදායී ණය ක්‍රම සහ භාවිත නොකළ නිවාඩු ශේෂයන් සඳහා මුදල් ගෙවීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලයට ලබා දෙන ප්‍රතිලාභ කිහිපයකි.

## ප්‍රසම්පාදන

පරිපාලන අංශය, ආයතනික අවශ්‍යතාවන්ට අනුකූලව කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සහතික කරන අතර අභ්‍යන්තර ඉල්ලීම් කරන්නන් සහ බාහිර සැපයුම්කරුවන් අතර මූලික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස කටයුතු කරයි. විවිධ අංශවලින් ලැබෙන ප්‍රසම්පාදන ඉල්ලීම් ඒකාබද්ධ කිරීම, මිලදී ගැනීමේ ක්‍රියාවලිය ආරම්භයේ සිට අවසානය දක්වා කළමනාකරණය කිරීම සහ ආයතනික මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය භාණ්ඩ සහ සේවාවන් උපරිම වටිනාකමකින් ලබා ගැනීම මෙම අංශය මගින් සිදු කරයි.

සැලසුම් කළ ප්‍රසම්පාදන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු, දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටු සහ ලංසු ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ වගකීම මෙම අංශය සතු විය. තවද, 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ප්‍රසම්පාදන අත්පොතෙහි විධිවිධානවලට අනුකූලව මිල ගණන් කැඳවීම්, යෝජනා කැඳවීම්, මිලදී ගැනීමේ ඇණවුම් සහ භාණ්ඩ ලැබුණු බවට වූ සටහන් සකස් කිරීම සිදු කෙරිණි. තවද, නීති අංශය සමග සහයෝගයෙන් සේවා ගිවිසුම් සකස් කිරීම සිදු කරන ලද අතර අදාළ සේවා සපයන්නන් වෙත පිරිනමන ලද කාර්යයන් අධීක්ෂණය කිරීම මෙම අංශය විසින් සිදු කරන ලදී.

වසර තුළ ප්‍රසම්පාදන කාර්යයන් විසිපහක් සම්පූර්ණ කර ඇති අතර තවත් කාර්යයන් දෙකක් පසුගිය වසරේ සිට ඉදිරි වසරට ගෙන එන ලදී.

## වාර්ෂික වාර්තාව

වාර්ෂික වාර්තාව සකස් කිරීම සම්බන්ධීකරණය කිරීම පරිපාලන අංශයේ මූලික වගකීමකි. ඒ අනුව, 2024 වාර්ෂික වාර්තාව සඳහා අංශ මට්ටමින් සමාලෝචන එක්රැස් කිරීම සහ එහි පරිවර්තන ලබා ගැනීම මෙම අංශය විසින් සිදු කරන ලදී. තවද, විගණකාධිපති වාර්තාව ලැබී මාස තුනක් ඇතුළත මුද්‍රිත වාර්ෂික වාර්තාව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සහ අදාළ අනෙකුත් ලේඛන ද සමගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

## අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමග ලිපි හුවමාරුව

මෙම වසර තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි පරිපාලන අංශයට අදාළ ආයතනික කටයුතු සම්බන්ධයෙන් මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (අදාළ විෂය භාර අමාත්‍යාංශය), රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන සමග නිළ ලිපි හුවමාරු කිරීම් සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

## වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

2024 වසර සඳහා වන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2025 ජනවාරි මාසයේදී සිදු කරන ලදී. මෙම සමීක්ෂණය සිදු කිරීම සඳහා සාමාජිකයින් හය දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත් කරන ලදී. බැහැර කළ යුතු දේපළ සහ භාණ්ඩ හඳුනා ගන්නා ලදී.

2022, 2023 සහ 2024 වර්ෂ සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මත පදනම්ව හඳුනාගත් භාණ්ඩ බැහැර කිරීමට පියවර ගන්නා ලදී. කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි බැහැර කළ යුතු දේපළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පරිත්‍යාග කරන ලදී.

## කාර්ය සම්පාදන සහාය

පරිපාලන අංශය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි දෛනික මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව සිදු වන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල නිරත වේ. කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම, තොග කළමනාකරණය, භෞතිකව හසුරුවන ලේඛන සංරක්ෂණය කිරීම, කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණ කටයුතු, ප්‍රවාහන කටයුතු සංවිධානය කිරීම, නවාතැන් පහසුකම් සැපයීම සහ රැස්වීම් හා වැඩමුළු සඳහා අවශ්‍ය ස්ථානීය පහසුකම් සැපයීම යනාදිය මෙම අංශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් කිහිපයකි. තවද, ආයතනය සතු වාහන නඩත්තු කිරීම, කාලසටහන්ගත කිරීම සහ ලේඛනගත කිරීමේ කටයුතුවලට සහාය වීම ද මෙම අංශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් වේ.

# සංයුක්ත පාලනය පිළිබඳ වාර්තාව

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව පිහිටුවා ඇති ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ එහි වර්ධනය සඳහා පහසුකම් සැලසීම පැවරී ඇති ව්‍යවස්ථාපිත අධිකාරිය වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිය ව්‍යවස්ථාපිත කාර්යභාරය තුළ රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කටයුතු අවංකභාවයෙන්, වෘත්තීයමය මෙන්ම සුපරීක්ෂාකාරී අයුරින් සිදු කෙරෙන බව සහතික කරනු ලබයි.

## කොමිෂන් සභාවේ සංයුතිය සහ උපායමාර්ගික දිශානතිය

නිල බලයෙන් පත්වන සාමාජිකයින් තිදෙනෙකු සහ පත් කරන ලද සාමාජිකයින් සිව්දෙනෙකු විසින් කොමිෂන් සභාව මෙහෙයවනු ලබයි. මෙම සාමාජිකයින් නීතිය, රක්ෂණය, ගිණුම්කරණය සහ මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණ උපදේශනය, අලෙවිකරණය, තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් වැනි විෂය ක්ෂේත්‍රයන්හි වෘත්තීය සුදුසුකම් සහ විශේෂඥ දැනුම කොමිෂන් සභාවේ ප්‍රගතිය උදෙසා උපයෝගී කරගනු ලබයි. මෙම පුළුල් විශේෂඥ දැනුම මගින් ප්‍රතිපත්ති සම්පාදනය සහ නියාමන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පරිපූර්ණ දෘෂ්ටිකෝණයක් සහතික කෙරේ. මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති සහ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් යන මහත්වරුන් නිල බලයෙන් පත්වන සාමාජිකයින් තිදෙනා ලෙස විශේෂිත වූ ආයතනික දෘෂ්ඨිකෝණයකින් කටයුතු කරන අතර කොමිෂන් සභාවේ පාලන ව්‍යුහයේ ගුණාත්මකභාවය තවදුරටත් ශක්තිමත් කරයි.

## පාලන ව්‍යුහය සහ උපායමාර්ගික අධීක්ෂණය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, කොමිෂන් සභාව, එහි අනුකාරක සභා සහ ලේකම් කාර්යාලය සතු කාර්යභාරයන් මැනවින් නිර්වචනය කෙරෙන මනා පාලන ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වේ. කොමිෂන් සභාව විසින් උපායමාර්ගික දිශානතිය සැපයීම, ප්‍රතිපත්තිමය ව්‍යුහයන් අනුමත කිරීම සහ නිශ්චිත, මැනිය හැකි, ළඟා කරගත හැකි, අදාළ සහ කාලානුරූපී ලෙස පැහැදිලිව හඳුනාගෙන ඇති ප්‍රධාන කාර්යසාධන දර්ශක ළඟා කර ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. මෙම ප්‍රධාන කාර්යසාධන දර්ශක අනුමත කරන ලද බහු-වාර්ෂික උපායමාර්ගික සැලැස්මක කොටසක් ලෙස සකස් කර ඇති අතර එමගින් ආයතනික දැක්මෙහි අඛණ්ඩතාව සහ මැනිය හැකි ප්‍රතිඵල සහතික කෙරේ.

## අභ්‍යන්තර පාලන සහ විගණන යාන්ත්‍රණ

කොමිෂන් සභාවේ විගණන අනු කමිටුව, සභාපතිවරයා ලෙස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා කටයුතු කරන අතර, අදාල ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවන් ඇති තවත් කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම, අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම, අවදානම් කළමනාකරණ භාවිතයන් නිරීක්ෂණය කිරීම සහ පාලන ක්‍රියාවලීන්හි වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීම සඳහා මෙම අනුකමිටුව වගකීම දරයි. මෙම අනුකමිටුව මඟින් පූර්ණ කොමිෂන් සභාව වෙත නිතිපතා වාර්තා ඉදිරිපත් කිරීම මගින් අධීක්‍ෂණ කටයුතු කාලෝචිත, දැනුවත් මෙන්ම ක්‍රියාත්මක කළ හැකි මට්ටමක පවතින බව සහතික කෙරේ.

## විධායක නායකත්වය සහ මෙහෙයුම් කළමනාකරණය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොමිෂන් සභාවේ පොදු මග පෙන්වීම සහ පාලනය යටතේ එහි සියළුම කටයුතු මෙහෙයවීම සහ ව්‍යාපාරික ගනුදෙනු සිදු කිරීම සඳහා වගකීම දරයි. මෙහෙයුම් තීරණ, ආයතනයේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ පාලන මූලධර්ම සමග සමපාත වන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා වගබලා ගනු ලැබේ.

# විගණන කමිටුව

2025 වර්ෂය සඳහා වන විගණන කමිටුව, සභාපතිවරයා ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගෙන් සහ කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය. සමාලෝචිත වසර තුළ කමිටුවට පැවරී ඇති බලතලවලට සහ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ප්‍රඥප්තියට අනුකූලව රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. විගණන කමිටුව සිය වගකීම් ඉටු කිරීමේදී, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශවලට අනුව සකස් කරන ලද ප්‍රඥප්තියට එකඟව, ස්වාධීන සහ අපක්ෂපාතී අයුරින් එම කටයුතු සිදු කරන බවට සහතික විය.

විගණන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

| නම | කමිටුව තුළ දරන තනතුර | සේවා කාලය | කොමිෂන් සභාව තුළ දරන තනතුර |
|---|---|---|---|
| එච්.සී.ඩී.එල්. සිල්වා මහතා | සභාපති | 2025.01.01 - 2025.10.10 | නිල බලයෙන් පත් වූ සාමාජික |
| ඩී.එන්. හපුගල මහතා | සභාපති | 2025.10.28 - 2025.12.31 | නිල බලයෙන් පත් වූ සාමාජික |
| ආර්.සී. කොට්ටේගේවා මහතා | සාමාජික | 2025.02.27 - 2025.12.31 | සාමාජික |
| පී.ඩී.එස්. ජයරත්න මහතා | සාමාජික | 2025.02.27 - 2025.12.31 | සාමාජික |

විගණන කමිටු සාමාජිකයින් මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර යන ක්ෂේත්‍රයන් පිළිබඳ ඒකාබද්ධ කුසලතා සහ විශේෂඥ දැනුමකින් සමන්විත වේ. සමාලෝචිත කාලසීමාව තුළ විගණන කමිටුව සමස්තයක් ලෙස රැස්වීම් හතරක් පැවැත්වූ අතර එහිදී සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණුවල සාරාංශයක් විගණන කමිටු ප්‍රඥප්තිය යටතේ හඳුනාගෙන ඇති මාතෘකා යටතේ ලැයිස්තුගත කර ඇත.

### 1. මූල්‍ය වාර්තාකරණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද කොමිෂන් සභාවේ කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් විගණන කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය, මූල්‍ය ප්‍රකාශනවලට බලපෑ සැලකිය යුතු ගැලපීම්, ගිණුම්කරණ ක්‍රමවේද වල ප්‍රමාණවත්භාවය සහ සුදුසු බව, අභ්‍යන්තර පාලනයන් ඇගයීම මෙන්ම අදාළ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව තොරතුරු හෙළිදරව් කිරීමේ නිරවද්‍යතාවය සහ ප්‍රමාණවත්භාවය කෙරෙහි අවධානය යොමු කර ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දුන් අතර එමගින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම්වල නිරවද්‍යතාව ඉහළ නැංවීය. තවද, 2026 වර්ෂය සඳහා වන අයවැය කෙටුම්පත ද සමාලෝචනයට ලක් කෙරුණු අතර එය කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට පෙර ඒ පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

### 2. අභ්‍යන්තර විගණන වාර්තාව

2025 අභ්‍යන්තර විගණන වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර එහි පෙන්වා දී ඇති මෙතෙක් නිමවා නොමැති කාර්යයන් සහ අධි-අවදානම් සහිත ක්ෂේත්‍ර සඳහා කාලසීමාවන් නියම කිරීමට නිර්දේශ කරන ලදී. තවද, එකී වාර්තාව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට පෙර අවශ්‍ය පරිදි තවදුරටත් උපදෙස් ලබා දෙන ලදී.

### 3. අවදානම් කළමනාකරණය

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන මෙහෙයුම් අත්පොත යටතේ සකස් කරන ලද පරිපාලන අත්පොත මෙන්ම රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල සහ කොමිෂන් සභා අරමුදල ආයෝජනය කිරීම පිළිබඳ කාර්යපටිපාටික අත්පොත වෙත යෝජනා කර ඇති සංශෝධන, කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කිරීමට පෙර විගණන කාරක සභාව විසින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. තවද, ප්‍රසම්පාදන සැලැස්ම සහ 2026 වර්ෂය සඳහා වන උපායමාර්ගික සැලැස්මද අනුමැතිය සඳහා නිර්දේශ කිරීමට පෙර එලෙසම සවිස්තරාත්මකව සාකච්ඡාවට බඳුන් කරන ලදී.

### 4. බාහිර විගණකවරුන් සමඟ ඇති සබඳතාවය

විගණකාධිපතිවරයාගේ කළමනාකරණ විගණන වාර්තාව දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් කරන ලද අතර එහි පෙන්වා දී ඇති ගැටළුසහගත කරුණු නිවැරදි කිරීම සඳහා සුදුසු උපදෙස් ලබා දෙන ලදී.

### 5. අනුකූලතාව

මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවත් අදාළ පාර්ශ්වයන් අතර සිදු වූ ගනුදෙනු සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි යටතේ ස්වාධීන පදනමකින් සිදු වී ඇති බවත් අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණන පද්ධතීන් ප්‍රමාණවත් මෙන්ම ඵලදායී මට්ටමක පවතින බවත් මෙහෙයුම් කටයුතුවලට අදාළ නීති සහ රීති සම්පූර්ණයෙන්ම අනුගමනය කර ඇති බවත් විගණන කාරක සභාවේ අදහස විය.



ඩී. එන්. හපුගල මහතා
විගණන කමිටුවේ සභාපති
2026 ජූනි 18

# විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | INF/B/IRCSL/6/25/28 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 25 June 2026 |

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා සටහන් යනාදියෙන් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන අනුව විගණනය කරන ලදී. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යථා කාලයේ දී මාගේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන 2025 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මූල්‍ය ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා වන පදනම

මම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුව මාගේ විගණනය සිදු කළෙමි. එම ප්‍රමිතීන් යටතේ වන මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

### 1.3 කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට කොමිෂන් සභාවේ 2025 වාර්ෂික වාර්තාවේ අඩංගු තොරතුරු ඇතුළත් වන නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මාගේ විගණන වාර්තාව ඇතුළත් නොවන අතර මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව එය මා වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේ දී ලබා ගත් මාගේ දැනුමට ප්‍රමාණාත්මකව නොගැළපේ ද යන්න හෝ ප්‍රමාණාත්මකව සාවද්‍ය ලෙස ප්‍රකාශ කර ඇත්ද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2025 වාර්ෂික වාර්තාව කියවීමේදී එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති බව මා නිගමනය කළහොත් එම කරුණ නිවැරදි කිරීම සඳහා පාලනය තුළ වගකිවයුත්තන් වෙත සන්නිවේදනය කළ යුතු වේ. තවදුරටත් නිවැරදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශනයන් පවතී නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව නියමිත වේලාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන මාගේ වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනයට සම්බන්ධ පුද්ගලයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිඹිබු කරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය යැයි කළමනාකාරීත්වය තීරණය කරන අභ්‍යන්තර පාලනය සඳහා කළමනාකාරීත්වය වගකිව යුතු වේ.

කොමිෂන් සභාව ඈවර කිරීමට හෝ එහි ක්‍රියාකාරීත්වය නැවැත්වීමට කළමනාකාරීත්වය අපේක්ෂා කළහොත් හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති නම් මිස මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට කොමිෂන් සභාව සතු හැකියාව ඇගයීම, අඛණ්ඩ පැවැත්මට සම්බන්ධ කරුණු අදාළ පරිදි අනාවරණය කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම යන පදනම භාවිතා කිරීම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකිව යුතුය.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම පාලනය සම්බන්ධයෙන් වගකීම දරණ පුද්ගලයන් සතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික හා කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි, කොමිෂන් සභාව සිය සියලු ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්

සමස්ථයක් ලෙස වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයෙන් තොර ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සහ මගේ මතය ඇතුළත් විගණන වාර්තාවක් නිකුත් කිරීම මගේ අරමුණයි. සාධාරණ තහවුරුවක් යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන විගණනයක දී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් පවතින විට එය සැමවිටම අනාවරණය වන බවට සහතිකයක් නොවේ. සාවද්‍ය ප්‍රකාශයන් වංචාවකින් හෝ දෝෂයකින් මතු විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයන්ගේ ආර්ථික තීරණවලට තනි තනිව හෝ සමස්තයක් වශයෙන් ඒවා බලපානු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම් ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයක කොටසක් ලෙස මම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාවටම වෘත්තීය සංශයවාදය පවත්වාගෙන යන්නෙමි. එසේ ම මම පහත දැක්වෙන අයුරින් කටයුතු කරමි.

- වංචා හෝ දෝෂ හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති වීමේ අවදානම හඳුනා ගැනීම සහ ඇගයීම, එම අවදානම්වලට විසඳුම් ලෙස විගණන ක්‍රියාපරිපාටීන් සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම සහ මාගේ මතය සඳහා පදනමක් ලෙස ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම. වංචා හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනය හඳුනා නොගැනීමේ අවදානම දෝෂ හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනය ඇති වීමේ අවදානමට වඩා වැඩිය. මන්ද යත්, වංචාවට ඊට හවුල් වීම, ව්‍යාජ ලේඛන සකස් කිරීම, හිතාමතා බැහැර කිරීම්, වැරදිසහගත නියෝජනය, හෝ අභ්‍යන්තර පාලනය ප්‍රතික්ෂේප කිරීම ඇතුළත් විය හැකි බැවිණි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොව, අවස්ථාවන්ට සුදුසු විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.

- භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකාරීත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම්වල සාධාරණ බව ඇගයීම.

- කළමනාකාරීත්වය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය සහ ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ තත්වයන්ට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පවතින්නේ ද යන්න පිළිබඳ නිගමනයකට එළඹීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ අනාවරණයන් හෝ එවැනි අනාවරණයන් ප්‍රමාණවත් නොවේ නම්, මාගේ මතය වෙනස් කිරීමට මාගේ විගණන වාර්තාව තුළ අවධානය යොමු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට බාධා එල්ල විය හැකිය.

- අනාවරණයන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන ආකාරයෙන් පවතින ගණුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න ඇගයීම.

මාගේ විගණනයේ දී මා හඳුනා ගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු අඩුපාඩුවක් ඇතුළුව, වෙනත් කාරණා අතර, සැලකිය යුතු විගණන සොයා ගැනීම් පිළිබඳ මම පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### 2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම අදාළ තොරතුරු සහ පැහැදිලි කිරීම් මම ලබාගෙන ඇති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන පරිදි, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ අවශ්‍යතා ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිසි ගිණුම් වාර්තා තබා ගෙන ඇත.

2.1.2 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පෙර වසරට අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව පෙර වර්ෂයේදී මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් කර ඇත.

### 2.2. ක්‍රියාවට නංවන ලද ක්‍රියා පරිපාටි මත පදනම් වූ බැවින් සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණුවලට පමණක් සීමා වූ බැවින් මාගේ අවධානයට කිසිවක් ලක් වී නැත;

2.2.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැර වන කොමිෂන් සභාව විසින් ඇති කර ගන්නා ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2. කොමිෂන් සභාව විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියට අනුව පහත කරුණු හැර කොමිෂන් සභාවේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධාන කිසිවක් අනුගමනය කර නොමැති බව ප්‍රකාශ කිරීම;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තිය අනුව කොමිෂන් සභාව පහත දෑ හැර කිසිවක් එහි බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට;

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, කොමිෂන් සභාවේ සම්පත් නියමිත කාලරාමුව තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව පිරිමැසුම්දායකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සපයාගෙන හෝ උපයෝගී කරගෙන නොමැති බව ප්‍රකාශ කිරීමට.

**එල්.එස්.අයි. ජයරත්න**
විගණකාධිපති

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය
# 2025 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2025.12.31 දිනට රු. | 2024.12.31 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 2 | **31,418,390** | 41,255,831 |
| අස්පෘශ්‍ය වත්කම් | 3 | **530,145** | 727,758 |
| තැන්පතු - රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 4 | **4,797,128,192** | 10,115,509,789 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 5 | **16,793,626** | 15,108,074 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **4,845,870,353** | 10,172,601,452 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 6 | **338,483** | 557,642 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ වෙනත් | 4 | **10,265,742,408** | 3,012,535,182 |
| වෙනත් ජංගම වත්කම් | 7 | **53,047,973** | 44,248,652 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය - ප්‍රතිමිලදී ගැනුම් | | **346,500,000** | 100,000,000 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | | **374,987,040** | 383,024,130 |
| විලම්බිත බදු වත්කම් | 20 | **12,408,563** | 11,427,451 |
| මුදල් හා මුදල් සමාන දෑ | 8 | **6,057,850** | 17,050,006 |
| **මුළු ජංගම වත්කම්** | | **11,059,082,316** | 3,568,843,063 |
| **මුළු වත්කම්** | | **15,904,952,669** | 13,741,444,515 |
| **සංචිත හා වගකීම්** | | | |
| **සංචිත හා අරමුදල්** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 9 | **15,062,870,601** | 13,128,044,971 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | **56,715,736** | 53,684,928 |
| සමුච්චිත අරමුදල | | **558,162,430** | 406,361,005 |
| **මුළු සංචිත සහ අරමුදල්** | | **15,677,748,767** | 13,588,090,903 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත බදු වගකීම | 20 | **5,257,727** | 7,869,408 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 10 | **41,361,877** | 38,091,504 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **46,619,604** | 45,960,912 |
| **ජංගම වගකීම්** | | | |
| අත්තිකාරම් ලැබීම් | | **41,563,379** | 38,124,533 |
| වෙනත් ජංගම වගකීම් | 11 | **139,020,918** | 69,268,167 |
| **මුළු ජංගම වගකීම්** | | **180,584,297** | 107,392,700 |
| **මුළු සංචිත සහ වගකීම්** | | **15,904,952,669** | 13,741,444,515 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයන් සතුය.

ඉහත මූල්‍ය ප්‍රකාශනය පිටු අංක 85 සිට 101 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමග සංයෝජිතව කියවිය යුතුය.

ආචාර්ය ඩබ්ලිව්. ඒ. ආර්. ද මැල්
සභාපති, ශ්‍රීලරනිකොස

එ. එන්. හපුගල
සභාපති, විගණන කමිටුව

දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්

සතීෂ් කුමාර
අධ්‍යක්ෂ - මූල්‍ය

කොළඹ, ශ්‍රී ලංකා
2026 ජූනි 18

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 2025.12.31 දිනට රු. | 2024.12.31 දිනට රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| **හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම** | | | |
| වාර්ෂික ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු | 12 | **673,914,978** | 380,805,679 |
| **හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම** | | | |
| පොළී ආදායම | 13 | **56,407,994** | 50,718,089 |
| වෙනත් ආදායම් | 14 | **739,088** | 529,425 |
| **මුළු ආදායම** | | **731,062,060** | 432,053,193 |
| **වියදම** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | **(237,530,213)** | (198,801,875) |
| වෘත්තීය ගාස්තු | 16 | **(105,991,916)** | (45,225,380) |
| මෙහෙයුම් ගාස්තු | 17 | **(114,412,738)** | (83,189,182) |
| මූල්‍ය සහ අනෙකුත් | 18 | **(2,214,447)** | (571,524) |
| **මුළු වියදම්** | | **(460,149,314)** | (327,787,961) |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය) | | **270,912,746** | 104,265,232 |
| බදුකරණය | 20 | **(82,442,833)** | (29,548,960) |
| බදුවලට පසු ශුද්ධ අතිරික්තය/ (ඌණතාවය) | | **188,469,913** | 74,716,272 |
| සමුච්චිත අරමුදලට මාරු කෙරෙන අතිරික්තය | | **188,469,913** | 64,458,535 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත ආයුගණන අලාභය / (ලාභය) | 10 | **(865,889)** | 10,257,737 |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | **189,335,802** | 54,200,798 |

පිටු අංක 85 සිට 101 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **2023 ජනවාරි 1 දිනට ශේෂය** | 32,439,194 | 282,996,422 | 315,435,615 |
| 2023 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | - | 152,510,932 | 152,510,932 |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 2,533,560 | - | 2,533,560 |
| පෙර වසරවල ආදායම් බද්ද | - | (35,430,918) | (35,430,918) |
| ආයුගණක අලාභ/ (ලාභ) | - | (1,618,717) | (1,618,717) |
| පසුගිය වසරවල වැඩි ප්‍රතිපාදන ආපසු හැරවීම | - | 3,670,125 | 3,670,125 |
| ඒකාබද්ධ අරමුදල වෙත වන දායකත්වය | - | (50,000,000) | (50,000,000) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **34,972,754** | **352,127,844** | **387,100,598** |
| | | | |
| 2024 ජනවාරි 1 දිනට ශේෂය | 34,972,754 | 352,127,844 | 387,100,598 |
| 2024 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | - | 54,200,798 | 54,200,798 |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 18,712,174 | - | 18,712,174 |
| ආදායම් බදු/ පොළිය මත පසුගිය වසරවල ගැළපුම් | - | 4,774,626 | 4,774,626 |
| ආයුගණක අලාභ/ (ලාභ) | - | 10,257,737 | 10,257,737 |
| ඒකාබද්ධ අරමුදල වෙත වන දායකත්වය | - | (15,000,000) | (15,000,000) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **53,684,928** | **406,361,005** | **460,045,933** |
| | | | |
| 2025 ජනවාරි 1 දිනට ශේෂය | 53,684,928 | 406,361,005 | 460,045,933 |
| 2025 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | - | 189,335,802 | 189,335,802 |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 3,030,808 | - | 3,030,808 |
| පෙර වර්ෂවල ආදායම් බදු ගැලපීම් / කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා සඳහා වූ අතිරික්ත ප්‍රතිපාදන. | - | 2,465,622 | 2,465,622 |
| ඒකාබද්ධ අරමුදල වෙත වන දායකත්වය | - | (40,000,000) | (40,000,000) |
| **2025 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **56,715,736** | **558,162,430** | **614,878,166** |

ප්‍රතිරක්ෂණ සංචිතය මගින් මෝටර් රථ, ගෘහ භාණ්ඩ සහ උපාංග, කාර්යාල උපකරණ සහ ඉලෙක්ට්‍රොනික දත්ත සැකසීම තක්සේරු කිරීම මත පැන නගින අතිරික්තය/ඌනතාවය නියෝජනය කරයි.

සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) මගින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙන් මාරු කෙරෙන අතිරික්ත/ (ඌණතාවය) පෙන්නුම් කෙරේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 2025.12.31 දිනට රු. | 2024.12.31 දිනට රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌණතාවය) | | **270,912,746** | 104,265,232 |
| ක්ෂය සඳහා වූ ප්‍රතිපාදන | 2 සහ 3 | **18,056,403** | 12,077,183 |
| ප්‍රත්‍යාගණනය කෙරෙහි වන බලපෑම | 2 | **-** | (14,587,920) |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | 10 | **7,847,412** | 6,474,568 |
| ආදායම් බද්ද | 20 | **(82,442,833)** | (29,548,960) |
| පසුගිය වසරවල ගැලපීම් | | **2,465,622** | 4,774,626 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම | 10 | **(3,711,150)** | (2,275,419) |
| ආයුගණක ලාභය/( අලාභය) | | **-** | 10,257,737 |
| පොළී ආදායම | 13 | **(56,407,050)** | (50,717,962) |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම | | **156,721,150** | 40,719,085 |
| | | | |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩි වීම)/ අඩු වීම | 6 | **219,159** | 23,742 |
| ලැබිය යුතු දෑවල (වැඩි වීම)/ අඩු වීම | 7 | **(11,465,985)** | (23,482,457) |
| අත්තිකාරම් ලැබීම්වල (වැඩි වීම)/ අඩු වීම | | **3,438,846** | 3,997,703 |
| ණය හිමියන් සහ උපචිතයන්හි (වැඩි වීම)/ අඩු වීම | 11 | **93,166,413** | 53,890,268 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහ | | **85,358,434** | 34,429,257 |
| ගෙවන ලද ආදායම් බදු | 20 | **(26,025,343)** | (50,651,070) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | **216,054,241** | 24,497,272 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහ** | | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | **(238,462,909)** | (153,019,320) |
| ස්ථාවර තැන්පතුවල අයෝජනය | | **-** | 114,000,000 |
| පොළී ආදායම | | **56,407,050** | 50,717,962 |
| දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම | 2 සහ 3 | **(4,990,540)** | (12,240,230) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(187,046,400)** | (541,589) |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ඒකාබද්ධ අරමුදල වෙත වන දායකත්වය | | **(40,000,000)** | (15,000,000) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | **(40,000,000)** | (15,000,000) |
| | | | |
| මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **(10,992,159)** | 8,955,684 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | **17,050,006** | 8,094,323 |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | **6,057,850** | 17,050,006 |
| | | | |
| **අතැති සහ බැංකුවේ ඇති මුදල්** | 8 සහ 21 | | |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය | | **6,018,536** | 15,989,161 |
| ලංකා බැංකුව 1877 | | **32,317** | 1,050,086 |
| ඉතුරුම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | **668** | 650 |
| මහජන බැංකු ඉතුරුම් ගිණුම | | **6,330** | 10,109 |
| | | **6,057,850** | 17,050,006 |

පිටු අංක 85 සිට 101 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය
## 2025 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2025.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය<br>රු. | 2024.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වැඩි වීම | **1,934,825,630** | 1,595,572,881 |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම | **1,934,825,630** | 1,595,572,881 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | |
| රජයේ සුරැකුම්පත්වලින් ලැබිය යුතු පොළියෙහි වැඩිවීම/ (අඩුවීම) | **(378,837,255)** | 695,499,968 |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩි වීම)/ අඩු වීම) | **(59,022,036)** | (64,879,357) |
| ගෙවිය යුතු දෑවල වැඩි වීම/(අඩු වීම) | **(25,674,783)** | 246,095,772 |
| ලැබිය යුතු දෑවල වැඩි වීම/( අඩු වීම) | **70,336,513** | 5,037,314 |
| | **(393,197,560)** | 881,753,697 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් වැඩි වීම/(අඩු වීම) | **1,541,628,070** | 2,477,326,578 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහ** | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | **326,124,140** | (8,908,701,039) |
| ස්ථාවර තැන්පතුවල අයෝජන | **(1,871,000,000)** | 6,426,662,649 |
| ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් වැඩි වීම/(අඩු වීම) | **(1,544,875,860)** | (2,482,038,391) |
| මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | **(3,247,790)** | (4,711,813) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | **4,727,143** | 9,438,956 |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | **1,479,353** | 4,727,143 |
| ජංගම ගිණුමේ ශේෂය | **(1,024,246)** | 1,000,000 |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය | **2,503,599** | 3,727,143 |
| | **1,479,353** | 4,727,143 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1.1 වාර්තා කිරීමේ ආයතනය

#### 1.1.1.1. නෛතික ආකෘතිය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදනය අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

කොමිසමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ 11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයෙහිය.

#### 1.1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

පනතට අනුව කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් රක්ෂණකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම,

(ආ) රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම,

(ඇ) රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් රජය වෙත උපදෙස් ලබා දීම,

(ඈ) රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(ඉ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම,

(ඊ) නිශ්චල හෝ චංචල දේපළ කිසිවක් අත්කර ගැනීම හා දැරීම, ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම,

(උ) කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුම්වලට ඇතුළත් වීම සහ,

(ඌ) මෙම පනත යටතේ යථා පරිදි කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම.

### 1.1.2 සකස් කිරීමේ පදනම

#### 1.1.2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, සම කොටස්හි/ශුද්ධ වත්කම්හි වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහයන් හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වන අතර ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර එම ප්‍රමිතීන්ට අනුකූල වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් 2026 ජූනි 18 වන දින නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

#### 1.1.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇති අතර පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකර අඛණ්ඩව අදාළ කර ඇත.

සටහන 1.3.1 හි පැහැදිලි කර ඇති පරිදි ආයුගණක තක්සේරුවක් මත පදනම්ව එහි වර්තමාන අගය අනුව අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම් මනිනු ලැබේ.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියෙන් දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

#### 1.1.2.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඇත. රක්ෂණ නියාමන කොමිෂන් සභාව චිරස්ථායී අනාගතයක් උදෙසා අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යන බවටත් එහි ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලන බවටත් කොමිෂන් සභාවේ සාමාජිකයින්හට සාධාරණ තක්සේරුවක් ඇත. අනාගත සියළුම තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඈවර කිරීමේ හෝ එහි මෙහෙයුම් නවතාලීමේ අවශ්‍යතාවක් හඳුනාගෙන නොමැත. ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙන ඇත.

#### 1.1.2.4 භාවිත සහ වාර්තා කරන මුදල්

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන කොමිසමේ භාවිත මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරේ. රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

#### 1.1.2.5 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ තත්වයෙන් ඉදිරිපත් කිරීම සහ වත්මන් වර්ෂය සමග සැසඳිය හැකි පරිදි පෙර වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

#### 1.1.2.6 ද්‍රව්‍යමය බව සහ එකතු කිරීම

සමාන අයිතමවල සෑම ද්‍රව්‍යමය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය

සමාන නොවන අයිතම ද්‍රව්‍යමය නොවන්නේ නම් හැර වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

### 1.1.2.7 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීම සහ වාර්තා කළ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කළ යුතුය. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය සහ බලපෑමට ලක්වන ඕනෑ ම අනාගත කාල පරිච්ඡේදයක දී ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදලට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමට අදාළ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් වේ.

**දුර්වලතා තක්සේරු කිරීම - වට්ටම් කළ මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපනවල දී භාවිතා වන ප්‍රධාන උපකල්පනයන්**

වත්කමකට හෝ වත්කම් කළඹකට හානි වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේද යන්න කොමිෂන් සභාව වාර්තා කරන සෑම දිනකම ඇගයීමට ලක් කරයි. වත්කමක අය කරගත හැකි ප්‍රමාණය එහි භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි වන අතර එහි සාධාරණ වටිනාකම විකිණීමේදී අඩු පිරිවැයක් වේ. භාවිතයේ දී පවතින වටිනාකම තක්සේරු කිරීමේදී ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ මුදල්වල කාල අගය සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන සුදුසු වට්ටම් අනුපාත භාවිතා කරමින්ය.

**ක්ෂය**

ක්ෂය වීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ශේෂ වටිනාකම තීරණය කිරීමේදී විනිශ්චය අවශ්‍ය වේ.

**විලම්භිත බදුකරණය**

අනාගත බදු සැලසුම් උපාය මාර්ග සමග අනාගත බදු අය කළ හැකි ලාභ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට කළමණාකරණ විනිශ්චය අවශ්‍ය වේ.

**අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්**

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්වල වගකීම තක්සේරු කිරීමට උපකල්පනවල සැලකිය යුතු කොටසක් අදාළ වේ. එයට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත ඇතුළත් වන අතර මෙම සැලසුම් දිගුකාලීන වන බැවින් එවැනි ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයට යටත් වේ.

**වත්මන් බදුකරණය**

කළමනාකාරීත්වය විශ්වාස කරන පරිදි තථ්‍ය බැඳීම් නිරූපණය කෙරෙන අදාළ බදු ප්‍රඥප්ති සහ රෙගුලාසි අදාළ කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල වත්මන් බදු වගකීම් ඉදිරිපත් කරනු ලැබේ. ගණුදෙණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ ආදායම් බලධාරීන් විසින් විවාදයට ලක් කරන අවස්ථා ද තිබිය හැකිය. මෙම ගැටළුවලට අදාළ ඕනෑම අමතර පිරිවැයක් කොමිෂන් සභාවේ වගකීමක් ලෙස තහවුරු කරන අවස්ථාවේ දී බදු වියදමක් ලෙස ගණන් ගනු ලැබේ.

### 1.1.2.8 වාර්තා කරන කාල සීමාවෙන් පසු හට ගන්නා සිදුවීම්

වාර්තා කරන කාල සීමාවෙන් පසුව හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

## 1.1.3 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශ මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකයන් පාදකව වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත. විදේශ මුදල්හි වත්කම් හා වගකීම් ශේෂ පත්‍රයේ පවතින විනිමය අනුපාත මත පරිවර්තනය කරනු ලැබේ. ඇති වන ලාභ හා අලාභ සම්බන්ධයෙන් ආදායම් හා වියදම් ගිණුම තුළ කටයුතු කරනු ලැබේ.

## 1.1.4 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් පෙර ලැබීම් හා වෙනත් ගෙවිය යුතු දෑවලින් සමන්විත වේ. කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් වලට ලැබිය යුතු දෑ සහ එහි කටයුතුවලින් සෘජුවම ලැබෙන මුදල් හා වෙනත් කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ.

### 1.1.4.1 වෙළඳපළ අවදානම

වෙළඳපළ අවදානම යනු වෙළඳපළ මිල වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයෙහි සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ මිල අවදානම් වර්ග දෙකකින් සමන්විත වේ. වෙළඳපළ අවදානම මගින් බලපෑමට ලක් වන මූල්‍ය උපකරණවලට මූල්‍ය ආයතනවල තැන්පතු ඇතුළත් වේ.

#### 1.1.4.1.1 පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහයෙහි උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනාවරණය මූලික වශයෙන් පාවෙන පොළී අනුපාතත් කොමිෂන් සභාවේ වගකීමට අදාළ වේ.

#### 1.1.4.1.2 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු කොමිෂන් සභාව විසින් අඛණ්ඩව මුදල් ප්‍රවාහ පුරෝකථනයන් හා මුදල් අයවැයකරණය භාවිත කරමින් එහි අරමුදල් හිඟයක් ඇති වීමේ අවදානම අධීක්ෂණය කිරීමයි.

## 1.2 වත්කම් හා අගය කිරීමේ පදනම

### 1.2.1 දේපළ, පිරියත හා උපකරණ

**ස්වසන්තක අයිතිය සහිත දේපළ පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්/ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැය සමග එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

හුවමාරු නොවන ගනුදෙනුවක දී වත්කමක් ශූන්‍ය හෝ නාමික සලකා බැලීමක් සඳහා අත්පත් කර ගන්නා විට වත්කම මුලින් මනිනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමෙනි.

අයිතමයට සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන යාමට හෝ ගලා ඒම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා පසුකාලීනව දරන ලද පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී. අනෙකුත් අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සඳහා වන වියදම් ඒවා දරණ ලද මූල්‍ය වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් අය කරනු ලැබේ.

වසර තුනකට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබන මෝටර් රථ සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කරගන්නා අතර ඉන් පසුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 යටතේ වන ප්‍රත්‍යාගණන ආකෘතියේ අවශ්‍යතාවලට අනුකූල වන බවට වග බලා ගනු ලැබේ.

කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

#### ක්ෂය

වත්කම් ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ. ප්‍රයෝජනවත් ආයු කාලය, ක්ෂය වීමේ ක්‍රම සහ අවශේෂ අගයන් වාර්ෂිකව හෝ එවැනි තක්සේරුවක් අවශ්‍ය වන බව පෙන්නුම් කරන අවස්ථාවට පෙර දිනයක දී තක්සේරු කරනු ලැබේ.

| වත්කම් | වාර්ෂික % |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම සහ සවි කිරීම | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම | 25 |
| පුහුණු උපකරණ | 25 |

මිල දී ගත් දින සිට බැහැර කරන දින දක්වා ක්ෂය කරනු ලැබේ. විකුණුම් මත ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ විකුණුම් ආදායම ගෙන යන මුදල සමග සංසන්දනය කිරීමෙනි.

### 1.2.2 අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීමේ පදනම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට ඇති සම්භාවිතාවක් පවතී නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණක් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලැබේ.

වෙන වෙනම අත්පත් කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම්, මුල් අවස්ථාවේ හඳුනාගැනීමේ දී පිරිවැය මත මැන බලනු ලැබේ. ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම්, පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ පවතී නම් සමුච්චිත හානි අලාභයන් අඩු කළ පසු ලැබෙන අගයෙන් දක්වනු ලැබේ.

#### ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම් භාවිතය සඳහා ලබාගත හැකි දින සිට ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරාවට සරල රේඛීය පදනමක් මත ක්‍රමක්ෂය කිරීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලැබේ. පරිගණක මෘදුකාංග සඳහා ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පහත පරිදි වේ:

පරිගණක මෘදුකාංග - වසර 4 කි

#### අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීම

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමකදී හෝ එහි භාවිතයෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු විය නොහැකි අවස්ථාවකදී එය ගිණුම්වලින් ඉවත් කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කමක් ගිණුම්වලින් ඉවත් කිරීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ, එම වත්කම බැහැර කිරීමෙන් ලැබුණු ශුද්ධ ප්‍රතිලාභය සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස මැන බලන අතර වත්කම ගිණුම්වලින් ඉවත් කරන අවස්ථාවේදී ම එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලැබේ.

### 1.2.3 ආයෝජන

බලපත්‍රලාභී රජයේ බැංකුවල ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන ආයෝජන, රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරනු ලබන අතර වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ

උපචිත පොලී ලෙස දක්වා ඇත. මෙම ආයෝජන වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ එකතු කළ පොළියෙන් දක්වා ඇත. එබැවින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය උපකරණවල අවදානමක් නොමැත.

### 1.2.4 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 1.2.5 ලැබිය යුතු දෑ

හානිය සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව ලැබිය යුතු දෑ අපේක්ෂිත යථාර්ථවාදී අගයට රැගෙන යනු ලැබේ. වාස්තවික සාක්ෂි සලකා බැලීම මගින් සියළුම ලැබිය යුතු දෑ නිශ්චිත හානි සඳහා තක්සේරු කරනු ලැබේ.

### 1.2.6 මූල්‍ය නොවන වත්කම් හානි වීම

සෑම මූල්‍ය කාල සීමාවක් අවසානයේ ම කොමිෂන් සභාව මූල්‍ය නොවන වත්කම් හානි විය හැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ වෙනස් වීම් තක්සේරු කරයි. එවැනි ඇඟවීමක් තිබේ නම්, කොමිෂන් සභාව අය කරගත හැකි ඇස්තමේන්තුගත වත්කම් ප්‍රමාණය ලබා දෙයි. වත්කමක ගෙන යා හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවන විට, වත්කම හානි වූවා සේ සලකනු ලබන අතර එහි අයකර ගත හැකි මුදලට ලියා දක්වනු ලැබේ.

### 1.2.7 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් සමාන දෑවලින් නියෝජනය වන්නේ සෑම විටම මුදල් ලෙස ලබා ගැනීමේ හැකියාව ඇති සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට යටත් වන බැංකුවේ මුදල් සහ අතැති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ මුල් කල් පිරීම මාස තුන හෝ ඊට අඩු වන ද්‍රවශීල ආයොජනයි.

## 1.3 බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනයට සියළු භෞතික බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන අතර පවතින බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයා ඇත. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළු ම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

1. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළ විටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

2. වාර්තා කරන දිනයෙන් වර්ෂයකට පසු ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

3. අවිනිශ්චිත වගකීමක් යනු කොමිෂන් සභාවේ පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීම මගින් හෝ පියවීමට සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි නිසා පිළිගත නොහැකි වර්තමාන වගකීමක් හේතුවෙන් පැන නැගිය හැකි වගකීමකි.

4. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට දැනට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තු කිරීමක් සිදු කළ හැකිය.

5. සංචිතවල ස්වභාවය සහ අරමුණ නිශ්චිත දේශීය අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තුල සංචිත නිර්මාණය කර පවත්වාගෙන යයි.

**(අ) සමුච්චිත සංචිත**

කොමිෂන් සභාවේ අතිරික්තය/හිඟය සමුච්චිත අරමුදලට මාරු කරනු ලැබේ.

**(ආ) ප්‍රත්‍යාගණන සංචිතය**

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ලැබෙන ලාභය/අලාභය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබේ.

### 1.3.1 විශ්‍රාම ප්‍රතිලාභ

#### 1.3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ සියළු සුදුසුකම් ලත් සේවකයන් සඳහා අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් සකස් කරගන්නා ලදී. විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම මගින් විශ්‍රාම ගැනීමේ දී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය අර්ථ දැක්වේ.

